# ශ්‍රී ලංකාවේ ජාතික ඇගයීම් ප්‍රතිපත්තිය ක්‍රියාත්මකකිරීමේ රාමුව

# 2023

# ශ්‍රී ලංකාවේ ජාතික ඇගයීම් ප්‍රතිපත්තිය ක්‍රියාත්මකකිරීමේ රාමුව

## 2023

ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව
මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය



## ඇගයීම තුළින් ඵලදායී පාලන තන්ත්‍රයක්

ජාතික ඇගයීම් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරමින් එය අර්ථවත් සහ ප්‍රත්‍යක්ෂ ප්‍රතිඵල බවට පරිවර්තනය කිරීමට මුලපිරීම අතිශයින්ම කාලෝචිත පියවරක් ලෙස සැලකිය හැකිය. ශ්‍රී ලංකාව තුල ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති සහ වැඩසටහන් තුලින් ලත් අතීත අත්දැකීම් වලින් පාඩම් උකහා ගැනීමට සමත් ශක්තිමත් යාන්ත්‍රණයක් සඳහා වන දැඩි අවශ්‍යතාවය මෙම ප්‍රයත්නය මගින් ආමන්ත්‍රණය කෙරේ. තවද, පොදු සම්පත් භාවිතයේදී පවත්වා ගතයුතු විනිවිදභාවය පිළිබඳ වූ පුළුල් මහජන ඉල්ලීම සඳහාද මෙමගින් ප්‍රතිචාර දක්වයි. සංවර්ධන න්‍යාය පත්‍රයෙහි දැක්ම සහ යථාර්ථය අතර පවතින විශාල පරතරය ශ්‍රී ලංකාව විසින් දීර්ඝකාලීනව අත්විඳිමින් පවතී. ශ්‍රී ලංකාව මුහුණ දී ඇති පෙර නොවූවිරූ මෙම ගැඹුරු අර්බුදය විසින් අපගේ අසාර්ථක වූ අතීත ප්‍රයත්නයන් නැවත තක්සේරු කිරීමට අවකාශ සලසා ඇති අතර, රාජ්‍ය සේවාවන් සහ සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ නව්‍ය ප්‍රවේශයක් සඳහාද මෙමගින් අවස්ථාව නිර්මාණය කරයි. වඩා හොඳින් සැලසුම් කළ අනාගතයක් සඳහාවූ මෙම ප්‍රගමණයේදී, අප විසින් අනුගමනය කරන ලද වැරදි භාවිතයන් හඳුනාගැනීමට සහ ඒවා නිවැරදි කිරීමට අප බිය නොවිය යුතුය. එය නව ඇගයුම් සංස්කෘතිය වෙත ප්‍රවේශ වීම සඳහා වූ අපගේ අපේක්ෂාව සාක්ෂාත් කරගැනීමට දායක වන ජීවගුණය වේ. අප විසින් මූලාරම්භය ලබාදෙන ලද කාර්යයන්හි සත්‍ය බලපෑම් මැනීමට මෙන්ම ඒවායේ ප්‍රතිපල සඳහා පාදකවූ ධනාත්මක හෝ සෘණාත්මක හේතු අවබෝධ කර ගැනීමට මෙන්ම එම වැරදි නිවැරදි කිරීමට අවශ්‍ය පිළියම් යෙදීමටද අප සූදානම්ව සිටිය යුතුය.

යහපාලනය සඳහා මෙන්ම සාක්ෂි මත පදනම්ව තීරණගැනීමේ සහ මුදලේ නිසි වටිනාකම තහවුරුකිරීමේ පදනමක් ලෙස 2018 වර්ෂයේදී ජාතික ඇගැයීම් ප්‍රතිපත්තිය සකස්කිරීම හා අනුමතකිරීම සඳහා වූ මූලාරම්භය මවිසින් ගන්නා ලදී. ඉන් පස් වසරකට පසුව, රාජ්‍ය වියදම් ආශ්‍රිත විනිවිදභාවය සහ වගවීම ඉහළ නංවාලමින් එම ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට පවතින මෙම සූදානම මා හට ඉමහත් ප්‍රීතියට කරුණකි. මෙම ඇගයීම් ප්‍රතිපත්ති රාමුව පුළුල් ලෙස ක්‍රියාවටනැංවීම තුළින්, රාජ්‍ය සේවාව සෑම අතකින්ම අඛණ්ඩව වැඩිදියුණු වනබව තහවුරුකිරීමට සමත් සංස්කෘතියක් ඇතිකිරීම අපගේ අපේක්ෂාවයි.

ජාතික ඇගයීම් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ රාමුව හඳුන්වා දී, දිවයින පුරා එය ක්‍රියාවට නැංවීමටද අපේක්ෂා කරමි. මෙය ශ්‍රී ලාංකික ජනතාව වෙත නිසැකවම ප්‍රතිලාභ ලඟාකර දෙන සාක්ෂි මත පදනම් වූ, ඵලදායී, ධනාත්මක බලපෑම් සහිත සංවර්ධනය කරා අප යන ගමනේ අතිශය වැදගත් පියවරකි.

**රනිල් වික්‍රමසිංහ**
**ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ අතිගරු ජනාධිපති**
**සහ මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය**



# ඇගයීම් රාමු භාවිතාකිරීම තුළින් ධනාත්මක ආර්ථික වර්ධනයක් කරා

ව්‍යාපෘති සහ ප්‍රතිපත්ති ක්‍රියාත්මකකිරීම සම්බන්ධයෙන් ඓතිහාසික වශයෙන් ශ්‍රී ලංකාවේ අත්දැකීම් ඉතා දුර්වල මට්ටමක පවතී. මෙම තත්වය බොහෝ විට අපේක්ෂිත ප්‍රතිඵල ජනනය සඳහා ඉලක්කගත නොවීම සහ ප්‍රමාදවීම් යන මූලික ලක්ෂණ සහිත මහා පරිමාණ සංවර්ධන ව්‍යාපෘති සම්බන්ධයෙන් සම්පූර්ණයෙන්ම සත්‍ය වේ. වර්තමානයේ ශ්‍රී ලංකාව, නිදහසින් පසු ඉතිහාසයේ ඇතිවූ ගැඹුරුම ආර්ථික අර්බුදයට මුහුණදෙමින් සිටී. විශේෂයෙන්ම, ස්වෛරීත්ව ණය අර්බුදයේ බලපෑම් හේතුවෙන් රාජ්‍ය මූල්‍ය සීමාවන් පවත්වා ගැනීම අභියෝගයට ලක්ව ඇත. මෙම සන්දර්භය තුළ, නාස්තිය අවම කරමින් සීමිත මූල්‍ය සම්පත් ඵලදායී ලෙස යෙදවීම අන් කවරදාටත් වඩා වැදගත් වේ. ප්‍රමාදවීම්, අධි වියදම් සහ ඌණ ප්‍රශස්ථ ප්‍රතිඵල තවදුරටත් දරාගැනීමේ හැකියාවක් ශ්‍රී ලකාවට නොමැත.

සංවර්ධන ව්‍යාපෘති සහ ප්‍රාග්ධන වියදම් වල කාර්යක්ෂමතාව හා ඵලදායිතාවය වැඩිදියුණුකිරීම උදෙසා, අතීත අත්දැකීම් වලින් උගත් පාඩම් උකහා ගැනීමට ශක්තිමත් ඇගයීම් ක්‍රමවේදයක් තිබීම ඉතා වැදගත් වේ. අතීත ව්‍යාපෘති සහ වැඩසටහන්වල ධනාත්මක මෙන්ම ඍණාත්මක ප්‍රතිඵල වලින් උගනිමින්, අතීතයේ සිදුවූ දෝෂද මඟහරවා ගනිමින් අනාගත ව්‍යාපෘති විධිමත්ව ගොඩනැගීම උදෙසා, සාක්ෂි මත පදනම් වූ විශ්ලේෂණයන් තීරණාත්මක අංගයක් වනු ඇත. මනා සැලසුමකට අනුව ක්‍රියාත්මක කරන ලද ඇගයීම් වැඩසටහන් මඟින් සංවර්ධන මැදිහත්වීම්වල සැලසුම්කරණය, අයවැයකරණය, අධීක්ෂණය සහ කළමනාකරණය වැඩි දියුණුකිරීම සඳහා වැඩදායක යෙදවුම් සැපයේ. සංවර්ධන හවුල්කරුවන් විසින් අරමුදල් සපයන බොහෝ ව්‍යාපෘති සහ වැඩසටහන් සඳහා ඔවුන්ගේම ඇගයුම් රාමු සකස්කර ඇතත්, එම ඇගයීම් ප්‍රතිඵල දේශීය පාර්ශවකරුවන් විසින් පූර්ණ වශයෙන් භාවිතයට ගැනීම සෑමවිටම සිදුනොවේ. එබැවින්, ශ්‍රී ලංකාවේ ජාතික ඇගයීම් ප්‍රතිපත්තිය (NEP) පූර්ණවම ක්‍රියාත්මක කිරීමට මෙය ඉතාමත් සුදුසු කාලයකි.

මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය ඵලදායි ඇගයීම් රාමුවක වැදගත්කම හඳුනාගෙන ඇති අතර, රටෙහි සංවර්ධනය සහ තිරසාර පැවැත්මක් සඳහා යෝග්‍ය පරිසරයක් නිර්මාණය කිරීමට හැකි වන පරිදි ඇගයීම් රාමුව රාජ්‍ය අංශය තුළ ප්‍රචලිත කිරීමට මෙම අමාත්‍යාංශය කැපවී සිටී.

ජාතික ඇගයීම් ප්‍රතිපත්ති සකස් කිරීම සම්බන්ධයෙන් මෙහෙයුම් කමිටුවේ සාමාජිකයින්ටත් ජාතික ඇගයීම් ප්‍රතිපත්තිය ක්‍රියාත්මකකිරීමේ රාමුව (NEPIF) කෙටුම්පත් කිරීම පිළිබඳව ව්‍යාපෘති කළමනාකරණ සහ අධීක්ෂණ දෙපාර්තමේන්තුව සහ එයට සම්බන්ධවූ සියල්ලන්ටමත් මම ස්තූතිවන්ත වන අතර, මෙම තීරණාත්මක කාර්යය උදෙසා සියලුම පාර්ශවකරුවන්ගේ අඛණ්ඩ සහයෝගීතාවය සහ සහයෝගය මම ඉදිරියටත් බලාපොරොත්තු වෙමි.

**කේ.එම්. මහින්ද සිරිවර්ධන**
**ලේකම්**
**මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශ**

# පූර්විකාව

ආයෝජනයන්හි ප්‍රතිලාභ සඳහා වූ පුරවැසි අයිතිවාසිකම් තහවුරු කලහැකි වන්නේ සීමිත වූ සම්පත් ප්‍රශස්තව උපයෝගීකර ගැනීමට යොමුවූ ප්‍රගතිශීලී මූලාරම්භයන් තුලිනි. රාජ්‍ය ආයෝජනයන්හි දැක්ම සහ යථාර්ථය අතර විද්‍යමාන වන අතිවිශාල පරතරය ක්‍රමාණුකූලව අඩුකරගැනීම සඳහා එවැනි මූලාරම්භයන් සඳහා හිතකර වටපිටාවක් සැකසීමට දායකවන සාධක අතර ඇගයීමට ප්‍රධාන තැනක් හිමි වේ. රාජ්‍ය ආයෝජනවල සැබෑ බලපෑම ප්‍රත්‍යක්ෂ වශයෙන්ම අවබෝධ වන්නේ ඒවායේ සත්‍ය ප්‍රතිඵල නිසි ඇගයීමකට බඳුන් කළවිටය. ඒවායේ කාර්යක්ෂමතාව සහ ඵලදායීතාවය තක්සේරු කිරීමටත් දැනුවත්ව තීරණ ගැනීමටත් යොදා ගත හැකි තීරණාත්මක යහපාලන මෙවලමක් ලෙස ඇගයීම් සංකල්පය භාවිතා කිරීමේ වැදගත්කම වර්තමානයේදී අන් කවරදාටත් වඩා සංවාදයට බඳුන් ව ඇත. ඒ අනුව, තෝරාගත් සංවර්ධන මූලාරම්භයන් සඳහා මධ්‍ය කාලීන සහ පසු ඇගයීම් සිදු කිරීම හරහා ඇගයීම යම් දුරකට ආයතනගත කිරීමට කිහිප වතාවක් ප්‍රයත්න දරා ඇත. කෙසේ වෙතත්, රටතුල මේ දක්වා සිදුකළ ඇගයීම් බොහොමයක් සංවර්ධන පාර්ශවකරුවන් විසින් මෙහෙයවන ලද සහ ව්‍යාපෘති-මූලික වූ බැවින්, ඒවායින් අනාවරණය වූ කරුණු හා උගත් පාඩම් සැලසුම් ක්‍රියාවලියට ඒකාබද්ධ කිරීමට හෝ අදාළ පාර්ශවකරුවන් දැනුවත් කිරීමට උපයෝගී කරගත් බවක් නිරීක්ෂණය නොවේ. මේ හැර, ඇගයීම් ක්‍රියාවලිය දෝෂ සෙවීමේ ව්‍යායාමයක් ලෙස වටහාගැනීම සහ ඒ සඳහා ඌන ඉල්ලුමක් පැවතීමද හේතුවෙන් රට තුළ විශේෂයෙන්ම රාජ්‍ය අංශය තුළ ඇගයීම ප්‍රචලිත නොවීය.

ඇගයීම ආයතනගත කිරීමේ මූලික පදනමක් ලෙස ජාතික ඇගයීම් ප්‍රතිපත්තිය 2018 වසරේ සිට රටේ සංවර්ධන න්‍යාය පත්‍රයට ඇතුළත්කර ඇති අතර, එම ප්‍රතිපත්තිය ප්‍රායෝගිකව ක්‍රියාවට නැංවීමේ අවශ්‍යතාවය සලකා බලා අමාත්‍ය මණ්ඩලයේ තීරණයක් අනුව මෙම ජාතික ඇගයීම් ප්‍රතිපත්ති රාමුව සකස්කරන ලදී. එය ජාතික, පළාත් හා ප්‍රාදේශිය මට්ටම්වල සේවයේ නියුතු රාජ්‍ය නිළධාරීන්, සංවර්ධන පාර්ශවකරුවන්, විද්වතුන්, රාජ්‍ය නොවන සංවිධාන මෙන්ම ජාතික විගණන කාර්යාල නිළධාරීන්ගේද සහභාගීත්වය ඇතිව දරන ලද සාමූහික ප්‍රයත්නයක ප්‍රතිඵලයකි. එබැවින්, ජාතික ඇගයීම් ප්‍රතිපත්තිය ක්‍රියාත්මකකිරීමේ රාමුව දේශීය දැනුම හා අත්දැකීම් කැටිකොට සකස්කරන ලද රජයේ පූර්ණ හිමිකාරීත්වය සහිත ප්‍රකාශනයක් වන අතර, එමගින් රට තුළ ඇගැයීම් සංස්කෘතියක් ඇතිකිරීම සඳහා රාජ්‍ය අංශය පුරා හිතකර පරිසරයක් නිර්මාණයකිරීමේ තිරසාර මෙන්ම දිගුකාලීන වැඩසටහනක මූලාරම්භය සනිටුහන් කරයි. මෙමගින්, ස්වයං විවේචනය හා සාක්ෂි මත පදනම්ව තීරණගැනීම සඳහා පුළුල් අවකාශයක් සලසන බැවින්, ඵලදායී හා කාර්යක්ෂම රාජ්‍ය සේවයක් සඳහා අවැසි පරිවර්තනයටද මෙය අතිවිශාල දායකත්වයක් දරනු ඇත.

මෙම රාමුව මගින් ජාතික ඇගයීම් ප්‍රතිපත්තිය හා එය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය උපදෙස් හා ක්‍රියාපටිපාටි එනම්, මාර්ගෝපදේශ, ආයතනික සැකැස්ම, ප්‍රමිති සහ උපායමාර්ග ආවරණය කෙරෙන බැවින් එමගින් සංවිධානාත්මකව හා ක්‍රමානුකූලව ඇගයීම් ක්‍රියාවලිය දියත්කිරීම සඳහා ශක්තිමත් පසුබිමක් නිර්මාණය කරනු ලබයි. මෙම ප්‍රයත්නය තුළින් අපේක්ෂා කෙරෙනුයේ යහපාලනය, පාරදෘශ්‍යභාවය සහ වගවීම ශක්තිමත් කිරීම සඳහා රජයේ සෑම ස්ථරයකම ඇගයීම ආයතනගත කිරීම මෙන්ම, සංවර්ධන ප්‍රතිඵල කාලීනව ලබාදීමට පහසුකම් සලසන මෙවලමක් ලෙස ඇගයීම යොදා ගැනීමට රාජ්‍ය නිලධාරීන් අභිප්‍රේරණය කෙරෙන වාතාවරණයක් නිර්මාණය කර ජාතික ඇගයුම් සංස්කෘතියක් ස්ථාපිත කිරීම වේ. තවද, ඵලදායි ඇගයීම් සිදුකිරීම සඳහා අවශ්‍ය පරිචය රාජ්‍ය අංශය මෙන්ම රටෙහි සංවර්ධනයට දායකවන සියළු පාර්ශවයන් තුල ගොඩනැගීම සඳහා මෙන්ම සහයෝගීතාව, විනිවිදභාවය සහ සියළු පාර්ශවයන් ඇතුළත් වූ ක්‍රියාවලියක් වෙත යොමු වීම සඳහා අවශ්‍ය මාර්ගෝපදේශයක් ලෙස මෙම රාමුව යොදා ගැනීමට හැකි වේ.

ඇගයීම රාජ්‍ය අංශයේ නව භාවිතයක් වන බැවින් වඩාත්ම අභියෝගාත්මක ව්‍යායාමය වන්නේ ක්‍රියාත්මකකිරීමේ රාමුව ප්‍රායෝගිකව ක්‍රියාවට නැංවීමයි. මෙම ක්‍රියාත්මකකිරීමේ රාමුව දියත් කිරීමෙන් පසුව, වෘත්තීයමය ඇගයීම් සිදු කිරීම සඳහා හඳුන්වා දී ඇති මෙවලම්, මාර්ගෝපදේශ, ආචාර ධර්ම සහ ප්‍රමිතීන් භාවිතා කළ යුතු ආකාරය පිළිබඳ මනා පුහුණුවක් හරහා ඇගයීම්, ආයතනගත කිරීම ආරම්භ කෙරේ. මේ අනුව, ජාතික මට්ටමේ සිට පළාත්, දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය මට්ටම් දක්වා රාජ්‍ය අංශයේ ඇගයීම්, පුහුණු නිලධාරීන් වෘත්තිකයන් ලෙස යොදාගනිමින් ස්වාධීනව සිදු කිරීමට සූදානම් කිරීම සඳහා 2023-2024 කාලය තුළ ව්‍යාපෘති කළමනාකරණ සහ අධීක්ෂණ දෙපාර්තමේන්තුව (PMMD) විසින් පුළුල් පුහුණු සහ දැනුවත් කිරීමේ වැඩසටහන් සැලසුම් කර ඇත.

මෙම ක්‍රියාවලියෙහි තිරසාරභාවය රඳා පවතින්නේ පාර්ශවකරුවන් අතර ඇගයීම් අනාවරණයන් හා උගත් පාඩම් අන්‍යෝන්‍ය වශයෙන් බෙදාගැනීම සහ ක්‍රමසම්පාදන සහ අයවැය ක්‍රියාවලියේදී එම අනාවරණයන් කොතෙක් දුරට ව්‍යවහාර වන්නේද යන්න මත බැවින්, ඇගයීම් තොරතුරු ප්‍රශස්ත මට්ටමින් භාවිතයට ගැනීම තහවුරු කිරීම සඳහා ද අවශ්‍ය සුදුස පියවර ගැනීමට නියමිතය. ශ්‍රී ලංකාව තුළ ඇගයීම් සංස්කෘතිය ගොඩනැගීම සහ ශක්තිමත් කිරීම සඳහා සියලුම පාර්ශ්වකරුවන්ගේ සහයෝගීතාව ව්‍යාපෘති කළමනාකරණ සහ අධීක්ෂණ දෙපාර්තමේන්තුව කෘතඥ පූර්වකව අපේක්ෂා කරයි.


**අයන්ති ද සිල්වා**
**අධ්‍යක්ෂ ජනරාල්**
**ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව**

2023 සැප්තැම්බර් මස 08

# අන්තර්ගතය

**හැඳින්වීම** 01

**පරිච්ඡේද අංක 1:**
විස්තරාත්මක ජාතික ඇගයීම් ප්‍රතිපත්තිය 02

**පරිච්ඡේද අංක 2:**
ජාතික ඇගයීම් ප්‍රතිපත්තිය ක්‍රියාත්මකකිරීම සඳහා වූ ආයතනික රාමුව 10

**පරිච්ඡේද අංක 3:**
වාර්ෂික ඇගයීම් න්‍යාය පත්‍රය 14

**පරිච්ඡේද අංක 4:**
ඇගයීම් ක්‍රියාත්මකකිරීම සඳහා මාර්ගෝපදේශ 19

**පරිච්ඡේද අංක 5:**
ඇගයීම් සඳහා වූ ප්‍රමිති 27

**පරිච්ඡේද අංක 6:**
ජාතික ඇගයීම් ප්‍රතිපත්තිය ක්‍රියාත්මකකිරීම සඳහා උපායමාර්ගික ප්‍රවේශය 31

**ඇමුණුම්** 34

# හැඳින්වීම

# හැඳින්වීම

පුරවැසියන්ගේ සුබසිද්ධිය වෙනුවෙන් තිරසාර ප්‍රතිලාභ ජනනයකිරීමට සමත් වූ මහා පරිමාණ හා බහුකාර්ය යටිතල පහසුකම් සංවර්ධන සහ නවෝත්පාදන ව්‍යාපෘති මෙන්ම අද්විතීය සමාජ සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මකකිරීම පිළිබඳ සාක්ෂි රැසක් මෑත කාලීන ශ්‍රී ලාංකීය සංවර්ධන ඉතිහාසය තුළින් සපයාගත හැකිය. දේශීය අනන්‍යතාවයක් සහිතවූ ලාංකීය සංවර්ධන ක්‍රියාදාමයේ ආරම්භක අවධිවල අත්පත් කරගත් ජයග්‍රහණයන් තිරසාර බවින් යුතු වුවද, පසුකාලීනව පරිශීලනයකිරීම සඳහා මෙන්ම අනාගත සංවර්ධන ප්‍රවේශයන් නිර්මාණාත්මකව සැලසුම්කිරීම සඳහා සංවර්ධනයේ කැපීපෙනෙන කඩඉම් ලෙස හඳුනාගතහැකි ව්‍යාපෘති හා වැඩසටහන් කිහිපයකවත් සාර්ථකත්වයට මෙන්ම දුර්වල කාර්යසාධනයට බලපෑ තහවුරු කරන ලද සාධක සොයාගැනීම දුෂ්කරය. තිරසාර හා ධනාත්මක ප්‍රතිඵල ජනනයකිරීමට ඉවහල් වූ දියුණු භාවිතයන් මෙන්ම අනපේක්ෂිත ඍණාත්මක ඵලවිපාක ඇතිකිරීමට හේතුවූ අතපසුවීම් හා දුර්වලතා පිළිබඳ විශ්වාසනීය සාක්ෂි දුර්ලභවීම විශවාසනීයත්වයකින් යුතුව මහා පරිමාණ සංවර්ධන ව්‍යාපෘති සැලසුම්කරණයට බාධාවක්ව ඇතිබව නිරීක්ෂණයකර ඇත.

ඉහත සඳහන් කරන ලද තත්වය තුළ, ප්‍රතිපත්ති සම්පාදකයින්, සංවර්ධන ක්‍රියාවලියේ ක්‍රියාකාරී පාර්ශවයන් මෙන්ම සංවර්ධනයේ මූල්‍යමය පාර්ශවකරුවන්  කෙරෙන් මතුවී වැඩි වර්ධනය වූ ඉල්ලුමට දක්වන ලද ප්‍රතිචාරයක් වශයෙන් 2018 ජූනි මස දී අමාත්‍ය මණ්ඩලය විසින් ශ්‍රී ලංකාවේ ජාතික ඇගයීම් ප්‍රතිපත්තියට අනුමැතිය ලබාදුන් අතර එම ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය උපායමාර්ගික රාමුවක් සකස් කිරීම සඳහාද එහිදී අමාත්‍ය මණ්ඩලය විසින් නියෝග කරන ලදී. අමාත්‍ය මණ්ඩලයේ නියෝග අනුව යමින්, ප්‍රතිපත්ති සම්පාදකයින්, රාජ්‍ය අංශය නියෝජනය කරමින් සංවර්ධන ක්‍රියාවලිය තුළ සක්‍රීය ලෙස ක්‍රියාකාරී වන පාර්ශව, ශාස්ත්‍රඥයින්, ඇගයීම් කටයුතුවල සක්‍රීයව නිරත වන පාර්ශව සහ සංවර්ධන ක්‍රියාදාමයේ මූල්‍යමය හවුල්කරුවන් වන ණයදෙන ආයතන සමඟ පවත්වන ලද පුළුල් සාකච්ඡා රැසක් තුළින් ලබාගත් අදහස් උපයෝගී කරගනිමින් ජාතික ඇගයීම් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ රාමුව සකස්කරන ලදී. ජාතික ඇගයීම් ප්‍රතිපත්තිය ක්‍රියාත්මකකිරීමේ රාමුවෙහි පරමාර්ථය වන්නේ ශ්‍රී ලංකාව තුළ ඵලදායී ඇගයීම් ක්‍රමවේදයක් ස්ථාපනය කිරීමයි.

ජාතික ඇගයීම් ප්‍රතිපත්තිය ක්‍රියාත්මකකිරීමේ රාමුව සකස් කිරීම සඳහා අදහස් හා යොජනා ලබාගැනීමේ ක්‍රියාවලියේ දී ඉස්මතු වූ කරුණක් වන්නේ, විවිධ හේතූන් මත ඇගයීම් විෂය ආශ්‍රිත දැනුම, පළපුරුද්ද, සම්පත්, ආයතන හා ක්‍රමවේදයන්  ප්‍රමාණවත් අයුරින් තක්සේරු නොකිරීමත් ඒවා ඇගයීම් විෂයෙහි අරමුණු ලඟාකරගැනීම සඳහා දිශානුගත නොකිරීමත් නිසා මෙරට තුළ ඵලදායී ඇගයීම් ක්‍රමවේදයක් ස්ථාපනයකිරීම අභියොගාත්මක ව්‍යායාමයක් වියහැකි බවයි. එබැවින්, ජාතික ඇගයීම් ප්‍රතිපත්තිය ක්‍රියාත්මකකිරීමේ රාමුව කෙටුම්පත් කිරීමේ අභිප්‍රාය වූයේ විසිරී පවතින දැනුම, සම්පත්, විශේෂඥතා හා ආයතන ජාතික ඇගයීම් ප්‍රතිපත්තියෙන් අපේක්ෂිත අරමුණු සාක්ෂාත් කිරීම උදෙසා මනා සම්බන්ධීකරණයකින් යුතුව යොමුකිරීමයි.

ජාතික ඇගයීම් ප්‍රතිපත්තියෙහි අරමුණ වනුයේ, ප්‍රතිපත්ති සම්පාදනය, සැලසුම්කරණය, අයවැය ප්‍රතිපාදන සැලසීම, අධීක්ෂණය හා වගවීමෙන් යුතු ක්‍රියාත්මක කිරීම වඩාත් දියුණු අන්දමින් ඉටුකිරීම හරහා ජාතික සංවර්ධන ඉලක්ක ලඟා කරගැනීමට හිතකර පරිසරයක් නිර්මාණය කිරීමයි. එහෙයින්, රජයෙහි සංවර්ධන න්‍යායපත්‍රය තුළ අන්තර්ගත වියයුතු ප්‍රධාන අංගයක් ලෙස ඇගයීම හඳුනාගනු ලබන්නේ මෙම අත්‍යන්ත අරමුණ සාක්ෂාත් කරගැනීම සඳහා ය.

ජාතික ඇගයීම්  ප්‍රතිපත්තියෙහි අරමුණු මුදුන්පත් කර ගැනීම මගින් තිරසාර සංවර්ධනය තහවුරු කර  ගැනීමට හිතකර පරිසරයක් ඇතිකිරීම උදෙසා, ප්‍රතිපත්තිය ක්‍රියාත්මකකිරීමේ දී ක්‍රමානුකූල කාර්යසාධනයක් සාක්ෂාත් කරගතයුතු ක්ෂේත්‍ර කවරේද යන්න පහත i සිට  v දක්වා ඇති එම ප්‍රතිපත්තියෙහි පරමාර්ථ මගින් ඉතා පැහැදිලිව පිළිබිඹු වේ.

i. සාක්ෂි මත පදනම් වූ තීරණගැනීම සහ සැළසුම්කරණය වැඩිදියුණුකිරීම;

ii. සම්පත්වල උපයෝගීතාවයෙහි අදාළත්වය, කාර්යක්ෂමතාවය හා ඵළදායීත්වයත්, සංවර්ධන ප්‍රතිඵලවල තිරසාරත්වයත් සහතික කිරීම;

iii. සංවර්ධන ප්‍රතිඵල ජනනයකරන සියළුම මට්ටම්වලදී විනිවිදභාවය හා වගවීම සහතිකකිරීම;

vi. ප්‍රතිපත්ති, වැඩසටහන් හා ව්‍යාපෘතිවල ඍණාත්මක බලපෑම් මෙන්ම අසාර්ථකත්වයන් අවම කරමින් ගුණාත්මක බවින් උසස් භාවිතයන් හා උගත් පාඩම් ප්‍රවර්ධනයකිරීම සහ;

v. රට තුළ ඇගයීම් සංස්කෘතියක් නිර්මාණයකිරීම.

ජාතික ඇගයීම්  ප්‍රතිපත්තිය ක්‍රියාත්මකකිරීම සඳහා පහත සඳහන් ප්‍රධාන සංඝටකයන්ගෙන් සමන්විත උපකාරී පරිසරයක් පැවතිය යුතුය:

i. දක්ෂ මානව සම්පතක් සහිත ඉතා පැහැදිළි ආයතනික සැකැස්ම;

ii. ඇගයීම සඳහා ක්‍රමසම්පාදකයින්, ප්‍රතිපත්ති සම්පාදකයින් හා තීරණ ගන්නා අයගේ ඉල්ලුම;

iii. ක්‍රමාණුකූලව නිශ්චිත සැලැස්මකට අනුව ඇගයීම් සිදුකිරීම සඳහා අනුමැතිය සහිත වාර්ෂික ක්‍රියාකාරී වැඩසටහන්;

iv. ඇගයීම සඳහා විෂයයන් ප්‍රමුඛතා අනුව තේරීම, ඇගයීම, නිරීක්ෂණ හා නිර්දේශ බෙදාහැරීම, නිර්දේශ අනුව ක්‍රියාමාර්ග ගන්නා ආකාරය අධීක්ෂණය සහ ඇගයීම්වලට අදාළ කළමනාකරණ ප්‍රතිචාර සඳහා කටයුතු කිරීම සඳහා මාර්ගෝපදේශ;

v. ඇගයීම් සඳහා ප්‍රමිතීන් සහ;

vi. සැලසුම්කරණයේදී හා තීරණගැනීමේදී ඇගයීම්වල නිරීක්ෂණ උපයෝගී කරගැනීම.

ශ්‍රී ලංකාවේ ජාතික ඇගයීම් ප්‍රතිපත්තිය ක්‍රියාත්මකකිරීමේ රාමුව තුළ පහත සඳහන් ක්ෂේත්‍ර අන්තර්ගතය.

i. ජාතික ඇගයීම්  ප්‍රතිපත්තිය ක්‍රියාත්මකකිරීම සඳහා වූ ආයතනික රාමුව

ii. වාර්ෂික ඇගයීම් න්‍යායපත්‍රය

iii. ඇගයීම් ක්‍රියාත්මකකිරීම සඳහා මාර්ගෝපදේශ

iv. ඇගයීම් සඳහා වූ ප්‍රමිති

v. ජාතික ඇගයීම්  ප්‍රතිපත්තිය ක්‍රියාත්මකකිරීම සඳහා උපායමාර්ගික ප්‍රවේශය

## පරිච්ඡේද අංක - 1

# විස්තරාත්මක ජාතික ඇගයීම් ප්‍රතිපත්තිය

# විස්තරාත්මක ජාතික ඇගයීම් ප්‍රතිපත්තිය

## 1. හැඳින්වීම

සංවර්ධන කළමනාකරණ චක්‍රයේ අත්‍යාවශ්‍ය අංගයක් වන ඇගයීම මගින් සැලසුම් කළ සමාජ ආර්ථික අරමුණු නිශ්චිත කාලසීමාව තුළ කාර්යක්ෂමව ඉටුකරගත හැකිය. ශ්‍රී ලංකා රජය විසින් ඇගයීම රාජ්‍ය පරිපාලනය තුළ හඳුන්වා දී ඇතත් එහි ක්‍රියාත්මකභාවය සීමිත හා සමතුලිත තත්ත්වයක පවතී. එබැවින් වඩාත් ක්‍රමවත් හා ආයතනගත ප්‍රවේශයක අවශ්‍යතාවය පවතී.

ගෝලීය ආර්ථිකය හා ඒකාබද්ධ වෙමින් ශ්‍රී ලංකාව මධ්‍ය ආදායම් තත්ත්වයක් කරා ළඟා වීමට ඉලක්ක කර ඇති අතර, ඊට සමගාමීව ශ්‍රී ලාංකීය අභිලාෂයන්ද ඉහළ නැංවෙමින් පවතී. මෙම පසුබිම තුළ ගුණාත්මක බවින් ඉහළ යටිතල පහසුකම් හා පොදු සේවාවන්හි අවශ්‍යතාව සීඝ්‍ර ලෙස වර්ධනය වී ඇත. එසේම, ශ්‍රී ලංකාව සහනදායී මූල්‍ය පහසුකම් නොලබන ආර්ථික තත්ත්වයක් ලඟාකරගෙන ඇති නිසා රාජ්‍ය මූල්‍ය තත්ත්වයන්හි දුෂ්කරතා මතුවී ඇත. එම නිසා රාජ්‍ය ආයෝජන වඩා ඵලදායී හා කාර්යක්ෂම ලෙස ප්‍රයෝජනයට ගැනීම අත්‍යවශ්‍ය වේ.

සීමිත රාජ්‍ය සම්පත් යෙදවීමේ ප්‍රමුඛතාවයන් හඳුනාගැනීම, ක්‍රියාත්මකකිරීමට මගපෙන්වීම සහ උපරිම සංවර්ධන ප්‍රතිඵල ළඟා කර ගැනීම සඳහා රාජ්‍ය ප්‍රතිපත්ති, වැඩසටහන් හා ව්‍යාපෘතීන්හි පූර්ව හා පශ්චාත් ඇගයීම් සිදුකිරීම අවශ්‍ය වේ. මෙම අරමුණ සහ යහපාලනයේ ව්‍යවස්ථාමය මූලධර්මයන් හා වගවීම ප්‍රත්‍යක්ෂ කරවීම සඳහා 2018 ජුනි මාසයේදී අමාත්‍ය මණ්ඩලය විසින් ජාතික ඇගයීම් ප්‍රතිපත්තිය අනුමත කරන ලදි.

## 2. අරමුණ

ජාතික ඇගයීම් ප්‍රතිපත්තියේ අරමුණ වනුයේ, ප්‍රතිපත්ති සම්පාදනය, සැලසුම්කරණය, අයවැය ප්‍රතිපාදන සැලසීම, අධීක්ෂණය හා වගවීමෙන් යුතු ක්‍රියාත්මකකිරීම වඩාත් දියුණු අන්දමින් ඉටුකිරීම හරහා ජාතික සංවර්ධන ඉලක්ක ලඟා කර ගැනීමට පෙලඹවීම ඇති කරන පරිසරයක් නිර්මාණය කිරීමයි. මෙයට අමතරව පුහුණු ආයතන හා සිවිල් සමාජවලට බලය ලබාදීම මගින් රටපුරා ඇගයීම් හැකියාවන් හා ධාරිතාවයන් ගොඩනැගීම සඳහා ජාතික ඇගයීම් ප්‍රතිපත්තිය උපකාරීවේ. ජාතික ඇගයීම් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම අඛණ්ඩ සහ අනුවර්තිත ක්‍රියාවලියක් වන අතර ඒ සඳහා යෙදවීම් හා භාවිතයන්හි වැඩිදියුණු කිරීම් අවශ්‍ය වේ. මූලධර්මයන් මත පදනම් වූ මෙම ප්‍රතිපත්තිය ක්‍රියාත්මකකිරීම සඳහා නම්‍යශීලීත්වයක් අවශ්‍ය වේ.

## 3. ජාතික ඇගයීම් ප්‍රතිපත්තියේ මූලධර්ම

ජාතික ඇගයීම් ප්‍රතිපත්තිය පහත මූලධර්ම මත පදනම් වේ.

3.1 සංවර්ධන ප්‍රතිඵල උදෙසා කළමනාකරණය, සංවර්ධන ක්‍රියාවලියේ මාර්ගෝපදේශන මූලධර්මය වනු ඇත. ජාතික සංවර්ධන අරමුණු උදෙසා දැනටමත් යොමුවී ඇති, තිරසර සංවර්ධන අරමුණු ලඟාකර ගැනීමට වැඩි නැඹුරුතාවයක් දක්වන රාජ්‍ය සේවයක් උදෙසා සංවර්ධන ප්‍රතිඵල සඳහා වූ කළමනාකරණ ප්‍රවේශය රජය විසින් හඳුන්වාදී තිබේ.

3.2 ඇගයීම් තොරතුරු භුවමාරුකරගැනීම සහ එම නිර්දේශයන් උපයෝගිකරගැනීම තුළින් යහපාලනය සහතික කෙරෙනු ඇත. ව්‍යවස්ථාවට අනුකූලවන පරිදි පාර්ලිමේන්තුව හා මහජනතාව කෙරෙහි ඇති විනිවිදභාවය හා වගවීම ශක්තිමත්කිරීම ජාතික ඇගයීම් ප්‍රතිපත්තියෙහි අරමුණකි. එසේම එය රාජ්‍ය ප්‍රතිපත්ති ව්‍යාපෘති හා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හා රාජ්‍ය සම්පත් භාවිතය කෙරෙහි රජයේ අභ්‍යන්තර වගවීම ශක්තිමත් කරයි. මෙම ප්‍රතිපත්තිය මගින් දිළිඳුකම හා අසමානතාවය අවමකිරීමේ සහ සංවර්ධනයේදී "කිසිවකුත් මගනොහැරීමේ" මූලධර්මය අවධාරණය කිරීමේ අරමුණ පෙරදැරි වූ අන්තර්ගත සංවර්ධන ක්‍රියාවලියක් ඉලක්ක කරයි.

3.3 ඇගයීම් ක්‍රියාවලියේ තිරසාරත්වය සඳහා අත්‍යවශ්‍ය පූර්ව කොන්දේසියක් ලෙස ඇගයීම් සංස්කෘතිය ප්‍රවර්ධනය කෙරෙනු ඇත. ජාතික ඇගයීම් ප්‍රතිපත්තිය මගින් සාක්ෂිමත පදනම් වූ ප්‍රතිපත්ති සම්පාදනය, සැලසුම් කිරීම හා සම්පත් වෙන්කිරීමේ කාර්යය ඉටුකරයි. ඇගයීම් සංස්කෘතිය ප්‍රවර්ධනය කිරීමට හා එය ආයතනගත කිරීමට ජාතික ඇගයීම් ප්‍රතිපත්තිය මගින් ඇගයීම් සඳහා වූ ඉල්ලුම ශක්තිමත්කිරීමේ දිරිගැන්වීම් මාලාවක් ආයතනගත කිරීම, ප්‍රතිපත්ති ක්‍රියාවටනැංවීම පිණිස සහයවීම හා විනිවිදභාවය හා ප්‍රතිලාභ ලබාදීම සඳහා කටයුතු කරයි.

> *"සංවර්ධන ප්‍රතිඵල උදෙසා කළමනාකරණය, සංවර්ධන ක්‍රියාවලියේ මාර්ගෝපදේශන මූලධර්මය වනු ඇත.*
>
> *ඇගයීම් තොරතුරු භුවමාරු කරගැනීම සහ. එම නිර්දේශයන් උපයෝගි කරගැනීම තුළින් යහපාලනය සහතික කෙරෙනු ඇත.*
>
> *ඇගයීම් සංස්කෘතිය ප්‍රවර්ධනය කිරීමට හා එය ආයතනගත කිරීමට, ජාතික ඇගයීම් ප්‍රතිපත්තිය මගින් ඇගයීම් සඳහා වූ ඉල්ලුම ශක්තිමත්කිරීමේ දිරිගැන්වීම් මාලාවක් ආයතනගත කිරීම, ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීම පිණිස සහයවීම හා විනිදභාවය හා ප්‍රතිලාභ ලබාදීම සඳහා කටයුතු කරයි."*

## 4. ප්‍රතිපත්ති ප්‍රකාශ

**4.1 තීරණ ගැනීම සඳහා වඩාත්ම යෝග්‍ය ඉගෙනුම් සහ ප්‍රතිපෝෂණ යාන්ත්‍රණය ලෙස ඇගයීම හඳුනාගනු ඇත.** අනාගත සංවර්ධන කාර්යයන් සැලසුම්කරණයේදීත්, ඒවා වෙනුවෙන් සාධාරණ ලෙස සම්පත් වෙන්කරදීමේදීත් ඇගයීම්වල නිරීක්ෂණ හා නිර්දේශ උපයෝගී කරගන්නා තෙක් ඇගයීම් චක්‍රය අසම්පූර්ණව පවතී. රටෙහි ආර්ථිකයට දරාගතහැකි මට්ටමේ රාජ්‍ය ආයෝජන සහ ඉහළ සමාජ ආර්ථික බලපෑමක් සහිත වැයකිරීම්වල ප්‍රමුඛතාවයන් නිර්ණය කිරීමට සහාය වන බැවින්, ජාතික ඇගයීම් ප්‍රතිපත්තිය මගින් වර්තමාන සැලසුම් හා අයවැය ක්‍රියාවලිය ශක්තිමත් කරනු ලබයි.

*1 රූපසටහන : ප්‍රතිපත්ති සහ ව්‍යාපෘති චක්‍රය*




**4.2 ජාතික ඇගයීම් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සහතික කිරීම සඳහා දැනට පවත්නා ආයතන පද්ධතිය තුළම යෝග්‍යආයතනික ව්‍යුහයක් ස්ථාපනය කෙරෙනු ඇත.** ජාතික ඇගයීම් ප්‍රතිපත්තිය ක්‍රියාත්මකකිරීම සඳහා නව ආයතනික සැකැස්මක් අපේක්ෂා නොකරන අතර, දෙපාර්තමේන්තු හා පවත්නා පද්ධතිවල සම්බන්ධීකරණය හා ධාරිතාව ශක්තිමත්කිරීම අවශ්‍යය. ඇගයීම් ක්‍රියාවලිය, සැලසුම්කරණය හා අයවැය ක්‍රියාවලිය සමඟ සමීපව හා අන්‍යෝන්‍ය වශයෙන් බැඳී ඇත. එබැවින් ජාතික ඇගයීම් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම, ජාතික හා උපජාතික මට්ටමේ සැලසුම්කරණය, අධීක්ෂණය හා අයවැය සම්පාදනය යන විෂයයන්හි වගකීම් දරණ දෙපාර්තමේන්තුවල සාමූහික ප්‍රයත්නයන් මත රඳාපවතී. එහි සම්බන්ධීකරණය ජාතික ඇගයීම් මෙහෙයුම් කමිටුව මඟින් මෙන්ම අමාත්‍ය මණ්ඩලය විසින් පිහිටුවනලද රාජ්‍ය ආයෝජන කමිටුව වැනි පවත්නා යාන්ත්‍රණ හරහාද සිදුකරනු ලබන අතර මෙම ඒකාබද්ධ ප්‍රවේශය ප්‍රවර්ධනය කිරීමට අවශ්‍ය වෙනත් අවස්ථාවන්හි දී පවත්නා නෛතික සහ නියාමන රාමුව සමඟ අනුගතවන මෙහෙයුම් කමිටු පිහිටුවනු ඇත. ඒකාබද්ධ තොරතුරු පද්ධතියක් මඟින් මෙම ප්‍රතිපත්තියෙහි ක්‍රියාත්මකභාවය පවත්වාගැනීමට අවශ්‍ය සවිස්තරාත්මක හා නිවැරදි තොරතුරු එක්රැස් කිරීමටත් ඒ සඳහා අවශ්‍ය සහයෝගීතාවය තහවුරු කිරීමටත් සහාය වනු ඇත. පවත්නා ආයතනික සැකැස්ම ප්‍රමාණවත් සම්පත් හා විශේෂඥතාවයකින් යුතුව ශක්තිමත් වනු ඇත.

**4.3 ඇගයීමෙහි වෘත්තීයමයභාවය ඉහළ නැංවීම සඳහා යෝග්‍ය මෙවලම්, විද්‍යාත්මක ක්‍රම සහ තොරතුරු පද්ධති ප්‍රවර්ධනය කෙරෙනු ඇත.** රාජ්‍ය ආයතන මඟින් ඇගයීම් සිදුකළයුතු ආකාරය පිළිබඳව සවිස්තරාත්මක මගපෙන්වීමක් සිදුකිරීම උදෙසාත්, ඇගයීම් ක්‍රියාවලියේ ගුණාත්මක භාවය හා විශ්වාසනීයත්වය පවත්වාගැනීම උදෙසාත් අවශ්‍ය උපදේශන මාලාව හා ප්‍රමිති, චක්‍රලේඛ මඟින් එම ආයතන වෙත නිකුත්කිරීමට නියමිතය. රාජ්‍ය ආයතනවල කාර්යසාධනය වර්ධනය උදෙසා එම ආයතනවල ප්‍රධාන කාර්යභාරයක් ලෙස ඇගයීම අන්තර්ගත කිරීමද මෙමගින් අපේක්ෂා කෙරේ. මෙම උපදේශන මාලාව මගින් මූලික දත්ත හා ඒවායේ මූලාශ්‍රවලට අනුරූපව ද ඇගයීමට පහසුව සලසන අයුරින්ද ප්‍රතිඵල රාමු සකස්කිරීමට මග පෙන්වන අතරම භාවිත කළ යුතු ඇගයීම් ක්‍රමවේද පිළිබඳ පැහැදිලි උපදෙස්ද සපයනු ඇත. විශේෂිත සමීක්ෂණ සහ බාහිර දත්ත උපයෝගී කරගෙන වැඩිදියුණු කරන ලද ආංශික තොරතුරු පද්ධති සහ ජාතික ඒකාබද්ධ තොරතුරු පද්ධතිය ඇගයීම් සඳහා තොරතුරු සපයන ප්‍රධාන මූලාශ්‍ර ලෙස ක්‍රියාකරයි

*රූපසටහන 2: අධීක්ෂණය සහ ඇගයීම් සඳහා වන මෙවලම්, ක්‍රම සහ ප්‍රවේශයන්*




රටෙහි ප්‍රතිපත්තිමය ප්‍රමුඛතා සහ ආංශික වශයෙන් හඳුනාගත් විශේෂතාවයන්ට අනුකූලවන පරිදි සංවර්ධන ක්‍රියාවලියටත්, පරිසර පද්ධති, ප්‍රජාව හා වත්කම්වලටත් බලපෑම් ඇතිකරන දේශගුණික විපර්යාස වැනි පොදු අභියෝගයට සුදුසු විසඳුම් ලබාදීමටද ඇගයීම ඉවහල් වේ.

**4.4 විනිවිදභාවය, සාමූහික වගකීම, විශ්වසනීය භාවය සහ දැනුම් හුවමාරුව සඳහා සාධක මත පදනම් වූ ඒකාබද්ධ සහ සහභාගීත්ව ඇගයීම් ප්‍රවේශය ප්‍රවර්ධනය කෙරෙනු ඇත.** සහභාගීත්ව ප්‍රවේශය තුළින් ව්‍යාපෘති, තීරණගැනීම සඳහා ක්‍රියාකාරී මැදිහත්වීමක් කරන වැඩසටහන් හෝ ප්‍රතිපත්තිවල පාර්ශවකරුවන් තුළ අධීක්ෂණ සහ ඇගයීම් ප්‍රතිඵල සහ නිර්දේශයන් කෙරෙහි තම හිමිකාරත්වය පිළිබඳ හැඟීමක් ජනනය කරනු ලබයි. ව්‍යාපෘති ක්‍රියාත්මකකිරීම තුළින් ලබන දැනුම වර්ධනයටත් ක්‍රියාත්මක කරන කාලය තුළම අවශ්‍ය නිවැරදි කිරීම් සිදුකිරීමටත් ව්‍යාපෘති ප්‍රතිලාභීන්ගේ ප්‍රතිචාර උපයෝගී කරගතහැකි අතර, එමගින් ප්‍රතිඵලවල තත්ත්වයද වැඩිදියුණු කළහැකිය. 3 වන රූපසටහනෙහි දක්වා ඇති පරිදි පුරවැසි සහභාගිත්වය විවිධ මට්ටම්වලින් සහ ක්‍රමවේද භාවිතයෙන් තහවුරුකරගත හැකි

අතර මේ පිළිබඳ විශේෂ සඳහනක් ජාතික ඇගයීම් ප්‍රතිපත්තියෙහි ක්‍රියාකාරී රාමුවතුළද ඇතුළත් වේ. වෙනස් මට්ටම් සහ ක්‍රමවේද පවතින අතර එය රූපසටහන් 3 හි ලැයිස්තුගතකර සහ ක්‍රියාවටනැගීමේ රාමුවේදී විශේෂයෙන් සඳහන්කර ඇත.

රූපසටහන් 3: ඇගයීමේදී ක්‍රියාත්මක වන පුරවැසි සහභාගීත්වයේ වර්ගීකරණය

| | |
|---|---|
| පුරවැසි උපදේශන | ඇගයීම කළ යුත්තේ කුමක්ද සහ යෙදවුම් පිළිබඳ උපදේශනය, තක්සේරුවේ සහ ඇගයීම් ක්‍රියාවලියේ පසු විපරම |
| සහභාගිත්ව ඇගයීම | ඇගයීම් අර්ථ නිරූපණය කරන සහ ඇගයීම් සිදු කරන, නිර්මාණය කරන ආයතනවල නියෝජනයන් පාර්ශවකරුවන්ගේ (ප්‍රතිලාභීන්ද ඇතුළත්ව) මැදිහත්වීම |
| සමාජ විගණන | පුරවැසියන් (සිවිල් සමාජය, ශාස්ත්‍රීය කණ්ඩායම්, ප්‍රජා සාමාජිකයන් පෞද්ගලික ක්ෂේත්‍රය) රාජ්‍ය සේවා ක්‍රියාවලිය සහ රජයේ වැඩසටහන් විගණනය සඳහා එක්ව ක්‍රියාකිරීම |

*"ඇගයීම් කාර්යය සඳහා ප්‍රමාණවත් සම්පත් වෙන්කිරීමේ අවශ්‍යතාවය පිළිගනු ඇත. ඇගයීම් සඳහා වන පිරිවැය, එය සැලසුම්කරණ සහ නිර්මාණය කරන අවස්ථාවේදීම ඇස්තමේන්තු සකස් කළ යුතු අතර, එය වාර්ෂික අයවැය ඇස්තමේන්තුවල ඇතුළත් කළ යුතුය."*

4.5 **ජාතික ඇගයීම් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමෙහි නියුක්තව සිටින පාර්ශවකරුවන්ගේ ධාරිතා සංවර්ධනය කිරීමේ අවශ්‍යතාවය පිළිගනු ඇත.** නව ප්‍රතිපත්තියේ මුලාරම්භයක් ලෙස, මහජනතාව, අධ්‍යයන ක්ෂේත්‍රයේ නියුතු වූවන් සහ රාජ්‍ය අංශය පුරා පූර්ණ දැනුවත්කිරීම මූලික කාර්යයක් වේ. එහි ප්‍රථම පියවර ලෙස ජාතික මට්ටම සහ උපජාතික මට්ටම්හි ඇගයීම් කිරීමේ හැකියාවන් පිළිබඳව තක්සේරුව, හැකියාවන් මිශ්‍රණය කිරීම සහ හැකියාවන්හි පවත්නා පරතරයන් පවත්නා ප්‍රමුඛතා නිර්ණායකයන් ශක්තිමත්කිරීම තුළින් ඇගයීම් පිළිබඳ දැනුම හා අත්දැකීම් තුලනය කරනු ඇත. මෙම ප්‍රතිපත්තිය ක්‍රියාත්මකකිරීමට පෙර පුහුණුකරුවන්ගේ හැකියාවන් වර්ධනයකිරීම සහ පවත්නා රාජ්‍ය පුහුණු ආයතන සමඟ සහයෝගය වර්ධනය කිරීම තුළින් සහතික කිරීමේ වැඩසටහනක් ස්ථාපිත කෙරෙනු ඇත. පවත්නා ඉල්ලුමේ ස්වභාවය අනුව උසස් මට්ටමේ ඇගයීම් පිළිබඳ දැනුම හා කුසලතාවන් වර්ධනය කිරීමට අවශ්‍ය වන පාඨමාලා හඳුන්වාදීමට උසස් අධ්‍යාපන ආයතන දිරිමත් කෙරෙනු ඇත. අධ්‍යාපන ප්‍රවේශයන් සහ පුහුණු අවස්ථා වැඩිකිරීම මගින් ඇගයීම් ක්ෂේත්‍රයේ රැකියා සඳහා වන සුදුසුකම් සහිත බුද්ධිමතුන් බිහිකිරීම සහ එමගින් ඇගයීම් ක්ෂේත්‍රයේ වෘත්තීයමය භාවය වර්ධනය කරනු ඇත. එමගින් ඇගයීම් ක්‍රියාවලියෙහි ගුණාත්මක භාවය සහ විශ්වසනීයත්වය ඉහළ නැංවෙනු ඇත. මේ ආකාරයෙන් ඒකාබද්ධ ඇගයීම් සඳහා සහභාගිවීමට සිවිල් සංවිධානයන්හිද හැකියා වර්ධනය අවශ්‍ය වේ.

4.6 **ඇගයීම් කාර්යය සඳහා ප්‍රමාණවත් සම්පත් වෙන්කිරීමේ අවශ්‍යතාවය පිළිගනු ඇත.** ඇගයීම් සඳහා වන පිරිවැය, එය සැලසුම්කරණ සහ නිර්මාණය කරන අවස්ථාවේදීම ඇස්තමේන්තු සකස් කළයුතු අතර, එය වාර්ෂික අයවැය ඇස්තමේන්තුවල ඇතුළත් කළයුතුය. වාර්ෂික ඇගයීම් සැළසුම් තුළ අන්තර්ගතවී ඇති ප්‍රතිපත්ති සහ ආයතනික ඇගයීම් සඳහා වන පිරිවැය, ජාතික අයවැය මගින් ආවරණය කෙරෙනු ඇත.

4.7 **සියලුම් පාර්ශවකරුවන්හට ඇගයීම් තොරතුරු සඳහා පහසුවෙන් ප්‍රවිෂ්ටවීමට හැකියාව ලැබෙනු ඇත.** 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනතේ 9 වන කොටසේ සඳහන් පරිදි සහ වගවීම සම්බන්ධයෙන් වන අවශ්‍යතාවයන්ට අනුව ඇගයීම් ප්‍රතිඵල ප්‍රසිද්ධකිරීම සදාචාරාත්මක අවශ්‍යතාවයකි. උදාහරණ වශයෙන් ශක්‍යතා අධ්‍යයන වාර්තා, ව්‍යාපෘති අධීක්ෂණ හා ඇගයීම් වාර්තා. ව්‍යාපෘති තොරතුරු එක්රැස්කිරීමේ කේන්ද්‍රීය මධ්‍යස්ථානයක් නොමැති වීම හේතුවෙන් රාජ්‍ය ආයෝජන පිළිබඳ තොරතුරු ලබාගැනීමේ අවස්ථාවන් සීමාවී ඇත. මහජනතාවට ඇගයීම් තොරතුරු සඳහා ප්‍රවිෂ්ටවීම පහසු කිරීමට වෙබ් අඩවි පාදක කරගත් ඒකාබද්ධ රාජ්‍ය ආයෝජන කළමනාකරණ සහ ඇගයීම් තොරතුරු පද්ධතියක් ස්ථාපිත කෙරෙනු ඇත. තොරතුරු පද්ධතිය තුළ ජාතික ඇගයීම් කමිටුව විසින් සමාලෝචනය සහ සහතික කරන ලද ව්‍යාපෘති තක්සේරුකිරීම්, මධ්‍ය කාලීන සමාලෝචන සහ ව්‍යාපෘති ඇගයීම් වාර්තා අන්තර්ගත වනු ඇත. වගවීම වැඩිදියුණුකිරීම පිණිස සංස්ලේෂණය කරන ලද ඇගයීම් වාර්තා අමාත්‍ය මණ්ඩලය වෙත වාර්ෂිකව ඉදිරිපත් කෙරෙනු ඇත. කාර්යසාධන විගණනය පහසුකිරීම සඳහා ඇගයීම් වාර්තා විගණකාධිපති වෙතද ලබා දෙනු ඇත.

## 5. ජාතික ඇගයීම් ප්‍රතිපත්තියේ පරමාර්ථ

5.1 **සාක්ෂි මත පදනම් වූ තීරණගැනීම සහ සැලසුම්කරණය වැඩිදියුණු කිරීම.** ශක්‍යතා අධ්‍යන හා පූර්ව ඇගයීම් ප්‍රතිඵල මත පදනම්ව ජාතික ප්‍රතිපත්ති සැකසීම හා ව්‍යාපෘති සැලසුම්කිරීම ජාතික ඇගයීම් ප්‍රතිපත්තිය මගින් අරමුණු කෙරේ. මධ්‍යකාලීන ප්‍රගති සමාලෝචන තුළින් ප්‍රතිපත්ති හා ව්‍යාපෘති ක්‍රියාත්මකකිරීම ශක්තිමත් කෙරෙනු ඇත. ව්‍යාපෘති පිරිවැය සැලකියයුතු ලෙස ඉහළ නැගීම හෝ සේවාවෙහි අවශ්‍යතාවය පහළ බැසීම වැනි අවස්ථාවකදී, ව්‍යාපෘති ප්‍රතිව්‍යුහගතකිරීම සඳහා ශක්‍යතා අධ්‍යයනය යාවත්කාලීනවීම අවශ්‍ය වනු ඇත. ප්‍රතිපත්ති හෝ ව්‍යාපෘතීන්හි පසු ඇගයීම් ප්‍රතිඵල සහ අදාළ ආයතනයෙහි ක්‍රියාත්මකකිරීමේ හැකියාව මගින්, අනාගත සැලසුම්කිරීම් හා ඒවායෙහි ප්‍රමුඛතාවයන් සඳහා අවබෝධයක් ලබාදෙනු ඇත.

5.2 **සම්පත්වල උපයෝගිතාවයෙහි අදාළත්වය, කාර්යක්ෂමතාවය සහ ඵලදායීතාවයත්, සංවර්ධන ප්‍රතිඵලවල තිරසාරත්වයත් සහතිකකිරීම,** සෑම ඇගයීමකදීම අදාළත්වය, කාර්යක්ෂමතාවය සහ ඵලදායීතාවය යන මානයන් සලකා බලනු ඇත. රාජ්‍ය සේවයේ ඵලදායීතාවය මනිනු ලබන්නේ එම සේවාවන්ගේ ගුණාත්මකභාවය සහ එම සේවාවන්ට ප්‍රවේශවීමේ හැකියාව මගිනි. වෙනස්වීමේ න්‍යාය විශ්ලේෂණය කිරීම මගින් ප්‍රතිපත්ති සහ ව්‍යාපෘති ඇගයීමේ අරමුණ වන්නේ, සංවර්ධන කාර්යයන්හි අදාළත්වය සහ ජාතික සංවර්ධන

ප්‍රමුඛතාවයන් සහ ප්‍රතිපත්තිමය අරමුණු ඉටුවේද යන්න සලකාබැලීමයි. ප්‍රධාන වශයෙන්ම රාජ්‍ය ආයෝජන සහ ව්‍යාපෘතිවල පෙර සහ පසු ඇගයීම්, සීමිත රාජ්‍ය සම්පත් පරිහරණය හා මෙහෙයුම් කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීමට උපකාරි වේ. මහා පරිමාණ වැඩසටහන් සහ ව්‍යාපෘති සඳහා දෙනලද ප්‍රතිපත්ති හෝ සංවර්ධන අරමුණු ළඟා කරගැනීම සඳහා වඩාත් කාර්යක්ෂම සහ ඵලදායී විසඳුම් තීරණය කිරීමට ඇගයීම තුළින් විකල්ප විශ්ලේෂණයක් සිදුකරයි. සංවර්ධන කාර්යයෙහි ස්වභාවය අනුව (ආර්ථික හෝ සමාජයීය), සංවර්ධනය සඳහා රාජ්‍ය ආයෝජනයෙහි මුළු පිරිවැය සහ ප්‍රතිලාභ (මූල්‍යමය නොවන ප්‍රතිලාභ ඇතුළත්ව) සැලකිල්ලට ගනිමින් එහි කාර්යක්ෂමතාව තක්සේරුකිරීම සඳහා වෙනස් වූ ඇගයීම් ශිල්පක්‍රම භාවිත කරනු ඇත. ඇගයීම් ප්‍රතිඵල තුළින් ප්‍රතිපත්ති, ව්‍යාපෘති සහ වැඩසටහන් විසින් ඒවායේ සංවර්ධන ප්‍රතිඵල ළඟාකරගෙන තිබේද යන්නත් සහ එම ප්‍රතිඵල ළඟාකරගෙන නොමැති බවට සාක්ෂි පවතිනවිට විකල්ප උපායමාර්ග ක්‍රියාත්මක කිරීමටත් මග පෙන්වයි. සංවර්ධන කාර්යයෙහි තිරසාරභාවය අත්‍යවශ්‍ය සාධකයක් වන අතර ඇගයීමේදී සැලකිලිමත් වියයුතු විවිධ මානයන් එනම්, ආර්ථික, මූල්‍ය, පාරිසරික සහ දේශගුණික තිරසාරභාවයත් විශේෂයෙන්ම රාජ්‍ය ව්‍යවසායන් සහ නියෝජිත ආයතන්හි ආයතනික තිරසාරභාවයත් ආවරණය කරනු ලබයි.

> *"සම්පත්වල උපයෝගිතාවයෙහි අදාළත්වය, කාර්යක්ෂමතාවය සහ ඵලදායීතාවයත්, සංවර්ධන ප්‍රතිඵලවල තිරසාරත්වයත් සහතික කිරීම. සෑම ඇගයීමකදීම අදාළත්වය, කාර්යක්ෂමතාවය සහ ඵලදායීතාවය යන මානයන් සලකා බලනු ඇත. රාජ්‍ය සේවයේ ඵලදායීතාවය මනිනු ලබන්නේ එම සේවාවන්ගේ ගුණාත්මකභාවය සහ එම සේවාවන්ට ප්‍රවේශවීමේ හැකියාව මගිනි."*

> *"සංවර්ධන ප්‍රතිඵල උත්පාදනය කරන සියලු මට්ටම්වල දී විනිවිදභාවය සහ වගවීම සහතික කිරීම. රාජ්‍ය ව්‍යවසායන් ඇතුළු රාජ්‍ය අංශයේ පොදුසේවා සැපයුම් ජාලය පියවරයන් ගණනාවකින් සහ විවිධ පාර්ශ්වකරුවන්ගෙන් සමන්විත වේ."*

5.3 **සංවර්ධන ප්‍රතිඵල උත්පාදනය කරන සියලු මට්ටම්වල දී විනිවිදභාවය සහ වගවීම සහතික කිරීම.** රාජ්‍ය ව්‍යවසායන් ඇතුළුව රාජ්‍ය අංශයේ පොදු සේවා සැපයුම් ජාලය පියවරයන් ගණනාවකින් සහ විවිධ පාර්ශ්වකරුවන්ගෙන් සමන්විත වේ. මෙය, තොරතුරු අසමමිතිකභාවය සහ කාර්යක්ෂමතා අභියෝගයන් නිර්මාණය කරන අතර එම තත්ත්වයන් නිරවුල්කිරීම සඳහා බාහිර ඇගයීම් යොදාගත හැකිය. ප්‍රතිඵල පදනම් කරගත් ඇගයීම මගින් සේවා සැපයුම් දාමයෙහි පරිපාලනය ඇතුළත විනිවිදභාවය හා වගවීම ශක්තිමත් කිරීමට උපකාර කෙරෙන අතර සරලකිරීම සහ නිවැරදිකිරීමේ ක්‍රියාකාරකම් පිළිබඳ අවබෝධයක් ලබා දෙයි. එමගින් තවදුරටත්, මහජන සේවා සපයන්නන් සහ රාජ්‍ය ව්‍යවසායන් විසින් ප්‍රතිපත්ති සම්පාදකයින් සහ පාර්ලිමේන්තුව වෙත ඇති වගවීම හා විනිවිදභාවය ඉහළ නැංවිය හැකිය. පැහැදිලි වෙළඳපොළ සංඥාවක් නොපවතින අවස්ථාවලදී මහජන සේවාවන් භාවිතකරන්නන්ගේ ප්‍රතිචාර අනුව එම සේවාවන්ට ප්‍රවේශවීමේ හැකියාව සහ ගුණාත්මකභාවය ඇගයීම කළයුතුය.

5.4 **ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘතීන්හි සෘණාත්මක බලපෑම් මෙන්ම ආසාර්ථකවීම් අවම කරමින් ගුණාත්මක බවින් උසස් භාවිතයන් සහ උගත් පාඩම් ප්‍රවර්ධනය කිරීම.** විශේෂිත වූ ව්‍යාපෘති, වැඩසටහන් හෝ ප්‍රතිපත්ති ඇගයීම තුළින් ලද අත්දැකීම් සහ උගත් පාඩම්ද ඒ ආශ්‍රිත දැනුමද ස්වකීය සංවිධානය තුළ මෙන්ම බාහිර පාර්ශවයන් සමගද හුවමාරු කර ගැනීම ජාතික ඇගයීම් ප්‍රතිපත්තිය මගින් දිරිගන්වනු ලබයි. එමගින් ප්‍රතිපත්ති සම්පාදකයන්ට සහ තීරණ ගනු ලබන පාර්ශවයන්ට නිවැරදි ප්‍රතිපත්තිමය මගපෙන්වීම සිදුකිරීමට අවශ්‍ය විශ්වාසනීය හා ප්‍රයෝජනවත් තොරතුරු සපයනු ලබයි. එසේම එම තොරතුරු මගින් ඉහළ ශක්‍යතාවයකින් හා බලපෑමකින්යුත් රටේ ආර්ථිකයට දරාගතහැකි ව්‍යාපෘති සැලසුම්කිරීමටත්, පුමුඛතාවය හඳුනාගැනීමටත්, සැලසුම් සම්පාදකයන්ට හැකියාව ලැබෙන අතර, කාර්යක්ෂමව හා ඵලදායීව ඒවා ක්‍රියාත්මකකිරීමට ව්‍යාපෘති කළමනාකරුවන් දිරිගැන්වීමත් සිදුකරයි. ඇගයුම් ක්‍රියාවලියේදී ඒවායේ නිරීක්ෂණ හා නිර්දේශ නිර්ණයකිරිමෙදී මෙම පාර්ශවකරුවන්ගේ ප්‍රශස්ත සහභාගිත්වය හා හිමිකාරීත්වය අත්‍යවශ්‍යය.

5.5 **රට තුළ ඇගයීම් සංස්කෘතියක් නිර්මාණය කිරීම.** දැනුවත්කිරීම හා දිරිගැන්වීම් තුළින් ජනතාව තුළ ඇගයීම සඳහා ඉල්ලුමක් ඇතිකර ඇගයීම් සංස්කෘතියක් රට තුළ ප්‍රවර්ධනය කිරීම ජාතික ඇගයීම් ප්‍රතිපත්තියේ අරමුණකි. ඇගයීම සංස්කෘතියක් මගින්, නිවැරදි කරන ලද ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම, ප්‍රතිපත්තිමය මැදිහත්වීමහි ප්‍රමුඛතා නිර්ණය කිරීම සහ ව්‍යාපෘති හා වැඩසටහන් සකස්කිරීම සඳහා උගත්පාඩම් ඒකාබද්ධ කිරීම සිදුකරයි. ජාතික ඇගයීම් ප්‍රතිපත්තිය, ඇගයීම් කළමනාකරණ මෙවලමක් ලෙස සහ වැරදි හඳුනාගනීමේ ක්‍රියාවලියකට වඩා වැරදි නිවැරදිකිරීමේ සහ අධ්‍යයන යාන්ත්‍රණයක් ලෙස හඳුනාගනු ලබන අතර එය කාර්යසාධනය වැඩිදියුණුකිරීම දිරිගන්වනු ඇත. ජාතික ඇගයීම් ප්‍රතිපත්තිය මගින්, ජ්‍යේෂ්ඨ කළමනාකාරීත්වයේ නායකත්වය, කැපවීම සහ හැකියාව හඳුනාගැනීම මෙන්ම දිරිගැන්වීමද සංවිධාන ආධාරක ව්‍යුහයන් ශක්තිමත් කිරීම තුළින් ඇගයීම් සංස්කෘතිය ප්‍රවර්ධනය කිරීමද සිදු කරනු ඇත.

## 6. යෝග්‍යතාවය සහ විෂයපථය

ශ්‍රී ලංකාවේ ජාතික සහ උපජාතික මට්ටමින් ක්‍රියාත්මක කරනු ලබන සියලු ප්‍රතිපත්ති මෙන්ම ව්‍යාපෘති සහ වැඩසටහන් ජාතික ඇගයීම් ප්‍රතිපත්තිය මඟින් ආවරණය කෙරේ. මෙයට අමතරව, රාජ්‍ය ව්‍යාපෘති හා වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබන රාජ්‍ය ව්‍යාපාරද අතුළු රාජ්‍ය ආයතන කෙරෙහිද ජාතික ඇගයීම් ප්‍රතිපත්තිය මඟින් අවධානය යොමුකරනු ලබයි. ප්‍රදායකයින් විසින් අරමුදල් සපයන ව්‍යාපෘති සම්බන්ධයෙන් දක්වා ඇති විශේෂ මාර්ගෝපදේශයන්ද, ඇගයීම් පිළිබඳ ජාතික මාර්ගෝපදේශයන්ට සම්භාමීව යොදාගත හැකිය.

ඉහත දක්වා ඇති පොදු මූලධර්ම භාවිතාවන අතර රාජ්‍ය ප්‍රතිපත්ති, ආයතන සහ වැඩසටහන් හා ව්‍යාපෘති ඇගයීම අතර පවතින වැදගත් වෙනස්කම් වෙන් වෙන් වශයෙන් හඳුනාගනුලබයි.

*රූපසටහන් 4 : ජාතික ඇගයීම් ප්‍රතිපත්තියේ ආවරණය හා අදාළත්වය*

| ඇගයීම් සැකැස්ම | රාජ්‍ය ප්‍රතිපත්ති සහ ආයතන | වැඩසටහන් සහ ව්‍යාපෘති |
|---|---|---|
| ක්‍රමවේදය | ජාතික සංවර්ධන සැලසුම්, ආංශික ප්‍රතිපත්ති, (MfDR හා SDG) | දැක්ම/ආංශික ප්‍රතිපත්ති PIP/NPD මාර්ගෝපදේශ සහ ප්‍රතිඵල රාමුව |
| වගකීම | ප්‍රතිපත්ති සම්පාදනය, මූල්‍යයනය ක්‍රියාත්මක කිරීම, අධීක්ෂණය සහ ඇගයුම් ආයතන | සැලසුම්කරණය, මූල්‍යනය, ක්‍රියාත්මක කිරීම්, නිරීක්ෂණය සහ ඇගයුම් ආයතන |
| ආවරණය | ප්‍රතිපත්ති සහ පුරවැසියන් විසින් ආවරණය කරනු ලබන රාජ්‍ය සහ පෞද්ගලික සේවා සැපයුම්කරුවන් | වැඩසටහන් සහ ව්‍යාපෘති, පාර්ශවකරුවන් සහ ප්‍රතිලාභීන් |
| සංවිධානය කිරීම සහ අරමුදල් සැපයීම | ජාතික ඇගයුම් සැලසුම්. ඇගයුම් කාර්යය සඳහා කේන්ද්‍රිය ස්ථානය. | මුළු පිරිවැයෙහි සහ වාර්ෂික අයවැයෙහි ඇතුළත්වන ජාතික ඇගයීමේ සැලැස්ම. |
| වර්ගය | පෙර බලපෑම් ඇගයීම/ පශ්චාත් ඇගයීම | තක්සේරු කිරීම, මධ්‍ය කාලීන සමාලෝචනය සහ පශ්චාත් ඇගයීම. |
| ජාතික හා උප ජාතිකමට්ටම, අදාළ රේඛීය අමාත්‍යාංශ සහ ක්‍රියාත්මක කිරීමේ ආයතන | | |

6.1 රාජ්‍ය ප්‍රතිපත්ති සහ ආයතන ඇගයීම් පැතිකඩයන් සලකාබැලීම එක් එක් අංශයට විශේෂිත විය හැකිය. ප්‍රතිපත්ති ඇගයීමේ විෂයපථය වෙනස්විය හැකි නමුත් ඉල්ලුම් සහ සැපයුම් පාර්ශව මෙන්ම එහි පරමාර්ථයන් සඳහා දායක වූ සියලු පාර්ශවකරුවන් අනුව ඔවුන් පොදු හෝ පෞද්ගලික සේවා සපයන්නන්ද (උදා: සෞඛ්‍ය හෝ අධ්‍යාපනය) යන්න ආවරණයවන පරිදි අවශ්‍යවන සම්පත්වල ප්‍රමාණය තීරණය වේ. මෙම ඇගයීම අදාළත්වය, කාර්යක්ෂමතාව, ඵලදායීතාවය, බලපෑම සහ තිරසාර බව යන පැතිකඩ ආවරණය කරයි.

- ජාතික සංවර්ධන සැලැස්ම, ජාත්‍යන්තර ගිවිසුම් හා උපායමාර්ග හා අයවැය තුළින් ස්ථාපිතකර ඇති ජාතික හෝ කලාපීය ආර්ථික සංවර්ධන ප්‍රමුඛතාවන්ට අනුව අදාළත්වය තක්සේරු කරනු ලැබේ. එය ප්‍රතිපත්තිමය අරමුණු හා දර්ශකයන්ගේ අදාළත්වය, විෂයපථය හා එහි අන්තර්ගතය, යෝජිත මැදිහත්වීම්වල තර්කානුකූලභාවය සහ ක්‍රියාත්මකකිරීමේ ක්‍රමවේදයන් අන්තර්ගත වේ.

> *ශ්‍රී ලංකාවේ ජාතික සහ උපජාතික මට්ටමින් ක්‍රියාත්මක කරනු ලබන සියලු ප්‍රතිපත්ති මෙන්ම ව්‍යාපෘති සහ වැඩසටහන් ජාතික ඇගයීම් ප්‍රතිපත්තිය මඟින් ආවරණය කෙරේ. රාජ්‍ය ප්‍රතිපත්ති සහ ආයතනවල ඇගයීම් පැතිකඩයන් සලකාබැලීම හෝ එක් එක් අංශයට විශේෂිත විය හැකිය.*
>
> *ප්‍රතිපත්ති ඇගයීමේ විෂයපථය වෙනස්විය හැකි නමුත් ඉල්ලුම් සහ සැපයුම් පාර්ශව මෙන්ම එහි පරමාර්ථයන් සඳහා දායකවූ සියලු පාර්ශවකරුවන් අනුව ඔවුන් පොදු හෝ පෞද්ගලික සේවා සපයන්නන්ද (උදා: සෞඛ්‍ය හෝ අධ්‍යාපනය) යන්න ආවරණය වන පරිදි අවශ්‍ය වන සම්පත්වල ප්‍රමාණය තීරණය වේ. මෙම ඇගයීම අදාළත්වය, කාර්යක්ෂමතාව, ඵලදායීතාවය, බලපෑම සහ තිරසාරබව යන පැතිකඩ ආවරණය කරයි.*

- ප්‍රතිපත්තිය ක්‍රියාවටනැංවීමේදී කාර්යක්ෂමතාවය ඇගයීමට ලක්කරන අතර අවසානයේදී අපේක්ෂිත ප්‍රතිඵලය සාක්ෂාත්කර ගැනීම සිදුවන්නේ කෙතරම් සම්පත් ප්‍රමාණයක් මතද යන්න තීරණයකරන අතර, ඒ සඳහා අයවැයේ සිදුවන බලපෑම තක්සේරුකිරීම අවශ්‍යවිය හැක. පුරවැසියන්ට හා පුද්ගලික අංශයට සෘජුවම බලපාන ප්‍රතිපත්ති සඳහා අපේක්ෂිත අනුකූලතා පිරිවැය ඇගයීමට හා ඒ තුළ විකල්ප හා කාර්යක්ෂමතා විශ්ලේෂණය සැලකිල්ලටගැනීම නිර්දේශ කරනු ලබන අතර උපාය අරමුණු සමග සමපාතවන බව සහතිකකිරීමට මෙය උපකාරී වේ. අදාළත්වය සහ කාර්යක්ෂමතාවය ඇගයීමට ලක්කරනු ලබන්නේ පෙර සහ පසු ඇගයීම් ක්‍රියාවලිය මඟිනි.

- ප්‍රතිපත්තියක ඵලදායිත්වය, ක්‍රියාත්මක කරන අවස්ථාවේදී මෙන්ම නැවතත් අවසානයේදී ඇගයීමට ලක් කරනු ලබන අතර, එහිදී අපේක්ෂිත ප්‍රතිඵල කෙතරම් දුරට ලඟාකර ගත්තේද, කවර මුහුණාවරකින්ද, කොපමණ පිරිවැයකින්ද (මූල්‍ය, මානව සම්පත්, පරිපාලන, අනුකූලත්වය) යන්නත් අපේක්ෂා නොකළ ප්‍රතිවිපාක තිබේනම් (ධනාත්මක හෝ ඍණාත්මක බාහිර ක්‍රියාකාරකම්) ඒවා මොනවාද යන්නත් හඳුනාගැනීම සිදුකෙරේ. මෙවැනි ඇගයීමකදි පාර්ශවකරුවන් සහ ප්‍රතිලාභීන්ගේ ප්‍රතිචාරයන් අන්තර්ගත කරනු ලබන අතර අවශ්‍යවිට නිවැරදි පියවරගැනීම සඳහා මග පෙන්වීම සිදු කරයි.

- පෙර සහ පසු ඇගයීම් තුළින් ප්‍රතිපත්තියක තිරසරභාවය තක්සේරු කරනු ලබන්නේ මූල්‍ය, ආයතනික, පාරිසරික සහ දේශගුණික සාධක සැලකිල්ලට ලක්කිරීම මඟින්ය.

- මෙහි ප්‍රධාන අරමුණ වන්නේ ප්‍රතිපත්තියක් / ව්‍යාපෘතියක් ඇතිව හෝ නොමැතිව ඇතිවන තත්ත්වයන් සහ ඊට අදාළ ප්‍රතිඵල, සම්පත් මත පදනම්ව කරනු ලබන දිගුකාලීන ප්‍රතිඵල ඇගයීමක් මඟින් එහි තිරසරබව මැනීමකළ හැකිය

- අමාත්‍යාංශ සහ ආයතන මඟින් සකස්කරනු ලබන වාර්ෂික ක්‍රියාකාරි සැලසුම් හා වාර්තා මූල්‍ය රෙගුලාසිවලට අනුකූලද යන්න ආයතනවල ඇගයීම් කිරීමේදී සැලකිල්ලට ගනු ලැබේ. රාජ්‍ය ව්‍යවසායන් ඇගයීමේදී ආයතනික අභිප්‍රායන්, වාර්ෂික වාර්තාවන් සහ මූල්‍ය ප්‍රකාශන සැලකිල්ලට ගනු ලබයි.

6.2 **වැඩසටහන් සහ ව්‍යාපෘති ඇගයීම:** තිරසාර සමාජ ආර්ථික සංවර්ධනයක් ඇතිකිරීම සඳහා ප්‍රධාන ආර්ථික ප්‍රතිපත්ති උපාංගයක් වන්නේ රාජ්‍ය අංශයේ ආයෝජනයන්ය. එහෙත්, ව්‍යාපෘති හා වැඩසටහන් ක්‍රියාත්මකකිරීමේදී ඇතිවන ප්‍රමාදයන් හා අඩු කාර්යක්ෂමතාවය මඟින් රාජ්‍ය ආයෝජනවලට වන බලපෑම එහි ප්‍රශස්ථ ප්‍රතිඵල කෙරෙහි බලපෑමක් ඇති කරයි. රාජ්‍ය ආයෝජන හා ව්‍යාපෘති පිළිබඳව කරනුලබන පසු ඇගයීමක් මඟින් රාජ්‍ය ආයෝජනවල විභජනය හා මෙහෙයුම් කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීමටත්, ආර්ථිකමය සහ මූල්‍යමය තිරසාරබව ඇතිකිරීමටත්, සමාජ ආර්ථික බලපෑමක් ඇතිකිරීමටත් ඉවහල් වේ. වැඩ සටහන් හා ව්‍යාපෘති ඇගයීමේදි අදාළත්වය, කාර්යක්ෂමතාවය, ඵලදායීතාවය, බලපෑම සහ තිරසරභාවය ආවරණය කෙරේ. ව්‍යාපෘති සහ වැඩසටහන් ඇගයීම, ව්‍යාපෘති චක්‍රයේ එකිනෙක හා බැඳුනු පියවරයන්ගේ එක් අවස්ථාවක් වන අතර, ව්‍යාපෘති පෙර ඇගයීම, ශක්‍යතා අධ්‍යයනය සහ ඇගයීමද ඊට ඇතුළත් වේ. රාජ්‍ය ක්‍රමසම්පාදන ක්‍රියාවලිය භාරව කටයුතු කරන දෙපාර්තමේන්තුව මඟින් නිකුත් කරනු ලබන විශේෂිත වූ මාර්ගෝපදේශයන් හා සීමාවන් අනුව මෙම කාර්යය සිදුකළ යුතුය. ව්‍යාපෘති ඇගයීම් ක්‍රියාවලියේ ඇති අදාළ තේමාවන් හෝ ආංශික උපායමාර්ග, රාජ්‍ය ආයෝජන වැඩසටහන මෙන්ම විශේෂිත සංවර්ධන අරමුණු ඉලක්ක කරගත් වැඩසටහන් හා ව්‍යාපෘති හා ඒවායේ ප්‍රතිඵල රාමුද සැලකිල්ලට ගනු ඇත. එබැවින් පූර්ව ඇගයීම් ක්‍රියාවලිය ශක්තිමත් කිරීම පිණිස විශේෂිත, මැනිය හැකි, ප්‍රමාණවත්, කාලානුරූප දර්ශක සහිත වූ නිරවද්‍ය දත්ත ලබාගැනීම අත්‍යවශ්‍ය වේ. වැඩ සටහන් හා ව්‍යාපෘති ඇගයීමේදී අංක 5 රූප සටහනෙන් දක්වා ඇති අංගයන් ආවරණය වනු ඇතැයි බලාපොරොත්තු වේ.

ජාතික ඇගයීම් ප්‍රතිපත්තිය මගින් වහපෘති පූර්ව ඇයිමට අමතරව, ව්‍යාපෘති නියමිත කාලසීමාව සහ අපේක්ෂිත පිරිවැය තුළ ඉටුකර ඇත්දැයි විමසාබැලීම සඳහා ව්‍යාපෘතිය සම්පූර්ණකිර්ම පිළිබඳව වූ සමාලෝචනයන් සහ පසු ඇගයීම් කිරීමට මග පෙන්වයි.

ව්‍යාපෘති ක්‍රියාත්මකකිරීමේදී අපේක්ෂිත කාලරාමුවෙන් විශාල වශයෙන් අපගමනයන් වු අවස්ථාවේදී ඒ සඳහා හේතු වු ව්‍යාපෘති පිරිවැය මෙන්ම සැලසුම් හදුනාගතයුතු අතර, ඒ සඳහා හේතු වූ කරුණු පැහැදිලි කිරීමට ද සිදුවනු ඇත. ව්‍යාපෘති සැලසුම්කිරීමේදී ඇතිවන අවදානම්සහගත තත්ත්වයන් කලින් හඳුනාගත් බව සඳහන් කළද අවදානම් කළමනාකරණය සහ එම අවදානම් අවම කිරීමට ගෙනඇති පියවර ප්‍රමාණවත්ද යන්න සැලකිල්ලට ගතයුතුය. අනාගත ව්‍යාපෘති සැලසුම් කිරීමේදී හා ක්‍රියාත්මක කිරීමේදී පූර්ව අත්දැකීම් පාදකකර ගනිමින් අනාගත ව්‍යාපෘති ක්‍රියාත්මකකිරීම සඳහා අවශ්‍ය නිර්දේශ ලබාදීම සිදුකල යුතුය. නව ව්‍යාපෘති සැලසුම් කිරීමේදී උගත් පාඩම් පිළිබඳ දැනුම ඒ සඳහා යොදාගැනීම තහවුරුකිරීම සඳහා ජාතික ආයතනික ප්‍රතිපත්තියක් ස්ථාපිතකිරීම ජාතික ඇගයීම් ප්‍රතිපත්තිය මඟින් ඇතිකරනු ලබන අතර, තවද සංවර්ධන පාර්ශවකරුවන්, ඇගයීමේ අවශ්‍යතාවයන් සහ ක්‍රමවේදයන් විදේශ මූල්‍යකරණ ව්‍යාපෘතීන්හි දී සැලකිල්ලට ගනු ඇත.

*රූපසටහන 5 : ව්‍යාපෘති තක්සේරු වාර්තාවේ මූලිකාංග*



## 7. ජාතික ඇගයීම් ප්‍රතිපත්තිය ක්‍රියාවට නැංවීම

සියලු රේඛීය අමාත්‍යාංශ, පළාත් සභා, පළාත් පාලන ආයතන සහ අනෙකුත් රාජ්‍ය ආයතන/රාජ්‍ය ව්‍යාපාරයන්හි නීතිමය සහ නියාමන රාමුවට අනුකූලව මෙම ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මකකිරීම එම ආයතනයන්හි එක් වගකීමක් වේ. මාර්ගෝපදේශන්හි ඇතුළත්කර ඇති ප්‍රමුඛතා නිර්ණායක මත පදනම්ව සකස්කරන ජාතික ඇගැයීම් සැලැස්ම, වාර්ෂිකව යාවත්කාලීන කරනු ලබන තුන් අවුරුදු සැලැස්මක් වේ.

### 7.1 ආයතනික ව්‍යුහය සහ වගකීම්

7.1.1. ජාතික ඇගයීම් ප්‍රතිපත්තිය ක්‍රියාත්මකකිරීමේ ජාතික මට්ටමේ කේන්ද්‍රීය ආයතනය ලෙස ව්‍යාපෘති කළමනාකරණ සහ අධීක්ෂණ දෙපාර්තමේන්තුව කටයුතු කරනු ඇත. විෂයභාර අමාත්‍යාංශය හරහා ව්‍යාපෘති කළමනාකරණ සහ අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් පහත කාර්යයන් සිදු කරනු ඇත.

අ) ජාතික, පළාත් සහ පළාත් පාලන මට්ටමින් ජාතික ඇගයීම් ප්‍රතිපත්තිය ක්‍රියාත්මකකිරීම සඳහා නායකත්වය, මහපෙන්වීම සහ සහාය සැලසීම.

ආ) වෘත්තීයමය ඇගයීම් සිදුකිරීමට හැකිවන පරිදි සැලසුම්කරණය සහ අධීක්ෂණය යන ක්ෂේත්‍ර යටතේ අදාළ සියළු ආයතනවල ධාරිතා වර්ධනයට පහසුකම් සැපයීම.

ඇ) රේඛීය අමාත්‍යාංශ සහ අනෙකුත් අදාළ ආයතනයන්හි සහයෝගීතාවයෙන් යුතුව ජාතික ඇගයීම් ප්‍රතිපත්තියෙහි ක්‍රියාත්මකභාවය සමාලෝචනය කිරීම.

ඉ) ඇගයීම් තුළින් අනාවරණය කරගත් කරුණු සහ නිර්දේශයන්, තීරණගැනීම් සහ ප්‍රතිපත්ති සම්පාදන ක්‍රියාවලියේදී උපයෝගී කරගැනීමට දිරිගැන්වීම.

ඊ) නිසි අවබෝධයකින් යුතුව තීරණගැනීමේ කාර්යය පහසු කරනු පිණිස ඇගයීම තුළින් අනාවරණය කරගන්නා තොරතුරු අමාත්‍ය මණ්ඩලය වෙත වාර්තා කිරීම.

7.1.2 ඇගයීම් ප්‍රතිපත්තිය බාධාවකින් තොරව ක්‍රියාත්මකවීම සහතික කරනු පිණිස ජාතික ඇගයීම් රාමුව මඟින් නියමකර ඇති පරිදි ක්‍රමසම්පාදන, මූල්‍ය,ජාතික සහ උපජාතික මට්ටම්හි ක්‍රියාත්මකකිරීමේ ආයතනයන්හි සහයෝගිත්වයෙන් ජාතික ඇගයීම් මෙහෙයුම් කමිටුව ස්ථාපිත කිරීම.

*රූපසටහන 6: ජාතික ඇගයීම් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ සැකැස්ම*



# පරිච්ඡේද අංක - 2

# ජාතික ඇගයීම් ප්‍රතිපත්තිය ක්‍රියාත්මකකිරීම සඳහා වූ ආයතනික රාමුව

# ජාතික ඇගයීම් ප්‍රතිපත්තිය ක්‍රියාත්මකකිරීම සඳහා වූ ආයතනික රාමුව

ශ්‍රී ලංකා ජාතික ඇගයීම් ප්‍රතිපත්තියෙහි 4.2 වැනි ප්‍රතිපත්ති ප්‍රකාශය අනුව, දැනට පවතින රජයේ ආයතනික සැකැස්ම තුළින්ම ජාතික ඇගයීම් ප්‍රතිපත්තිය ක්‍රියාත්මකකිරීම සඳහා වූ ආයතනික රාමුව හඳුනාගත යුතුය. පහතින් මනාලෙස නිර්වචනයකර ඇති යෝජිත ආයතනික රාමුව මගින් අපේක්ෂාකරනු ලබන්නේ:

1. ඇගයීම් තොරතුරු පහසුවෙන් ලබාගත හැකි බව තහවුරු කිරීම;
2. ඇගයීම්වලින් අනාවරණය වූ කරුණු මත පදනම්ව වඩාත් සුදුසු තීරණගැනීම;
3. ඇගයීම්වලින් අනාවරණය වූ කරුණු හා ඒවායේ නිර්දේශ හෙළිදරව්කිරීම හා බෙදාහැරීම;
4. ඇගයීම් තුළින් උගත් පාඩම් සැලසුම් ක්‍රියාවලියේදී උපයෝගී කරගැනීම සහ;
5. ඇගයීම්වලට අදාළ කළමනාකරණ ප්‍රතිචාර පසුවිපරම් කිරීමය.

පාර්ශවකරුවන්ගේ භූමිකාවන්, වගකීම් හා ක්‍රියාකාරී විෂයපථය හඳුනාගැනීමට සහ ජාතික ඇගයීම් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරනු ලබන පහළම මට්ටමේ සිට ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග හා තීරණ ගන්නා ඉහළම මට්ටම දක්වා එම කටයුතු ඵලදායීව හා සුමට ලෙස ක්‍රියාත්මකකිරීමට පහත විස්තරකර ඇති ආයතනික රාමුව මගින් සහාය ලැබේ.

1. **දිස්ත්‍රික් පරිපාලනය, ප්‍රාදේශීය සභා සහ රාජ්‍ය ව්‍යාපාර** මගින් ඇගයීම සඳහා සුදුසු විෂයයන් හඳුනාගැනීම සහ ඒ සඳහා වූ යෝජනා අදාළ අමාත්‍යාංශ හා පළාත්සභා වෙත ඉදිරිපත්කිරීම මගින් ජාතික ඇගයීම් ප්‍රතිපත්තිය ක්‍රියාත්මකකිරීමේ ආරම්භක පියවර ගනු ලබයි. ජාතික ඇගයීම් ප්‍රතිපත්තියෙහි නියමකර ඇති පරිදි, ඇගයීම් කාර්යය ඉටුකිරීම සඳහා මෙම ආයතනයන්හි දැනට පවතින ආයතනික සැකැස්ම ශක්තිමත් කරනු ඇත. ඇගයීම් සිදුකිරීම සඳහා මෙම ආයතනයන් සතුවිය යුතු ධාරිතාව ක්‍රමානුකූලව වර්ධනයකිරීමේ වැඩසටහන් අදාළ අමාත්‍යාංශ හා පළාත් සභාවන් හි අදහස් විමසීමෙන් අනතුරුව ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව මගින් ක්‍රියාත්මක කිරීමට නියමිතය.

2. **රේඛීය අමාත්‍යාංශ හා පළාත් සභා** මගින් ඇගයීම් සිදුකිරීමත්, සැලසුම්කරණය හා තීරණගැනීමේදී එම ඇගයීම්වල නිරීක්ෂණ උපයෝගීකර ගැනීමත් සිදුකරන බැවින් මෙම ආයතන ජාතික ඇගයීම් ප්‍රතිපත්තිය ක්‍රියාත්මකකිරීමේ පුරෝගාමීත්වය දරයි. රේඛීය අමාත්‍යාංශ හා පළාත් සභාවල දැනට පවතින ආයතනික සැකැස්ම තුළින්ම ඇගයීම් කාර්යය ඉටුකිරීම සඳහාම වෙන් වූ අංශයක් හෝ ඒකකයක් සඳහා සුදුසු කණ්ඩායමක් හඳුනාගෙන එම අංශය හෝ ඒකකය එම කාර්යය නිසිපරිදි ඉටුකිරීමට සුදුසු පරිදි ශක්තිමත් කිරීමට අපේක්ෂිතය. ආයතනයක් තුළ සිදුකරන ලද සැලසුම්කරණය හා අධීක්ෂණ කටයුතු සම්බන්ධ ආයතනික මතකය (Institutional memory) ඇගයීම්වල සාර්ථකත්වයට තීරණාත්මක ලෙස බලපාන සාධකයක් වන බැවින්, පහත සඳහන් කාර්යයන් ඉටුකිරීම සඳහා රේඛීය අමාත්‍යාංශ හා පළාත් සභාවල දැනට පවතින ක්‍රමසම්පාදන (සැලසුම්) හා අධීක්ෂණ අංශ/ඒකක ශක්තිමත් කරනු ඇත.

**රේඛීය අමාත්‍යාංශ හා පළාත් සභාවල කාර්යයන්:**

i. තම විෂයපථය යටතේ පවතින ආයතනවල ධාරිතාව වර්ධනයකිරීම සහ ඇගයීම් විෂයය රාජ්‍ය අංශය තුළ ආයතනගත කිරීම උදෙසා අදාළ ආයතන හා ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව අතර සන්නිවේදනය හා සම්බන්ධීකරණය පවත්වා ගැනීම.

ii. තම විෂයපථය යටතේ පවතින දෙපාර්තමේන්තු, ආයතන සහ රාජ්‍ය ව්‍යාපාරවලින් එළඹෙන මුදල් වර්ෂය තුළ ක්‍රියාත්මකකිරීමට සුදුසු ඇගයීම් පිළබඳ යෝජනා කැඳවීම.

iii. සුදුසු ඇගයීම් යෝජනා තෝරාගැනීම (ඇමුණුම-1 හි සඳහන් නිර්ණායක මත පදනම්ව) සහ තෝරාගත් යෝජනා ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත යොමුකිරීම (ඒවාට අනුමැතිය ලබාගැනීම සඳහා ජාතික ඇගයීම් මෙහෙයුම් කමිටුව වෙත ඉදිරිපත් කිරීම).

iv. කාර්යය මණ්ඩලයේ ඇගයීම් විෂයට අදාළ ධාරිතාව වර්ධනයකිරීම සඳහා අවශ්‍ය තාක්ෂණික සහාය ලබාගැනීම, ජාතික ඇගයීම් මෙහෙයුම් කමිටුවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම සහ සිදුකරන ලද ඇගයීම්වල නිරීක්ෂණ බෙදාහැරීම සඳහා ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව සමඟ සම්බන්ධීකරණය.

v. තීරණගැනීමේදී සහ සැලසුම්කරණයේදී ඇගයීම්වල නිරීක්ෂණ උපයෝගී කරගන්නා බව තහවුරු කිරීම.

3. ජාතික ඇගයීම් මෙහෙයුම් කමිටුවේ නිත්‍ය සාමාජිකයකු (නිළ බලයෙන්) වශයෙන් **ජාතික අයවැය දෙපාර්තමේන්තුව**, ජාතික ඇගයීම් සැලසුම් ක්‍රියාත්මකකිරීමට අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන සැලසීමේ හැකියාව තහවුරුකිරීම හෝ ඒ සඳහා ශක්‍යතාවයෙන් යුත් වෙනත් මූලාශ්‍ර හඳුනාගැනීම මගින් එම සැලසුම් පිළිබඳ තීරණගැනීමට ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුවට අවශ්‍ය සහාය ලබාදෙයි. මීට අමතරව, ජාතික අයවැය දෙපාර්තමේන්තුව මගින් අදාළ ඇගයීමවල නිරීක්ෂණ සැලකිල්ලට ගනිමින් සංවර්ධන ව්‍යාපෘති හා වැඩසටහන් සඳහා ප්‍රතිපාදන වෙන්කිරීම සම්බන්ධව තීරණ ගනු ඇත. මෙය ඇගයීම් විෂය ආයතනගතකිරීමත් ජාතික ඇගයීම් මෙහෙයුම් කමිටුවේ අනුමැතියලත් ඇගයීම් යෝජනා සඳහා අයවැය ප්‍රතිපාදන සැලසීමත් තහවුරුකිරීම උදෙසා ගනු ලබන පියවරකි.

4. ජාතික ඇගයීම් මෙහෙයුම් කමිටුවේ නිත්‍ය සාමාජිකයකු (නිළ බලයෙන්) වශයෙන් **ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව** සැලසුම්කරණයේදී ඇගයීම් වල නිරීක්ෂණ උපයෝගී කරගන්නාබව තහවුරුකිරීම උදෙසා ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව සමඟ මනා සම්බන්ධීකරණයකින් යුතුව කටයුතු කරනු ලබයි. මීට අමතරව, ජාතික ඇගයීම් සැලසුම් (වාර්ෂික හා මධ්‍යකාලීන) සකස්කිරීමේ දී අවසන් තීරණගැනීම සඳහාත් ඇගයීම් විෂය ආයතනගතකිරීම තහවුරුකිරීමට අවශ්‍ය ඇගයීම් ධාරිතා වර්ධන උපායමාර්ග හඳුනාගැනීම සඳහාත් ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව මගින් ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුවට අවශ්‍ය තාක්ෂණික සහාය ලබාදෙනු ඇත.

5. ජාතික ඇගයීම් ප්‍රතිපත්තිය ක්‍රියාත්මකකිරීමේදී **ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව** මගින් පහත සඳහන් කාර්යභාරය ඉටුකරනු ලබයි.

i. ජාතික ඇගයීම් මෙහෙයුම් කමිටුවේ නිත්‍ය සාමාජික (නිළබලයෙන්) ලෙස;

ii. ජාතික ඇගයීම් මෙහෙයුම් කමිටුවේ ලේකම් කාර්යාලය ලෙස සහ;

iii. රාජ්‍ය අංශය තුළ ඇගයීම ආයතනගතකිරීම සඳහා වූ ජාතික කේන්ද්‍රස්ථානය ලෙස.

**ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයන් හා වගකීම් වන්නේ:**

i. ජාතික ඇගයීම් මෙහෙයුම් කමිටුවට තාක්ෂණික සහාය සලසන ලේකම් කාර්යාලය ලෙස කටයුතුකිරීම;

ii. ඇගයීම් ක්‍රියාත්මක කරන ආයතන මගින් ඉදිරිපත් කරනු ලබන ඇගයීම සඳහා වූ යෝජනා සමාලෝචනය කර තෝරාගැනීම සහ; අදාළ ක්‍රියාත්මකකිරීමේ ආයතන, මුදල් අමාත්‍යාංශයට අයත් අදාළ දෙපාර්තමේන්තු සහ වෙනත් ආයතන සමඟ සාකච්ඡාකිරීමෙන් අනතුරුව ජාතික ඇගයීම් සැලසුම් සකස්කිරීම;

iii. ජාතික ඇගයීම් සැලසුම් ක්‍රියාත්මකකිරීම සඳහා ජාතික ඇගයීම් මෙහෙයුම් කමිටුවේ අනුමැතිය ලබාගැනීම;

iv. ජාතික ඇගයීම් මෙහෙයුම් කමිටුවේ තීරණ හා නිර්දේශිත පසු විපරම් කටයුතු ක්‍රියාත්මකකිරීම අධීක්ෂණය;

v. ජාතික ඇගයීම් ප්‍රතිපත්තිය ක්‍රියාත්මකකිරීමට අදාළ සියලු ක්‍රියාකාරකම් සම්බන්ධීකරණය, ඒ සඳහා පහසුකම් සැලසීම සහ මගපෙන්වීම;

vi. ඇගයීම්වල ගුණාත්මකභාවය තහවුරුකිරීම සඳහා පිළිපැදිය යුතු ආචාරධර්ම, ප්‍රමිති සහ මාර්ගෝපදේශ සකස්කිරීම හා යාවත්කාලීනකිරීම සහ ඇගයීම් ක්‍රියාවලියේදී භාවිතා කළයුතු යාවත්කාලීන කරන ලද මෙවලම්, මාර්ගෝපදේශ සහ ආකෘති සැපයීම;

vii. රාජ්‍ය අංශය කෙරෙහි විශේෂ අවධානය යොමුකරමින් ඇගයීම් ධාරිතා වර්ධනය සඳහා නායකත්වය හා මගපෙන්වීම ලබාදෙමින් එම ධාරිතා වර්ධන කටයුතු අඛණ්ඩව ක්‍රියාත්මකකිරීම;

viii. රාජ්‍ය ආයතන මගින් ක්‍රියාත්මක කරනු ලබන ඇගයීම් සඳහා අවශ්‍ය තාක්ෂණික සහාය ලබාදීම;

ix. බාහිර ඇගයුම්කරුවන් හා එක්ව තෝරාගන්නා ලද ඇගයීම් සිදුකිරීම;

x. ක්‍රියාත්මක තත්වයේ පවතින ඇගයීම් අධීක්ෂණය කර ඒවායේ ප්‍රගතිය ජාතික ඇගයීම් මෙහෙයුම් කමිටුවට වාර්තාකිරීම;

xi. නිමකරන ලද ඇගයීම්වලට අදාළ නිර්දේශ ලබාගැනීම සඳහාත් එම තොරතුරු බෙදැහැරීමට අනුමැතිය ලබාගැනීම සඳහාත් ඇගයීම් තුළින් අනාවරණය වූ කරුණු ජාතික ඇගයීම් මෙහෙයුම් කමිටුව වෙත වාර්ෂිකව වාර්තාකිරීම;

xii. ජාතික ඇගයීම් මෙහෙයුම් කමිටුව මගින් අනුමත කරන ලද ඇගයීම් පිළිබඳ තොරතුරු බෙදාහැරීම සඳහා ඇගයීම් තොරතුරු පද්ධතියක් පවත්වාගෙන යාම;

xiii. ඇගයීම් ආශ්‍රයෙන් එළිදක්වන ලද තොරතුරු සැලසුම්කරණයේදී හා තීරණ ගැනීමේදී උපයෝගී කරගන්නා ලද මට්ටම තක්සේරු කර ජාතික ඇගයීම් මෙහෙයුම් කමිටුව වෙත වාර්තා කිරීම සහ;

xiv. ජාතික ඇගයීම් ප්‍රතිපත්තිය සමාලෝචනය කර යාවත්කාලීන කිරීම.

6. **මුදල් විෂයය භාර අමාත්‍යාංශය,** ජාතික ඇගයීම් මෙහෙයුම් කමිටුවේ සභාපතිත්වය උසුලන අතර, අවශ්‍ය අවස්ථාවල දී අමාත්‍ය මණ්ඩලය වෙත සෘජුවම වාර්තා ඉදිරිපත් කරනු ලබයි. මීට අමතරව, ඇගයීම් ආශ්‍රිත පහත සඳහන් කාර්යයන් ද මුදල් අමාත්‍යාංශය විසින් සිදුකරනු ලබයි:

i. ඇගයීම්වල ගුණාත්මකභාවය තහවුරු කිරීමට අවශ්‍ය ආචාරධර්ම, ප්‍රමිති සහ මාර්ගෝපදේශ පිළිබඳ උපදෙස් ලබාදීම;

ii. ජාතික ඇගයීම් මෙහෙයුම් කමිටුව විසින් සිදුකරන නිර්දේශ මත පදනම්ව (i) ජාතික ඇගයීම් සැලසුම් සහ (ii) ඇගයීම්වල අනාවරණයන්, නිර්දේශ හා උගත් පාඩම් ආදී තොරතුරු බෙදාහැරීම සඳහා (අවශ්‍ය අවස්ථාවලදී පමණක්) අමාත්‍ය මණ්ඩල අනුමැතියට ඉදිරිපත් කිරීම;

iii. ජාතික ඇගයීම් මෙහෙයුම් කමිටුවවේ කාර්යයන්, එහි ලේකම් කාර්යාලය වශයෙන් කටයුතු කරන ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව හරහා සංවිධානයකිරීම.

7. **ජාතික ඇගයීම් මෙහෙයුම් කමිටුවෙහි** මුලසුන දරනු ලබන්නේ මුදල් අමාත්‍යාංශයේ ලේකම් විසින් වන අතර එම කමිටුවෙහි සංයුතිය පහත පරිදි වේ:

i. ජාතික ක්‍රමසම්පාදන, විදේශ සම්පත්, ජාතික අයවැය, රාජ්‍ය ව්‍යාපාර සහ ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ යන දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් (නිත්‍ය සාමාජිකයන්)

ii. මුදල් කොමිෂන් සභාවේ ලේකම් (නිත්‍ය සාමාජික)

iii. පළාත් සභා, පළාත් පාලන සහ දිස්ත්‍රික් පරිපාලනය යන විෂයයන් භාර අමාත්‍යාංශවල ලේකම්වරුන් (නිත්‍ය සාමාජිකයන්)

iv. ජනාධිපති ලේකම් කාර්යාලය හා අග්‍රාමාත්‍ය කාර්යාලය නියෝජනය කරන ජ්‍යෙෂ්ඨ නියෝජිතයන් (නිත්‍ය සාමාජිකයන්)

v. රේඛීය අමාත්‍යාංශ ලේකම්වරුන් (ආරාධිත)

vi. ජාතික විගණන කාර්යාලයේ ජ්‍යෙෂ්ඨ නියෝජිතයන් (නිරීක්ෂක)

- ජාතික ඇගයීම් මෙහෙයුම් කමිටුවෙහි රැස්වීම් න්‍යාය පත්‍රයෙහි ඇතුළත් සාකච්ඡා සඳහා කරුණු ඉදිරිපත් කිරීමෙන් සහාය වියහැකි, අදාළ ඕනෑම දෙපාර්තමේන්තුවක්, රාජ්‍ය ව්‍යාපාරයක්, පළාත් සභාවක්, දිස්ත්‍රික් පරිපාලන ආයතනයක් හෝ වෙනත් ඕනෑම ආයතනයක්, වෘත්තීයමය ආයතනයක් හෝ සංවිධානයක් සඳහා සිදුකරනු ලබන කැඳවීමක් අනුව එම ආයතනයට එම නිශ්චිත රැස්වීමේ දී ජාතික ඇගයීම් මෙහෙයුම් කමිටුවෙහි සාමාජිකත්වය හිමිවේ.

- ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව ජාතික ඇගයීම් මෙහෙයුම් කමිටුවෙහි ලේකම් කාර්යාලය වශයෙන් කටයුතු කරනු ලබයි.

### ජාතික ඇගයීම් මෙහෙයුම් කමිටුවෙහි ප්‍රධාන කාර්යයන්

i. අදාළ ක්‍රියාත්මක කිරීමේ ආයතනයන්හි අදහස් විමසීමෙන් අනතුරුව ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව මගින් සකස්කරන ජාතික ඇගයීම් සැලසුම් සමාලෝචනය කර අවශ්‍ය සංශෝධන පිළිබඳ නිර්දේශද සහිතව අනුමත කිරීම.

ii. ජාතික ඇගයීම් සැලසුම් ක්‍රියාත්මකකිරීමේ ප්‍රගතිය සමාලෝචනයකිරීම.

iii. ඇගයීම්වලින් අනාවරණය වන තොරතුරු සමාලෝචනයකර අවශ්‍ය නිර්දේශ ඉදිරිපත්කිරීම.

iv. ඇගයීම්වලින් අනාවරණය වන තොරතුරුවල සංවේදීතාවය සහ වැදගත්කම සැලකිල්ලට භාජනයකර ඒවා අතුරින් සුදුසු තොරතුරු බෙදාහැරීම සඳහා තීරණගැනීම.

v. ඇගයීම්වලට අදාළ කළමනාකරණ ප්‍රතිචාර සහ අදාළ පාර්ශවයන් එම ප්‍රතිචාර මත පදනම්ව සිදුකරනලද පසු ක්‍රියාකාරකම් සමාලෝචනයකිරීම.

vi. ඇගයීම් ධාරිතා වර්ධනය, ක්‍රමසම්පාදනයේදී හා අයවැය සැකසීමේදී ඇගයීම් තොරතුරු උපයෝගී කරගැනීම, තීරණගන්නා පාර්ශවයන් වෙත ඇගයීම් තොරතුරු දැනුම්දීම සඳහා වූ ඵලදායී උපායමාර්ග පිළිබඳ මගපෙන්වීම හා උපදේශණය තුළින් රාජ්‍ය අංශය තුළ ඇගයීම ආයතනගතකිරීම සඳහා දිරිගැන්වීම.

vii. ඇගයීම් ක්‍රියාත්මක කරන අතරතුර ඇගයීම් ධාරිතා වර්ධනය දිරිගැන්වීම සඳහාත් රාජ්‍ය අංශය තුළ ඇගයීම භාවිතයේ යෙදීම සදහාත් මාර්ගෝපදේශ, මෙවලම් හා ප්‍රමිති අනුමතකිරීම.

vii. ඇගයීම හා සම්බන්ධ ඕනෑම සැලැස්මක්, වැඩසටහනක් හෝ තොරතුරක් අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත්කිරීම සඳහා (අවශ්‍යතාව මත පදනම්ව) නිර්දේශකිරීම.

# පරිච්ඡේද අංක - 3

# ඇගයීම් ක්‍රියාත්මකකිරීමේ වාර්ෂික න්‍යායපත්‍රය

# ඇගයීම් ක්‍රියාත්මකකිරීමේ වාර්ෂික න්‍යායපත්‍රය

ශ්‍රී ලංකාවේ ජාතික ඇගයීම් ප්‍රතිපත්තියේ අරමුණ වන්නේ විවිධ සංවර්ධනය මූලාරම්භයන් හරහා පුරවැසියන් වෙත මුදාහරින ප්‍රතිලාභවල ඵලදායීත්වය හා තිරසාරභාවය තහවුරුකිරීම උදෙසා එම කාර්යයන් සැලසුම්කරණය, ක්‍රියාත්මකකිරීම හා අධීක්ෂණය වැඩිදියුණු කර ශක්තිමත්කිරීම සඳහා රටතුල ඇගයීම ප්‍රචලිත කිරීමයි. එබැවින්, ඇගයීම නිතිපතා සිදුකරන කාර්යයක් ලෙස පාර්ශවකරුවන් අතර ප්‍රවර්ධනය කරනු ලබන අතර, ඇගයීම් ක්‍රියාත්මකකිරීමේ වාර්ෂික න්‍යායපත්‍රය මගින් රටෙහි සංවර්ධන ක්‍රියාදාමය තුල ක්‍රියාකාරීව නියැලී සිටින පාර්ශවකරුවන් හට ඔවුන් විසින් තෝරාගන්නා ලද ඇගයීම් වසර මුළුල්ලේම සිදුකිරීමට අවස්ථාව සලසනු ඇත.

මෙම වාර්ෂික න්‍යායපත්‍රය මගින්, ශ්‍රී ලංකාවේ රාජ්‍ය අංශය මගින් සිදුකිරීමට අපේක්ෂිත අඛණ්ඩ ඇගයීම් ක්‍රියාවලිය සවිස්තරාත්මකව පැහැදිලි කර ඇත.

| න්‍යායපත්‍ර අයිතමය | ප්‍රධාන ක්‍රියාකාරකම් | කාල රාමුව | වගකීම |
|---|---|---|---|
| 01. වාර්ෂික ඇගයීම් යෝජනා කැඳවීම | එළඹෙන මූල්‍ය වර්ෂය තුළ ඇගයීම් සිදුකිරීම සඳහා රේඛීය අමාත්‍යාංශ සහ පළාත් සභා වලින් යෝජනා කැඳවීම ("ඇගයීම් කැඳවීම")<br><br>[ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව මගින් සෘජුවම හෝ ඇගයීම් ක්ෂේත්‍රයේ නියැලී සිටින වෘත්තිකයන් හෝ විශේෂඥයන් හරහා (අවශ්‍ය මාර්ගෝපදේශ, ආකෘතිපත්‍ර, ආදර්ශ හා තාක්ෂණික සහාය ලබාදීම මගින්) සවිස්තරාත්මක ඇගයීම් යෝජනා සකස් කිරීම සඳහා අමාත්‍යාංශ හා පළාත් සභා වෙත පහසුකම් සලසනු ඇත.] | ජනවාරි (1 දින සිට 15 දින දක්වා) | ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව |
| 02. ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ | i. රේඛීය අමාත්‍යාංශ සහ පළාත් සභා යටතේ පවතින ආයතන විසින් අභ්‍යන්තර අනුමැතිය ලබාගැනීම සඳහා ඇගයීම් යෝජනා සකස්කර අදාළ අමාත්‍යාංශ සහ පළාත්සභා වෙත යොමු කිරීම. | ජනවාරි -පෙබරවාරි (ජන. 16 - පෙබ. 07) | රේඛීය අමාත්‍යාංශ, පළාත් සභා සහ රේඛීය අමාත්‍යාංශ හා පළාත් සභා යටතේ පවතින |
| | ii. රේඛීය අමාත්‍යාංශ සහ පළාත් සභා වෙත ඉදිරිපත් වූ ඇගයීම් යෝජනා අතුරින් සුදුසු යෝජනා සීමිත ප්‍රමාණයක ලැයිස්තුවක් සකස් කර ඒවා සඳහා අදාළ අමාත්‍යාංශ ලේකම්වරයා සහ පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගේ අනුමැතිය ලබාදීම. | පෙබරවාරි (8 දින සිට 15 දින දක්වා) | රේඛීය අමාත්‍යාංශ, පළාත් සභා |
| | iii. අදාළ රේඛීය අමාත්‍යාංශ සහ පළාත් සභා මගින් තෝරාගත් ඇගයීම් යෝජනා අවශ්‍ය උපකාරක තොරතුරුද සමග ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීම. | පෙබරවාරි (16 දින සිට 20 දින දක්වා) | රේඛීය අමාත්‍යාංශ, පළාත් සභා |
| 03. ඇගයීම් යෝජනා සමාලෝචනය කර ජාතික ඇගයීම් මෙහෙයුම් කමිටුව වෙත ඉදිරිපත් කිරීම | i. රේඛීය අමාත්‍යාංශ සහ පළාත් සභා මගින් ඉදිරිපත් කරන සියළු ඇගයීම් යෝජනා ඒවායේ නිරවද්‍යතාව, අදාළත්වය හා ප්‍රමාණවත් තොරතුරු ඇතළත් කර සකස් කර ඇති බව තහවුරු කිරීම සඳහා ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව මගින් (ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව, ජාතික අයවැය දෙපාර්තමේන්තුව හා මුදල් කොමිෂන් සභාව සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව) සමාලෝචනය කර, සුදුසු යෝජනා තෝරාගැනීම සඳහා හඳුනාගත් උපමාන භාවිතා කර වඩාත් සුදුසු යෝජනා සීමිත ගණනක් තෝරා ගැනීම.<br><br>ii. ඇගයීම සඳහා ප්‍රමුඛතාව ලබා දිය යුතු යෝජනා සහ අයෝග්‍ය බවට නිර්ණය කරන ලද යෝජනා ලැයිස්තුවක් ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව මගින් ජාතික ඇගයීම් මෙහෙයුම් කමිටුව වෙත ඉදිරිපත් කිරීම. | පෙබරවාරි 21 දින සිට මාර්තු 10 දින දක්වා | ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව |
| 04. ජාතික ඇගයීම් මෙහෙයුම් කමිටුව මගින් ඇගයීම් යෝජනා සමාලෝචනය හා අනුමැතිය | i. ජාතික ඇගයීම් මෙහෙයුම් කමිටුව වෙත ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව මගින් ඉදිරිපත් කරන ලද ඇගයීම් යෝජනා සියල්ල එම කමිටුව මගින් විශේෂ උපමාන කිහිපයක් භාවිතාකරමින් තක්සේරුකර, එළඹෙන මුදල් වර්ෂය තුළ ක්‍රියාත්මකකිරීම සඳහා සීමිත ඇගයීම් ලැයිස්තුවක් නිර්දේශ කිරීම.<br><br>ii. ජාතික ඇගයීම් මෙහෙයුම් කමිටුව මගින්, ඇගයීම් යෝජනා වැඩිදියුණුකර හෝ සංශෝධනයකර නැවත එම කමිටුව වෙත ඉදිරිපත් කිරීමට හෝ අඩුපාඩු සහිත යෝජනා තවදුරටත් සලකාබැලීම සඳහා කැඳවනු ලබන වැඩිමනත් තොරතුරු ලබාදීමට නිර්දේශ කළවිට ඒ සඳහා අදාළ ආයතනවලට අවශ්‍ය කාලදිගු ලබාදීම.<br><br>iii. සියලු සුදුසුකම් සපුරා ඇති ඇගයීම් යෝජනා අනුමත කර, අනුමැතිය ලත් යෝජනා මෙන්ම තෝරාගැනීම සඳහා යෝග්‍ය නොවූ යෝජනාද ලැයිස්තුගත කර අදාළ ක්‍රියාත්මක කිරීමේ ආයතන වෙත දැනුම්දීම. | මාර්තු 11 දින සිට 31 දින දක්වා | ජාතික ඇගයීම් මෙහෙයුම් කමිටුව |

| න්‍යායපත්‍ර අයිතමය | ප්‍රධාන ක්‍රියාකාරකම් | කාල රාමුව | වගකීම |
|---|---|---|---|
| 05. අනුමත වූ ඇගයීම් සඳහා අයවැය ප්‍රතිපාදන සැලසීම | i. එළඹෙන මුදල් වර්ෂය තුළ ක්‍රියාත්මකකිරීම සඳහා අනුමත වූ ඇගයීම් ක්‍රියාත්මකකිරීම සඳහා, අදාළ ආයතන විසින් ප්‍රතිපාදන ඉල්ලුම්කිරීම (සාමාන්‍ය අයවැය ක්‍රමවේදය තුළ) | ජනවාරි - දෙසැම්බර් | රේඛීය අමාත්‍යාංශ, පළාත් සභා |
| | ii. අනුමතවූ ඇගයීම් එකඟ වූ කාල රාමුව තුළ සිදුකිරීම සඳහා රේඛීය අමාත්‍යාංශ, පළාත් සභා මගින් සිදුකරන පූර්ව සූදානම් කටයුතු අධීක්ෂණය කිරීම හා ඒ පිළිබඳව ජාතික ඇගයීම් මෙහෙයුම් කමිටුව වෙත වාර්තා කිරීම. | ජනවාරි - දෙසැම්බර් | ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව |
| 06. ඇගයීම් ක්‍රියාත්මක කිරීම | ඇගයීම් ක්‍රියාත්මකකිරීම | අප්‍රේල් මස සිට | අදාළ ක්‍රියාත්මක කිරීමේ ආයතන (අනුමත වූ යෝජනාවල සඳහන් වූ පරිදි) |
| 07. ඇගයීම්වලින් අනාවරණය වූ කරුණු, ඒවායේ නිර්දේශ හා උගත් පාඩම් වාර්තාකරණය, අනුමැතිය සහ බෙදාහැරීම (ජාතික ඇගයීම් ප්‍රතිපත්ති රාමුව ක්‍රියාත්මක කිරීම ආරම්භවී 2 වැනි වසරේ සිට) | i. නිමකරන ලද ඇගයීම්වල වාර්තා ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත්කිරීම. | දෙසැම්බර් - ජනවාරි | රේඛීය අමාත්‍යාංශ, පළාත් සභා |
| | ii. ඇගයීම්වලින් අනාවරණය වූ කරුණු, ඒවායේ නිර්දේශ හා උගත් පාඩම් සමාලෝචනයකිරීම. | දෙසැම්බර් - ජූනි | ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව |
| | iii. සියලු ඇගයීම්වලින් අනාවරණය වූ කරුණු, ඒවායේ නිර්දේශ හා උගත් පාඩම්වල සාරාංශයක් ජාතික ඇගයීම් මෙහෙයුම් කමිටුව වෙත ඉදිරිපත්කිරීම. | ජනවාරි සහ ජූනි (වසරකට දෙවරක්) | ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව |
| | iv. ඇගයීම්වලින් අනාවරණය වූ කරුණු, ඒවායේ නිර්දේශ හා උගත් පාඩම්වල සංවේදීබව සහ ප්‍රයෝජනවත් බව සැලකිල්ලට ගනිමින් ඒවා අදාළ පාර්ශවකරුවන්ගේ ප්‍රයෝජනය සඳහා බෙදාහැරීමට ජාතික ඇගයීම් මෙහෙයුම් කමිටුවේ අනුමැතිය ලබාදීම. | මාර්තු සහ අගෝස්තු (වසරකට දෙවරක්) | ජාතික ඇගයීම් මෙහෙයුම් කමිටුව |
| | v. ඇගයීම් තොරතුරු අදාළ ආයතන අතර බෙදාහැරීම හා අවශ්‍ය වෙනත් පියවරගැනීම. | මාර්තු සහ අගෝස්තු (වසරකට දෙවරක්) | මුදල් අමාත්‍යාංශය |
| | vi අනුමත වූ පරිදි අදාළ නිර්දේශ අනුව ක්‍රියාමාර්ග ගන්නාබව තහවුරුකිරීම සඳහා අධීක්ෂණය | ජනවාරි - දෙසැම්බර් | ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව සහ වෙනත් අදාළ ආයතනන (* පසුවිපරම් ක්‍රියාකාරකම්වල ස්වභාවය මත රඳාපවතී) |

# ඇගයීම් ක්‍රියාත්මකකිරීමේ කාර්යප්‍රවාහය

ක්‍රමානුකූලව ඇගයීම් ක්‍රියාත්මකකිරීම සඳහාත් අවසන් ඇගයීම් වාර්තාවෙහි පරිපූර්ණභාවය තහවුරුකිරීම සඳහාත් අදාළ ආයතන මගින් වාර්ෂික ඇගයීම් න්‍යාය පත්‍රයෙහි කාලරාමුවට අනුගතවෙමින් ඇගයීම් ක්‍රියාවලියෙහි ප්‍රධාන ක්‍රියාකාරකම් අනුක්‍රමිකව නිමකළ යුතුය.

ඇගයීම් සඳහා යෝජනා ඉදිරිපත් කරන ආයතන (රේඛීය අමාත්‍යාංශ, පළාත් සභා සහ අනෙකුත් ක්‍රියාත්මකකිරීමේ ආයතන) විසින් සිදුකළ යුතු ක්‍රියාකාරකම්වල අනුපිළිවෙල සහ ජාතික මට්ටමේදී නිර්දේශ ලබාදීමට හා අනුමැතිය ලබාදීමට බලයලත් ආයතන (ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව හා ජාතික ඇගයීම් මෙහෙයුම් කමිටුව) පිළිබඳව ඇගයීම් ක්‍රියාවලියෙහි කාර්යප්‍රවාහය මගින් පැහැදිළිකර ඇත. අනුමත කරන ලද සියළුම ඇගයීම් නියත වශයෙන්ම වාර්ෂික ඇගයීම් න්‍යායපත්‍රට අනුකූලව සිදුකිරීම හා වාර්තාකිරීම සඳහා අදාළ සියළු ආයතන අතර මනා සම්බන්ධීකරණයක් හා අදහස් විමසීමේ ක්‍රියාවලියක් පැවතීම ඉතා වැදගත්ය.

ඇගයීම් ක්‍රියාවලියෙහි ප්‍රධාන ක්‍රියාකාරකම්වල අනුපිළිවෙල සහ සෑම ක්‍රියාකාරකමක්ම නිමකිරීම සඳහා වගකීම දරන ආයතනය පහත වගුවෙහි දක්වා ඇත.

| අනුක්‍රමය | ප්‍රධාන ක්‍රියාකාරකම | වගකීම දරණ ආයතනය |
|---|---|---|
| 1 | ඇගයීමේ හැකියාව තක්සේරු කිරීම | රේඛීය අමාත්‍යාංශය/ පළාත් සභාව<br>(අදාළ ක්‍රියාත්මක කිරීමේ ආයතන සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව) |
| 2 | ඇගයීම් තෝරාගැනීම හා ප්‍රමුඛතාව හඳුනාගැනීම | |
| 3 | පාර්ශවකරුවන් විශ්ලේෂණය | |
| 4 | සුදුසු ඇගයීම් විධි තීරණය කිරීම | |
| 5 | පිරිවැය ඇස්තමේන්තු සහ ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම | |
| 6 | ආයතනික මට්ටිමේ (අභ්‍යන්තර) අනුමැතිය සඳහා සංකල්ප පත්‍රිකාව සැකසීම | |
| 7 | ඇගයීම් කළමනාකරණ කණ්ඩායම සහ නිර්දේශ කණ්ඩායම පත් කිරීම | |
| 8 | ඇගයීමේ යොමුකිරීමේ අනුදේශ (Terms of Reference - ToR) සකස් කිරීම | |
| 9 | ඇගයීම් යෝජනාව සකස් කිරීම | |
| 10 | ඇගයීම් යෝජනා සමාලෝචනය | පළමු පියවර - ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව (ජාතික අයවැය, ජාතික ක්‍රමසම්පාදන හා විදේශ සම්පත් දෙපාර්තමේන්තු සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව)<br><br>දෙවැනි පියවර - ජාතික ඇගයීම් මෙහෙයුම් කමිටුව |
| 11 | ඇගයීම් යෝජනා තෝරා ගැනීම | ජාතික ඇගයීම් මෙහෙයුම් කමිටුව (ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව) |
| 12 | තෝරාගත් ඇගයීම් යෝජනා අනුමත කිරීම | ජාතික ඇගයීම් මෙහෙයුම් කමිටුව |
| 13 | ඇගයුම්කරු/ ඇගයුම් කණ්ඩායම තෝරා ගැනීම | ඇගයීම් කළමනාකරණ කණ්ඩායමෙහි මගපෙන්වීම යටතේ, ක්‍රියාත්මක කිරීමේ ආයතනය (ඇගයීම් කමිටුව මගින්) |
| 14 | දත්ත රැස්කිරීම හා විශ්ලේෂණය | |
| 15 | ඇගයීමෙහි ගුණාත්මක බව තක්සේරු කිරීම | ඇගයීම් කළමනාකරණ කණ්ඩායම |
| 16 | අවසන් ඇගයීම් වාර්තාව සකස් කිරීම | ඇගයීම් කළමනාකරණ කණ්ඩායමෙහි මගපෙන්වීම යටතේ, ක්‍රියාත්මක කිරීමේ ආයතනය (ඇගයීම් කමිටුව මගින්) |
| 17 | අවසන් ඇගයීම් වාර්තාව සමාලෝචනය කිරීම හා අනුමත කිරීම | ජාතික ඇගයීම් මෙහෙයුම් කමිටුව |
| 18 | ජාතික ඇගයීම් මෙහෙයුම් කමිටුවෙහි උපදෙස්වලට අනුකූලව ඇගයීම් වාර්තා බෙදාහැරීම | ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව (මුදල් අමාත්‍යාංශයෙහි අනුමැතිය සහිතව) |
| 19 | කළමනාකරණ ප්‍රතිචාර සහ ඒවාට අනුකූලව පියවර (පසු ක්‍රියාකාරකම්) ගැනීම | ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව සහ අනෙකුත් වගකිව යුතු ආයතන* (* අදාළ පසු ක්‍රියාකාරකම්වල ස්වභාවය මත රඳා පවතී.) |

ඇගයීම් ක්‍රියාත්මක කිරීමේදී සිදුකරන කාර්යයන්හි අනුක්‍රමික ප්‍රවාහය පහත සටහන මගින් දක්වා ඇත:



# පරිච්ඡේද අංක - 4

# ඇගයීම් ක්‍රියාත්මකකිරීම සඳහා මාර්ගෝපදේශ

# ඇගයීම් ක්‍රියාත්මකකිරීම සඳහා මාර්ගෝපදේශ

ඇගයීම් ක්‍රියාත්මක කිරීම සඳහා වූ මාර්ගෝපදේශ මගින් ඇගයීම් ක්‍රියාවලියේ විවිධ අවධීන්හිදී අනුගමනය කළයුතු ප්‍රධාන පියවර පිළිබඳව උපදෙස් ලබාදීම අපේක්ෂා කරන අතර, එක් එක් පියවර ව්‍යාකූලතාවකින් තොරව ක්‍රියාත්මක කිරීමට ප්‍රයෝජනවත් වන මෙවලම්, ආකෘති පත්‍ර සහ ආදර්ශ හඳුන්වා දෙයි.

| ඇගයීමේ අවධිය | අනුගමනය කළයුතු ප්‍රධාන පියවර |
|---|---|
| සැලසුම් කිරීම | 1. ඇගයීමේ හැකියාව තක්සේරු කිරීම |
| | 2. තෝරා ගැනීම සහ ප්‍රමුඛතා අනුව පෙළගැසීම |
| | 3. ඇගයීම් වර්ගය, ප්‍රවේශය සහ උපමාන තීරණය කිරීම |
| | 4. පාර්ශවකරුවන් විශ්ලේෂණය |
| සූදානම් වීම | 1. පාලක කණ්ඩායම හා ආශ්‍රේය /නිර්දේශක කණ්ඩායම පත්කිරීම |
| | 2. අයවැය සහ ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම |
| | 3. ඇගයීමේ යොමුකිරීමේ අනුදේශ (ToR) සකස් කිරීම |
| | 4. ඇගයීම් කණ්ඩායම/ ඇගයුම්කරු තෝරා ගැනීම |
| ක්‍රියාත්මක කිරීම | 1. ආරම්භක වාර්තාව (Inception report) |
| | 2. දත්ත රැස්කිරීම |
| | 3. දත්ත විශලේෂණය සහ අතුරු/කෙටුම්පත් වාර්තාව |
| | 4. ඇගයීම් ක්‍රියාවලියේ ගුණාත්මක බව තක්සේරු කිරීම |
| වාර්තා කිරීම | 1. කෙටුම්පත් වාර්තාව පාර්ශවකරුවන් විසින් සමාලෝචනය සහ ප්‍රතිපෝශණය |
| | 2. ගවැඩිදියුනු කරන ලද කෙටුම්පත් වාර්තාවේ ගුණාත්මක බව තක්සේරු කිරීම |
| | 3. අවසන් වාර්තාව සකස් කිරීම |
| | 4. වාර්තාව බෙදාහැරීම |
| භාවිතය හා පසු විපරම | 1. කළමනාකරණ ප්‍රතිචාර පිළිබඳව කටයුතු කිරීම |

ආයතනික මට්ටමින් ඇගයීම් ක්‍රියාත්මකකිරීමේ දී අනුගමනය කළයුතු මාර්ගෝපදේශ 16 ක් ද, ජාතික මට්ටමින් එම කාර්යභාරය ඉටුකිරීමේ දී අනුගමනය කළයුතු මාර්ගෝපදේශ 02 ක් ද මෙම පරිච්ජේදය තුළ අන්තර්ගතය.

## I. ඇගයීම් සැලසුම්කිරීම සහ මූලික කටයුතු සිදුකිරීම සඳහා මාර්ගෝපදේශ

### මාර්ගෝපදේශ - 1: ඇගයීම් තෝරාගැනීම සහ ප්‍රමුඛතාව තීරණය කිරීම

ඇගයීම් සඳහා යෙදවියහැකි සම්පත් සීමිතව පවතින තත්වයක් තුළ, ඇගයීමට යෝජිත සංවර්ධන මැදිහත්වීම්* රැසක් අතුරින් ඉහළ ශක්‍යතාවයකින් යුත් යෝජනා තෝරාගැනීම අභියෝගාත්මක අභ්‍යාසයකි. එබැවින් තෝරාගැනීමේ දී සැලකිල්ලට භාජනය කළ හැකි අංග රැසක් ආවරණය වන උපමාන මගින් මෙම අභියෝගය සාධාරණ ලෙස ජයගැනීමට සහායවනු ඇත. (*මෙම ප්‍රතිපත්ති රාමුව තුළ සංවර්ධන මැදිහත්වීමක් යන්නෙන් අදහස්කරන්නේ ඇගයීම සඳහා තෝරාගන්නාලද සංවර්ධන ව්‍යාපෘතියක්, වැඩසටහනක්, ප්‍රතිපත්තියක් හෝ ආයතනයකි.)

***ඇගයීම් තෝරාගැනීම සහ ප්‍රමුඛතාව තීරණයකිරීම සඳහා ඇමුණුම - 1 පරිශීලනය කරන්න.***

- යෝජිත ඇගයීම/ඇගයීම්, ඒවා තෝරාගැනීම සහ ප්‍රමුඛතාව තීරණයකිරීම සඳහා සලකාබැලියයුතු උපමාන බහුතරයක් සපුරාලන්නේදැයි පරීක්ෂාකිරීම සඳහා අදාළ රේඛීය අමාත්‍යාංශ හා පළාත් සභා (හෝ රේඛීය අමාත්‍යාංශ හා පළාත් සභා යටතේ ක්‍රියාත්මක වන ආයතන) විසින් ඇගයීම් තෝරාගැනීම සහ ප්‍රමුඛතාව තීරණයකිරීම සඳහා වූ මෙවලම අධාරකරගත යුතු ය.
- සැලසුම් අවධියේ ප්‍රථම පියවර වශයෙන්; යෝජිත ඇගයීම් අතුරින් වඩාත් වැදගත් යෝජනාව තෝරාගැනීම සඳහා; අදාළ සංවර්ධන මැදිහත්වීම් වලට ප්‍රමාණවත් ලෙස සම්බන්ධ වූ හා ඒවා පිළිබඳව දැනුවත් නිලධාරීන් කණ්ඩායමක් මගින් අභ්‍යන්තරිකව (ආයතනය තුළ) සහ ඉහළ මට්ටමේ අපක්ෂපාතීත්වයකින් යුතුව යෝජිත ඇගයීම් තක්සේරු කළ යුතුය.
- ඇගයීම සඳහා යෝජිත සංවර්ධන මැදිහත්වීම යම් උපමානයක් සමග පූර්ණ වශයෙන් සැසඳෙනවිට ඒ සඳහා ලබාදියහැකි උපරිම ලකුණු ප්‍රමාණය ද, අදාළ උපමානය තුළ සලකා බලනු ලබන කරුණු සමග එම සංවර්ධන මැදිහත්වීම දුර්වල/අසතුටුදායක සබැඳියාවක් පවතීනම් අවම ලකුණු ප්‍රමාණයද ලබාදිය යුතුය.

- සුදුසු ඇගයීම් යෝජනා ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව හරහා ජාතික ඇගයීම් මෙහෙයුම් කමිටුව වෙත ඉදිරිපත් කිරීමටත්, එම කමිටුවේ නිර්දේශ සමඟ අමාත්‍ය මණ්ඩලය වෙත යොමුකිරීමටත්, අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබාදෙන ඇගයීම් යෝජනා ඉදිරි මුදල් වර්ෂය තුළ ක්‍රියාත්මකකිරීම සඳහා ඇගයීම් න්‍යාය පත්‍රයට ඇතුළත්කිරීමටත් යෝග්‍යවීමට නම්, ආයතනික මට්ටමින් සිදුකරන මූලික තේරීමේදී ඇගයීම සඳහා යෝජිත සංවර්ධන මැදිහත්වීම්වලට අවම වශයෙන් මුළු ලකුණු ප්‍රමාණයෙන් 60% ක් ලැබිය යුතු ය.

- මීට අමතර වශයෙන්, ජාතික ප්‍රමුඛතාවයක්සේ සලකා රජයේ අවශ්‍යතාවයක් මත යෝජනා වන ඇගයීම් පුමුඛතාවයදී ක්‍රියාත්මක කළ යුතුය.

**මාර්ගෝපදේශ - 2: ඇගයීමේ හැකියාව තක්සේරුකිරීම**

ඇගයීමේ හැකියාව තක්සේරුකිරීම යනු, යම් සංවර්ධන මැදිහත්වීමක් විශවාසනීයත්වය රැකෙන අයුරින් ඇගයීමට ලක්කිරීමේ හැකියාව පිළිබඳව විධිමත් ප්‍රවේශයක් ඔස්සේ සිදුකරන පරීක්ෂාවයි. ජාතික ඇගයීම් මෙහෙයුම් කමිටුවේ අනුමැතිය අපේක්ෂාවෙන් විධිමත් ඇගයීම් යෝජනා ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත්කිරීමට පෙර, ඇගයීම් ක්‍රියාත්මකකිරීමේ අභිමතය සහිත රාජ්‍ය ආයතන විසින් එම ඇගයීම් සිදුකිරීමට ඇති හැකියාව තක්සේරු කළ යුතුය.

යම් ඇගයීමක් ක්‍රියාත්මකකිරීමේ හැකියාව නිර්ණයකිරීමටත්, ඇගයීමට හැකියාවක් පවතී නම් ඒ සඳහා පිරිසැලසුම් සැකසීමටත් අදාළ ව්‍යාපෘතිය, වැඩසටහන, ප්‍රතිපත්තිය හෝ ආයතනයෙහි පහත සඳහන් අංශ පරීක්ෂාවට ලක්කළයුතු ය.

i. තෝරාගන්නා ලද සංවර්ධන මැදිහත්වීමට අදාළ වෙනස්වීමේ න්‍යාය හෝ තර්ක රාමුව

ii. ඇගයීම සඳහා අදාළ වන ප්‍රධාන තොරතුරු සපයා ගතහැකි බව (විශේෂයෙන්ම, කාර්යසාධනය නිර්ණය සඳහා විධිමත්ව රැස්කරන ලද අධීක්ෂණ දත්ත)

iii. ඇගයීම සිදුකරන සංදර්භයෙහි වූ හිතකරභාවය

ඇගයීමේ හැකියාව පිළිබඳව වඩා යහපත් තීන්දුවකට එළඹීම සඳහා, ඉහත සඳහන් ප්‍රධාන ක්ෂේත්‍ර 03 හි තත්වය විසතාරණය කර පෙන්වීමට ප්‍රශ්ණාවලියකට පිළිතුරු ලබාදිය යුතුය.

***ඇගයීමේ හැකියාව තක්සේරු කිරීමේ මෙවළම සඳහා ඇමුණුම II පරිශීලනය කරන්න.***

**මාර්ගෝපදේශ - 3: ඇගයීම් විධිය තෝරාගැනීම**

ඇගයීම් සිදුකිරීම සම්බන්ධව තීරණ ගනු ලබන සියලුම මට්ටම් වලදී ශ්‍රී ලංකාවේ සංදර්භය සඳහා මනාලෙස ගැලපෙන ඇගයීම් විධි පිළිබඳ ප්‍රමාණවත් අවබෝධයක් තිබීම වැදගත් වේ.

පහත සඳහන් කරුණු සැලකිල්ලට ගනිමින් වඩාත් සුදුසු ඇගයීම් විධිය තීරණයකිරීම සඳහා මග පෙන්වන **ඇමුණුම - III පරිශීලනය කරන්න.**

i. ඇගයීමෙහි පරමාර්ථය
ii. තෝරාගන්නා ලද සංවර්ධන මැදිහත්වීමෙහි ක්‍රියාකාරී අවධිය
iii. ඇගයීමතුළින් අනාවරණයවන කරුණු භාවිතාකිරීමට අපේක්ෂිත ආකාරය

**මාර්ගෝපදේශ - 4: ඇගයීම් ප්‍රවේශය තෝරාගැනීම**

ඇගයීම්වල අපක්ෂපාතීත්වය, විනිවිදභාවය සහ වෘත්තීයමයභාවය පවත්වා ගැනීමේ අරමුණින්, ඇගයීම් ක්‍රියාත්මකකිරීමේ ආයතනය තුළින් ඉන් බාහිරවත් පවතින දැනුම, විශේෂඥභාවය සහ සම්පත් සැලකිල්ලට ගනිමින් ඇගයීමෙහි ප්‍රවේශය තීරණය කළයුතුය. ඇගයීම් කළමනාකරණය හා ක්‍රියාත්මකකිරීමට අවශ්‍ය කුසලතා සහ විශේෂඥ දැනුම රාජ්‍ය අංශයේ ආයතන, සංවර්ධන හවුල්කාර ආයතන, ශාස්ත්‍රඥයන් සහ පෞද්ගලික අංශයේ වෘත්තිමය ඇගයුම්කරුවන් අතර විවිධ මට්ටම්වලින් පවතින අතර, වාර්ෂික අයවැය ඇස්තමේන්තු හරහා ඇගයීම් සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන වෙන්කර නොමැත.

මෙම තත්වය, දේශියව සපයාගත හැකි සම්පත් සාධාරණ පිරිවැයක් යොදවා උපයෝගීකර ගනිමින් තාර්කික හා විද්‍යාත්මක තීර්ණ ගැනීමට දායක වියහැකි විශ්වාසනීය හා ගුණාත්මක බවින් උසස් ඇගයුම් තොරතුරු සම්පාදනය සඳහා පහත සඳහන් ප්‍රවේශයන් අතුරින් වඩාත් යෝග්‍ය ප්‍රවේශය තෝරාගැනීමේ අවශ්‍යතාවය තහවුරු කරයි.

1. ස්වාධීන (බාහිරස්ථ) ඇගයීම
2. ස්වයං (අභ්‍යන්තරික) ඇගයීම
3. ඒකාබද්ධ ඇගයීම
4. සහභාගීත්ව ඇගයීම

ශ්‍රී ලංකාවේ සංදර්භය තුළ ක්‍රියාත්මක කිරීමට සුදුසු ඇගයීම් ප්‍රවේශයන් පිළිබඳව පුමාණාත්මක අවබෝධයක් ලබාගැනීම සඳහා ***ඇමුණුම - IV පරිශීලනය කරන්න.***

**මාර්ගෝපදේශ - 5: ඇගයීම් උපමාන**

ඇගයීම් උපමාන මගින් ඇගයීමෙහි පරමාර්ථය සහ අරමුණුත්, ජාතික, කළාපීය සහ ගෝලීය මට්ටමේ සමාජ, ආර්ථික සහ පාරිසරික ප්‍රමුඛතාවයන් සමඟ එම ඇගයීමෙහි පවතින සමෝධානයත් පිළිබිඹුකළ යුතුය. එක් එක් උපමානය, ඇගයීමට භාජනය කරනු ලබන විෂයය (ව්‍යාපෘතිය, වැඩසටහන, ප්‍රතිපත්තිය, ආයතනය) විවිධ කෝණයන්ගෙන් පරීක්ෂාවට ලක් කිරීමට ප්‍රමාණවත් අන්දමේ ශක්තිමත් භාවයකින් යුක්තවිය යුතුය.

අදාළත්වය, ඵලදායිත්වය, කාර්යක්ෂමතාවය, බලපෑම සහ තිරසාරත්වය යන ඇගයීම් උපමාන 1991 දී මුලින්ම හඳුන්වා දෙන ලද්දේ ආර්ථික සංවර්ධනය හා සහයෝගිතාව සඳහා වූ සංවිධානය/සංවර්ධන සහායක කමිටුව (OECD/DAC) මගින් වන අතර 2019 දී සංවර්ධන ඇගයීම සඳහා වූ OECD/DAC ජාලය හෙවත් EvalNet මගින් එම උපමාන නැවත අධ්‍යයනය කර ඉහත උපමාන 05 ට අමතරව 'ගැළපීම' යන උපමානයද ඇතුලත්කොට එම උපමාන වැඩිදියුණු කරන ලදී.

ශ්‍රී ලංකාව තුළ සිදුකරන ඇගයීම් සඳහා මෙම සංශෝධිත OECD/DAC උපමාන් නිර්දේශිතයි. ප්‍රධාන පාර්ශවකරුවන්ගේ එකඟතාවය ඇතිව, ඇගයීමේ පරමාර්ථය සහ අරමුණුවලට යෝග්‍ය අමතර උපමානද භාවිතා කළ හැකිය.

***ඇගයීම සඳහා වූ OECD/ DAC උපමාන සඳහා ඇමුණුම - V පරිශීලනය කරන්න.***

**මාර්ගෝපදේශ - 6: පාර්ශවකරුවන් විශ්ලේෂණය**

පාර්ශවකරුවන් විශ්ලේෂණය යනු ඇගයීමක් කළමනාකරණය කිරීම සඳහා එහි පාර්ශවකරුවන් හඳුනාගැනීම සහ ඔවුන්ගේ වැදගත්කම තක්සේරුකිරීම සඳහා වූ ක්‍රමානුකූල ප්‍රවේශයකි. යෝජිත ඇගයීම කෙරෙහි විවිධ පාර්ශවකාර කණ්ඩායම් හා පුද්ගලයන්ගේ කැමැත්ත හා බලපෑම අවබෝධ කරගැනීම සඳහා මෙම අභ්‍යාසය උපකාර වේ. සියළු පාර්ශවකරුවන් තුළ සම තත්වයේ කැමැත්තක් මෙන්ම සම මට්ටමේ බලපෑමක් සිදුකිරීමේ හැකියාවක් නොපවතින අතර එසේ වීමට හේතුවන්නේ තෝරාගන්නාලද සංවර්ධන මැදිහත්වීම සැලසුම්කිරීම, එහි පිරිසැකසුම් සෑදීම සහ එය ක්‍රියාත්මක කිරීම යන අවස්ථාවලදී ඔවුන්ගේ සහභාගීත්වය විවිධ මට්ටම්වලින් පැවතීම සහ එමගින් භුක්ති විඳීමට ලැබෙන ප්‍රතිලාභවල ස්වභාවයේ විවිධත්වය නිසාය. ඇගයීම් සිදුකරන අවස්ථාවේදී පාර්වකරුවන්ගෙන් ඇතිවන ඍණාත්මක බලපෑම් සහ ප්‍රතිරෝධයන් අවම කරගැනීම සඳහා ඕනෑම ඇගයීමක් සැලසුම් කරන අවධියේදීම අදාළ සියලු පාර්ශවකරුවන්ගේ සම්පූර්ණ තොරතුරු ඇතළත් ලැයිස්තුවක් සකස්කළ යුතුය.

පාර්ශවකරුවන් විශ්ලේෂණයේ දී පහත සඳහන් පියවර අනුගමනයකළ යුතුය.

**i.** **පාර්ශවකරුවන් හඳුනාගැනීම :** ඇගයීම සඳහා තෝරාගත් සංවර්ධන මැදිහත්වීමෙහි ජීවනචක්‍රයේ සියළු අවධීන්හිදී සම්බන්ධ වූ පාර්ශවකරුවන් හඳුනාගෙන ඔවුන් ක්‍රමසම්පාදකයින්, ක්‍රියාත්මක කරන ආයතන හා ඒවායේ කාර්ය මණ්ඩල, අධීක්ෂණය සිදුකළ ආයතන, මූල්‍ය දායකත්වය දැක්වූ පාර්ශව, ප්‍රතිලාභීන් හා පීඩාවට පත් ජනතාව, ක්‍රියාත්මක අවධියේදී සහයෝගය දැක්වූ මෙන්ම ක්‍රියාකාරීව සම්බන්ධවීමට කැමැත්තක් දැක්වූ දේශපාලකයින් හා ප්‍රජා නායකයින්, ඇගයීම තුළින් අනාවරණය කරන තොරතුරු ප්‍රයෝජනයට ගැනීමේ නැඹුරුතාවක් සහිත පුද්ගලයන් ආදී වශයෙන් කාණ්ඩවලට වෙන්කිරීම.

**ii.** **එක් එක් පාර්ශවකරුවා විසින් ඇතිකළහැකි බලපෑමෙහි වැදගත්කම සහ ඇගයීම් ක්‍රියාවලිය තුළ පාර්ශවකරුවන්ගේ භූමිකා හා වගකීම් හඳුනාගැනීම:** සෑම පාර්ශවකරුවකුම ඇගයීම් අභ්‍යාසයේ ක්‍රියාකාරීව සහභාගිවන්නකු වශයෙන් පිළිගැනීම අවශ්‍ය නොවූවත්, ඇගයීම සැලසුම් කිරීමේදීත් එය ක්‍රියාවට නැංවීමේදීත් ඔවුන්ගේ අපේක්ෂාවන් හා අදහස්වලට ගරුකිරීම අත්‍යාවශ්‍යය. වෘත්තීයමය ඇගයීමක් සිදුකිරීමට උපයෝගී කරගත හැකි, පාර්ශවකරුවන් තුළ පවතින හැකියාවන් හා ප්‍රවීණතාවන් පිළිබඳ ලුහුඬු තක්සේරුවක් සිදුකිරීම මෙම අවධියේ දී සිදුකළ හැක.

**iii.** **ඇගයීමේ විවිධ අවධීන්වලදී පාර්ශවකරුවන්ගේ උපරිම සහයෝගය ලබාගැනීම සඳහා උපායමාර්ග සකස්කිරීම හා ඇගයීම් ක්‍රියාවලියට සහභාගිවීම සඳහා ඔවුන්ගේ එකගතාව ලබාගැනීම:** ඇගයීම සඳහා වැදගත් වන සියළු පාර්ශවකරුවන්ගේ සහයෝගය ලබාගැනීම සඳහා ලඝුඬු දැනුවත්කිරීමක් සහ උපදේශාත්මක සාකච්ඡාවක් සිදු කළයුතු අතර, ගැටුම් සහ අනවශ්‍ය ප්‍රමාදයන් අවමවන අයුරින් ප්‍රශස්ත මට්ටමින් ඔවුන්ගේ සහභාගීත්වය ලබාගත යුතු ආකාරය හඳුනාගත යුතුය.

***පාර්ශවකරුවන් විශ්ලේෂණ මෙවලම සඳහා ඇමුණුම - VI පරිශීලනය කරන්න.***

## II. ඇගයීම් ක්‍රියාත්මක කිරීම සඳහා මාර්ගෝපදේශ

**මාර්ගෝපදේශ - 7: කළමනාකරණ කණ්ඩායම ස්ථාපනයකිරීම**

ඇගයීමේ ප්‍රාරම්භක අවධියේදී එනම්; පාර්ශවකරුවන් විශ්ලේෂණයට පසුව හා ඇගයීම් ක්‍රියාවලිය සැලසුම්කිරීමට පෙර, කළමනාකරණ කණ්ඩායමක් පිහිටුවාගත යුතුය.

- කළමනාකරණ කණ්ඩායමේ ප්‍රධාන වගකීම් වන්නේ, ඇගයීම් ක්‍රියාවලිය, එහි ගුණාත්මකභාවය, නියමිත කාලය තුළ ක්‍රියාත්මකවේද යන්නත් ඇගයුමෙහි නිරවද්‍යතාවය පිළිබඳවත් අධීක්ෂණය සහ; ඇගයීම ක්‍රියාත්මකකිරීමේදී පැනනගින ගැටළු මැඩපැවැත්වීම සඳහා අවශ්‍ය අවස්ථාවලදී අවශ්‍ය අයුරින් මැදිහත්වීම සහ පහසුකම් සැලසීම.

- ඇගයීම සිදුකරන ආයතනයේ ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය, අදාළ සංවර්ධන මැදිහත්වීම ක්‍රියාත්මකකිරීමට සහාය වූ ආයතනවල නියෝජිතයන්, අදාළ අධීක්ෂණ හා ඇගයීම් නිලධාරීන්, එම සංවර්ධන මැදිහත්වීම ක්‍රියාත්මක කිරීම, එහි පරිපාලන කටයුතු හා සුපරීක්ෂාව ආදිය සඳහා සෘජුව මැදිහත්වූ කාර්යය මණ්ඩලය හඳුනාගෙන එම පිරිසෙන් කළමනාකරණ කණ්ඩායම පත්කරගත යුතුය.

- කළමනාකරණ කණ්ඩායමේ සාමාජික සංඛ්‍යාව පරිපාලනමය ප්‍රමාදයන් ඇති නොවන පරිදි කටයුතු කිරීමට පහසු සංඛ්‍යාවක් වියයුතුය (උපරිම සාමාජිකයින් ගණන 10 කි.),

**කළමනාකරණ කණ්ඩායමේ කාර්යයන්:**

- ඇගයීම්වල පුළුබතා, පරමාර්ථ, අරමුණු සහ උපායමාර්ගික එල්ලය නිර්ණයකිරීම සඳහා උපදෙස් ලබාදීම.

- විශ්වාසනීය හා ශක්තිමත් ඇගයීම් ක්‍රියාවලියක් ගොඩනැංවීම සඳහා සහායවීම හා ඇගයීම් ප්‍රවේශයන්හි අනුරූපතාවය පිළිබඳව අදහස් දැක්වීම.

- ඇගයීමේ (ToR), ප්‍රශ්ණාවලිය හා ඇගයීමෙහි ක්‍රියාකාරී සැලැස්ම සමාලෝචනය කර ප්‍රතිපෝශණය කිරීම.

- ඇගයීම් කණ්ඩායමේ/ඇගයුම්කරුගේ සුදුසුකම් පිළිබඳව උපදෙස් ලබාදීම/ ප්‍රතිපෝශණය කිරීම.

- ඇගයීමෙහි ආරම්භක වාර්තාව, කෙටුම්පත් වාර්තාව, ඇගයීමෙන් හිරාවරණය වූ කරුණු හා නිර්දේශ, ඇගයීම් තොරතුරු බෙදාහැරීම හා සන්නිවේදන උපායමාර්ග ආදිය පිළිබඳව ලිඛිත හෝ වාචික ප්‍රතිපෝශණය.

- ඇගයීමෙහි ගුණාත්මකභාවය තහවුරු කිරීම.

- අවශ්‍ය පරිදි තීරණගැනීම හා ගැටළු නිරාකරණය.

- ඇගයීම් කළමනාකරු (ඇගයුමෙහි සමස්ත සම්බන්ධීකරණය සඳහා නම් කරන ලද නිලධාරියෙක්) විසින් කළමනාකරණ කණ්ඩායමෙහි යොමුකිරීමේ අනුදේශ (ToR) කළමනාකරණ කණ්ඩායමෙහි සාමාජිකයින්හට ලබාදිය යුතුය.

***කළමනාකරණ කණ්ඩායමෙහි විෂය ක්ෂේත්‍රය හා සීමාවන් :ඇගයීමේ යොමුකිරීමේ අනුදේශ (ToR) සකස්කිරීම සඳහා ඇමුණුම - VII හි වූ ආදර්ශය පරිශීලනය කරන්න.***

**මාර්ගෝපදේශ - 8: ඇගයීම් නිර්දේශක කණ්ඩායම ස්ථාපනය කිරීම**

- ඇගයීම් නිර්දේශක කණ්ඩායම යනු ඇගයීමෙහි ගුණාත්මකභාවය වැඩි දියුණුකිරීම සඳහා අමතර දැනුම හා තාක්ෂණික චින්තනයෙන් දායකවන ප්‍රධාන පාර්ශවකරුවන්ගෙන් සැදුම්ලත් උපදේශක කණ්ඩායමකි. මෙම කණ්ඩායමෙහි සාමාජිකයින් විසින් ඇගයීම සඳහා තෝරාගන්නාලද සංවර්ධන මැදිහත්වීම සැලසුම්කිරීමේදී හෝ ක්‍රියාත්මක කිරීමේදී ප්‍රධාන භූමිකාවක්දරා තිබිය යුතු ය; එසේ නොමැතිනම් ඇගයීම් විෂයයෙහි ප්‍රවීණත්වයක් ඔවුන් සතුවිය යුතුය.

- ඇගයීමේ ප්‍රාරම්භක අවධියේදී ම, එනම් පාර්ශවකරුවන් විශ්ලේෂණය නිම වූ පසුව ඇගයීම් නිර්දේශක කණ්ඩායම පත්කළ යුතුය.

- ඇගයීම් නිර්දේශක කණ්ඩායමෙහි සාමාජිකයින් ගණන කළමනාකරණයකිරීමට පහසු මෙන්ම ඵලදායීව කටයුතු කළහැකි සංඛ්‍යාවක් වියයුතුය (උපරිම සාමාජික සංඛ්‍යාව 10 - 12 අතර වියයුතුය).

- ඇගයීම් නිර්දේශක කණ්ඩායම ඇගයීම සිදුකරන ආයතනය (හෝ ඇගයීම් කළමනාකරු) සමඟ සමීපව කටයුතු කරන අතර, ඇගයීමේ යොමුකිරීමේ අනුදේශ (ToR), ඇගයීමෙහි ආරම්භක වාර්තාව (Inception report), ප්‍රශ්නාවලිය, ඇගයීමේදී අනාවරණය වු කරුණු හා ඇගයීම් කෙටුම්පත් වාර්තාව ආදිය සඳහා කරුණු (දත්ත, තොරතුරු, දැනුම ආදිය) ලබාදීම හා එම ලේඛණ ප්‍රතිපෝෂණය කිරීම සිදුකරයි.

- ඇගයීම් නිර්දේශක කණ්ඩායම ඇගයීමෙහි කළමනාකරණ කටයුතු සඳහා සම්බන්ධ නොවේ; එහෙත් ප්‍රධාන ඇගයීම් කණ්ඩායමෙහි ප්‍රායෝගික හා තාක්ෂණික හැකියාවන් ඌණපූරණයකර දෙන සංචිතයක් වශයෙන් ක්‍රියා කරයි.

- ඇගයීම් කළමනාකරු විසින් ඇගයීම් නිර්දේශක කණ්ඩායම සඳහා වූ ඇගයීමේ යොමුකිරීමේ අනුදේශ (ToR) ලබාදිය යුතුය.

**ඇගයීම් නිර්දේශක කණ්ඩායමෙහි කාර්යයන්:**

- ඇගයීම් කණ්ඩායමට අවශ්‍ය අමතර විද්‍යාත්මක හා තාක්ෂණික ප්‍රවීණතාවන් ඌණපූරණය කිරීම.

- ඇගයීමේ යොමුකිරීමේ අනුදේශ (ToR), ඇගයීමෙහි ආරම්භක වාර්තාව (Inception report), ප්‍රශ්නාවලිය, ඇගයීමේදී අනාවරණය වු කරුණු හා ඇගයීම් කෙටුම්පත් වාර්තාව පිළිබඳ ස්වාධීන අදහස් හුවමාරු කර ගැනීම.

- ඇගයීමේදී රැස්කරන ලද තොරතුරුවල පවතින අඩුලුහුඩුකම් සහ දෝෂ සහගත නිර්වචනයන් හඳුනාගැනීම සහ දැනුම්දීම.

- ඇගයීම සඳහා පාර්ශවකරුවන්ගේ සහභාගීත්වය ලබාගැනීමට පහසුකම් සැලසීම.

- ඇගයීම්වලින් අනාවරණය වූ කරුණු බෙදාහැරීම හා ඒවා භාවිතයට ගැනීම සඳහා සහායවීම.

***ඇගයීම් නිර්දේශක කණ්ඩායමෙහි ඇගයීමේ යොමුකිරීමේ අනුදේශ (ToR) සැකසීම සඳහා ඇමුණුම - VIII හි වූ ආදර්ශය පරිශීලනය කරන්න.***

**.මාර්ගෝපදේශ - 9: ඇගයීම් සැලැස්ම සකස්කිරීම**

ඇගයීමෙහි එක එක් අදියරට අදාළ ක්‍රියාකාරකම් හා උපක්‍රියාකාරකම් ඒවායේ පිරිවැයද ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කාලරාමුවද සමඟ හඳුනාගත යුතුය.

ක්‍රියාකාරකම් හා උපක්‍රියාකාරකම්වලට අදාළ ප්‍රධාන කාර්යසාධන දර්ශක (KPIs) හඳුනාගැනීම අත්‍යාවශ්‍ය ය; මෙමගින් අධීක්ෂණය කළයුතු ප්‍රධාන ක්‍රියාකාරකම් හඳුනාගැනීමටත් වැදගත් නොවන ක්‍රියාකාරකම් (උදා: පරිපාලන හෝ කළමනාකරණය ආශ්‍රිත ක්‍රියාකාරකම් හෝ වැදගත් නොවන ක්‍රියාවලි හිමැවුම්) ක්‍රියාකාරී සැලැස්මෙන් ඉවත්කිරීමටත් උපකාරී වේ.

මෙම සමස්ත අභ්‍යාසයෙහි කාර්යභාරය පැවරීම හා බෙදාදීම සඳහාත්, අධීක්ෂණයේ පහසුව සඳහාත්, එක් එක් ක්‍රියාකාරකම හා උපක්‍රියාකාරකම ක්‍රියාත්මකකිරීමේ වගකීම දරන පාර්ශවයන් හඳුනාගැනීම අත්‍යාවශ්‍ය ය.

***ඇගයීම් සැලැස්ම සකස්කිරීම සඳහා ඇමුණුම - IX හි වූ ආදර්ශය පරිශීලනය කරන්න.***

**මාර්ගෝපදේශ - 10: ඇගයීම සඳහා අයවැය සකස්කිරීම**

යථාර්තවත් අයුරින් අයවැය සකස්කිරීම, සාර්ථකව හා සුමට අයුරින් ඇගයීම ක්‍රියාත්මකකිරීම සඳහා උපකාරී වන ප්‍රධාන සාධකයකි. ඇගයීම සඳහා අයවැය සකස්කිරීමේදී පහත සඳහන් ප්‍රධාන ක්ෂේත්‍රයන් කෙරෙහි අවධානය යොමුකළ යුතුවේ.

1. **ඇගයීමේ විෂය පථය:** පාර්ශවකරුවන් සමඟ සාකච්ඡා පැවැත්වීම හා දත්ත රැස්කිරීම ආශ්‍රිත ක්ෂේත්‍ර ක්‍රියාකාරකම් මෙහිදී සැලකිල්ලට භාජනය කළයුතු ප්‍රධාන සාධකයකි. ඍජු නිරීක්ෂණයන් සඳහා සිදුකළයුතු ක්ෂේත්‍ර චාරිකා සංඛ්‍යාව සහ ප්‍රවාහන හා නවාතැන් පහසුකම්වල ස්වභාවය අනුවද ක්ෂේත්‍ර ක්‍රියාකාරකම්වල පිරිවැය තීරණය වේ. සාම්පලයේ විශාලත්වය (ප්‍රතිලාභී ජනගහනය) සහ ක්ෂේත්‍රයේ දී තොරතුරු සම්පාදනය කරන්නන් සමඟ සන්නිවේදනය සිදුකරන ආකාරය අනුවද (නිවසින් නිවසට යමින් තොරතුරු රැස්කිරීම, රැස්වීම්, මාර්ගගත සාකච්ඡා ආදියෙහි අවශ්‍යතාව අනුව) දත්ත රැස්කිරීම සඳහා වූ පිරිවැය තීරණය වේ. යථාර්තවත් ඇස්තමේන්තුවක් සකස්කිරීම සඳහා, දත්ත වර්ග හා ඒවා රැස්කරන ආකාරය මෙන්ම දත්ත විශ්ලේෂණය හා අර්ථ විවරණය සඳහා අවශ්‍ය ශිල්පීය ප්‍රවීණත්වයේ ස්වභාවය හා ඒ සඳහා ගතවන කාලයද සලකා බැලිය යුතුය. දත්ත විශ්ලේෂණය දී උසස් තාක්ෂණයෙන් වැඩිදියුණු කරන ලද සංඛ්‍යාන ක්‍රම උපයෝගී කරගැනීම සඳහා ශිල්පීය ප්‍රවීණත්වය උපයෝගිකරගතයුතු බැවින් එවිට ඇගයීමෙහි පිරිවැය ඉහළ යයි.

2. **ඇගයීම් ප්‍රවේශය:** ඇගයීමෙහි විෂයපථය හා ස්වභාවය අනුව බාහිර ඇගයුම්කරුවන්ගේ සේවය ලබාගැනීම සඳහා දැරීමට සිදුවන පිරිවැය විචල්‍ය වේ. කොන්ත්‍රාත් පදනම යටතේ බාහිර ඇගයුම්කරුවකුගේ සේවය ලබාගැනීම සඳහා ගෙවියයුතු මුදල නියමානුකූලව ඇස්තමේන්තුගතකිරීම ඉතා වැදගත් ය. ස්වයං ඇගයීම සඳහා අඩු පිරිවැයක් අවශ්‍ය වුවත්, ආයතනය තුළින් සපයාගතහැකි සම්පත් හා බාහිර පාර්ශවයන්ගෙන් මිළදී ගැනීමට හෝ කුළී පදනමින් ලබාගැනීමට සිදුවන සම්පත් වෙන් වශයෙන් හඳුනාගෙන මනාලෙස ඇස්තමේන්තු සකස් කිරීම වැදගත් වේ. ඒකාබද්ධ ඇගයීමක පිරිවැය ඇස්තමේන්තුවෙහි, එක් එක් හවුල්කාර

පාර්ශවයන්ගේ පිරිවැය දායකත්වය පැහැදිලිව සඳහන් විය යුතුය. ඒකාබද්ධ හා සහභාගීත්ව ඇගයීමකදී සන්නිවේදනය හා සම්බන්ධීකරණය සඳහා වැයවන මුදල ස්වයං ඇගයීමකදී ඒ සඳහා වැයවන මුදලට වඩා වැඩිය.

3. **වාර්තාකිරීමේ හා බෙදාහැරීමේ ක්‍රමවේද:** ඇගයීම තුලින් අනාවරණය වූ කරුණු ඇතුලත් කෙටුම්පත් වාර්තාව සකස්කිරීම, එය විචාරාත්මකව සමාලෝචනය කිරීම, ඇගයීමෙහි අනාවරණයන් වාර්තාකිරීම යන කටයුතු සඳහා වැයවන කාලය හා යෙදියයුතු පරිශ්‍රමය, එම ඇගයීමෙහි විෂයපථය, එහි පරමාර්ථය හා අරමුණු අනුව විචල්‍ය වේ.

ප්‍රධාන පිරිවැය අයිතමයන් පහත ලැයිස්තුගතකර ඇත:

i. ඇගයීම සැලසුම්කිරීම හා පූර්ව සූදානම
ii. දත්ත එක්රැස්කිරීම හා සටහන්කිරීම
iii. දත්ත විශ්ලේෂණය හා වාර්තාකිරීම
iv. මුද්‍රණය හා බෙදාහැරීම
v. සන්නිවේදනය හා රැස්වීම් පැවැත්වීම
vi. ප්‍රවාහනය හා ආශ්‍රිත සංවිධාන කටයුතු

**මාර්ගෝපදේශ -11: ඇගයීම් ප්‍රශ්නාවලිය සකස් කිරීම**

- ඇගයීම් ප්‍රශ්නාවලිය මගින් ඇගයීමෙහි අභිමතාර්ථය හා ඇගයීම් උපමාන අතර පවතින සම්බන්ධතාවය පැහැදිලිව පිළිබිඹු වියයුතුය.

- තෝරාගන්නා ලද සංවර්ධන මැදිහත්වීමට උචිත වන පරිදි, එක් එක් ඇගයීම් උපමානය යටතේ සුවිශේෂී ප්‍රශ්න කට්ටලයක් සකස් කළයුතුය. ඇගයීම් නිර්දේශක කණ්ඩායමෙහි සහාය ඇතිව ඇගයීමෙහි පරමාර්ථය ඍජුව හා පුළුල්ව ඉටුකිරීමට ප්‍රමාණවත් වන **ප්‍රධාන ඇගයීම් ප්‍රශ්න** 5-7 ප්‍රමාණයක් හඳුනාගත යුතුය **(ඇමුණුම - V)**. වැඩිමනත් තොරතුරු ලබාගැනීම සඳහා මෙම ප්‍රධාන ප්‍රශ්න විභේදනය කර සාමාන්‍ය ප්‍රශ්න රැසක් සකස්කළ යුතුය.

- ඇගයීම් ප්‍රශ්න සංඛ්‍යාව ඇගයීමෙහි විෂය පථය අනුව තීරණය වේ; ඇගයීම් නිර්දේශක කණ්ඩායම හා ඇගයීම් කළමනාකරණ කණ්ඩායම සමග සාකච්ඡා කර ප්‍රමාණවත් අවම ප්‍රශ්න සංඛ්‍යාවක් තෝරාගත යුතුය.

- **සංවෘත හා විවෘත ප්‍රශ්නවල** සංකලනය මනා ලෙස පවත්වාගැනීමෙන් ප්‍රමාණාත්මක හා ගුණාත්මක තොරතුරු ලබාගැනීම සඳහා ප්‍රශ්නාවලියෙහි ප්‍රබලතාවය වර්ධනය වේ.

- **සංවෘත ප්‍රශ්න** (i. ඔව්/නැත; ii. උසස්/මධ්‍යස්ථයට වඩා වැඩි/මධ්‍යස්ථ/සතුටුදායක/දුර්වල; iii. බලවත්ව එකගයි/එකගයි/එකග නැත/දැඩිව විරුද්ධයි/පිළිතුරු දිය නොහැක) නිර්දේශ කරනු ලබන්නේ පෙර සිට නිශ්චිත ඍජු පිළිතුරු ලබාගැනීම සඳහාත් පහසුවෙන්, වේගවත්ව හා අඩු වියදමකින් විශ්ලේෂණය කළහැකි දත්ත එක්රැස් කිරීම සඳහාත් ය. සංවෘත ප්‍රශ්න සඳහා තෝරාගත යුතු නිශ්චිත පිළිතුරු කල්තබාම ලබාදී ඇති බැවින්, පිළිතුරු ලබාදෙන්නන් වැඩිදෙනෙකුට තමන් සතු දැනුම ආශ්‍රයෙන් ඒවාට පිළිතුරු දියහැකි වුවද ඔවුන්හට වැඩිමනත් තොරතුරු සැපයීමට හෝ නිදහස් අදහස් පළකිරීම ඇති අවකාශය සීමිත වේ.

- **විවෘත ප්‍රශ්න** යෝග්‍ය වන්නේ කල් ඇතිව යෝජනාකරන ලද පිළිතුරු ඇසුරින් පාර්ශවකරුවන්ගේ ප්‍රතිචාර ලබාගත නොහැකි අවස්ථාවල සහ; විමසන කරුණ පිළිබඳව ප්‍රමාණවත් දැනුමක් හා හැදෑරීමක් සහිත පුද්ගලයින්ගෙන් සංකීර්ණ ගැටළු සම්බන්ධව තොරතුරු රැස්කිරීමටය. මෙම මාදිලියේ ප්‍රශ්න මගින් පිළිතුරු සපයන පුද්ගලයන්හට ඔවුන්ගේ අත්දැකීම්, දෘෂ්ඨීන් සහ අදහස් ඔවුන්ගේම වචන වලින් ප්‍රකාශ කිරීම සඳහා අවස්ථාව සලසයි. විවෘත ප්‍රශ්න හරහා ගුණාත්මක බවින් පොහොසත් දත්ත ලබාගත හැකි වුව ද, එම ප්‍රතිචාර ලබාගැනීම සඳහා මෙන්ම දත්ත විශ්ලේෂණය සඳහාද දිගු කාලයක් ගත වේ.

**ඇමුණුම- V - ඇගයීම සඳහා වූ OECD/DAC උපමාන** - එක් එක් ඇගයීම් උපමානය යටතේ ඇතුළත් කළහැකි ප්‍රධාන ප්‍රශ්න සඳහා මෙම ඇමුණුම පරිශීලනය කරන්න.

- ප්‍රශ්නාවලිය සකස් කිරීමේදී පහත සඳහන් පියවර අනුගමනය කළ යුතුය.

  i. ඇගයීම සඳහා තෝරාගන්නාලද සංවර්ධන මැදිහත්වීම සැලසුම්කිරීම, ක්‍රියාත්මකකිරීම හා අධීක්ෂණයේදී සම්බන්ධ වූ සියලු පාර්ශවකරුවන්ගෙන් දායකත්වය ලබාගැනීම (එසේ නොමැතිනම් කෙටුම්පත්කළ ප්‍රශ්නාවලිය ඔවුන් අතර බෙදාහැර එය වැඩිදියුණු කිරීම සඳහා දායකත්වය ලබාගැනීම).

  ii. තෝරාගත් සංවර්ධන මැදිහත්වීමෙහි සැලසුම්කරණය, අයවැය සකස්කිරීම, අධීක්ෂණය, ඇගයීම හා කළමනාකරණ තීරණ ආදිය ඇතුළත් ලේඛන සමාලෝචනය කිරීම.

  iii. ඇගයීමෙහි විෂයපථය, අරමුණු හා පරමාර්ථයන්ට ගැලපෙන පරිදි ප්‍රශ්නාවලිය සකස්කිරීම, ප්‍රශ්නවල ප්‍රමුඛතාව තීරණයකිරීම හා සියුම්ව ගැලපීම් සිදුකර ප්‍රශ්නාවලිය සැකසීම සඳහා සාකච්ඡා පැවැත්වීම හා බුද්ධිකළම්බනය (ඇගයීම් නිර්දේශක කණ්ඩායම හා ඇගයීම් කළමනාකරණ කණ්ඩායම සමග).

  iv. තොරතුරු රැස්කිරීමේ කටයුතු සැලසුම්කිරීම; ක්ෂේත්‍ර ක්‍රියාකාරකම් සඳහා සම්පත් වෙන්කිරීම සහ; ක්ෂේත්‍රයට නොයා සපයාගතහැකි ලේඛනගත සාක්ෂි ඇසුරින් පිළිතුරු දියහැකි ප්‍රශ්න හඳුනාගැනීමට සහායවීම පිණිස, විවිධ වර්ගයේ පාර්ශවකරුවන් හා කණ්ඩායම්වලට අදාළ වන පරිදි ප්‍රශ්නාවලියේ ප්‍රශ්න වෙන්කර හඳුනාගැනීම.

  v. ඇගයීමෙහි පරමාර්ථය ඉෂ්ඨකිරීම සඳහා අවශ්‍ය තොරතුරු එක්රැස් කිරීමට ප්‍රශ්ණාවලියෙහි ප්‍රබලතාව ප්‍රමාණවත්දැයි සත්‍යාපනය කිරීම.

  vi. යතාර්ථවත් කාලරාමුවක්, දත්ත මූලාශ්‍ර, ක්‍රියාකාරකම් අනුව විභජනයකළ පිරිවැය, සපිරිය යුතු ආචාරධර්ම (අදාළ වේ නම්), මානව සම්පත සහ අවශ්‍ය අනෙකුත් සම්පත් ඇතුළත්කර දත්ත රැස්කිරීමේ සැලැස්මක් සකස්කිරීම.

**මාර්ගෝපදේශ - 12: ඇගයීමෙහි යොමුකිරීමේ අනුදේශ (ToR)**

ඇගයීමෙහි යොමුකිරීමේ අනුදේශ යනු ඇගයීමෙහි පරමාර්ථ හා අරමුණු ලඟාකරගැනීම සඳහා එය ක්‍රියාත්මක කිරීමේදී ප්‍රමුඛත්වය ගන්නා ආයතනය විසින් හඳුනාගත් අපේක්ෂාවන් හා අවශ්‍යතාවන් ඇතුළත් සවිස්තරාත්මක සටහනයි. සවිස්තරාත්මක හා පරිපූර්ණ විෂය ක්ෂේත්‍රය සහ සීමාවන් සහිත ලේඛණයක් සකස්කිරීමත්, ඒ

අනුව ඇගයීම් සාර්ථකව ක්‍රියාත්මක කිරීමත් සඳහා ඇගයීමෙහි පාර්ශවකරුවන්ගේ අපේක්ෂාවන් හඳුනාගැනීමේ අරමුණින් ඔවුන් සමඟ පුළුල් සංවාදයක් පැවැත්වීම පූර්ව අවශ්‍යතාවකි.

මනාලෙස කරුණු ගලපා සකස් කරන ලද ඇගයීමෙහි යොමුකිරීමේ අනුදේශ තුළ ඇගයීමෙහි පරමාර්ථය, එය ක්‍රියාත්මක කරන ආකාරය, ඇගයීමෙන් අනාවරණය කරනු ලබන තොරතුරු භාවිතයට ගන්නා ආකාර සහ එම අනාවරණයන් හා නිර්දේශය පරිශීලනය කිරීමට බලාපොරොත්තුවන්නන් පිළිබඳ තොරතුරු ඇතුළත් විය යුතුය. ඇගයීමක අවසාන නිමැවුමෙහි ගුණාත්මකභාවය, අදාළත්වය, උපයෝගීතාවය විශාල වශයෙන් රඳාපවතින්නේ ඇගයීමෙහි යොමුකිරීමේ අනුදේශ සකස්කිරීම සඳහා ගතකරන කාලය හා ඒ සඳහා යොදන ඵලදායී ප්‍රයත්නයන් මත ය.

***ඇගයීමෙහි යොමුකිරීමේ අනුදේශ (ToR) සකස් කිරීමේදී ඇමුණුම - X හි වූ ආදර්ශය පරිශීලනය කරන්න.***

**මාර්ගෝපදේශ - 13: ඇගයුම්කරුවකු තෝරාගැනීම**

බාහිර ඇගයීමක් සඳහා ඇගයුම්කරුවකු (හෝ කණ්ඩායමක්) තෝරාගැනීම ඇගයීමක් සාර්ථකත්ව නිමකිරීම සඳහා අතිශයින්ම බලපාන තීරණාත්මක සාධකයයි.

- ශ්‍රී ලංකාවෙහි වර්තමාන සංදර්භය තුළ ඇගයුම් සිදුකිරීමේ විභවයක් සහිත ප්‍රමාණවත් ඇගයුම්කරුවන් පිරිසක් නොමැතිවීම නිසා ඉහළ ගුණාත්මකභාවයකින් යුත් ඇගයීම් සිදුකර ඇති ඇගයුම්කරුවන් හඳුනාගැනීම සඳහා අවිධිමත් ගවේශණයක් සිදුකිරීම උපකාරී වේ.

- බාහිර ඇගයුම්කරුවකු තෝරාගැනීමේ දී රජයේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කළ යුතුය. විදේශීය මූල්‍ය පහසුකම් උපයෝගී කරගනිමින් ක්‍රියාත්මක කරනු ලබන ඇගයීම් සඳහා එකඟ වූ ප්‍රසම්පාදන ක්‍රමවේදයක් අනුගමනය කළ යුතුය.

- තෝරාගන්නා ඇගයුම්කරු විසින් පහත සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතුය.

  i. ඇගයීම පිළිබඳ විධිමත් පුහුණුවක් ලබා තිබීම;

  ii. තෝරාගත් ඇගයීමෙහි විෂයපථය, ඇගයීම් විධිය සහ ප්‍රවේශයට අනුරූප වන පළපුරුද්ද;

  iii. අදාළ සංවර්ධන මැදිහත්වීම හා සමාන සංවර්ධන මැදිහත්වීම් හා එය අයත් අංශය (Sector) තුළ වෙනත් ඇගයීම් සිදුකරඇති බව;

  iv. දේශීයව හෝ කළාපීය වශයෙන් ලත් ඇගයීම් පිළිබඳ පළපුරුද්ද;

  v. යෝජිත ඇගයීම නියමිත කාලය තුළ නිමකිරීමට ඇති ධාරිතාව (දැනුම, කුශලතාව හා ශ්‍රම බලකාය);

  vi. අදාළ ප්‍රාදේශීය ජනතාව, අභ්‍යන්තර කාර්ය මණ්ඩලය සහ වෙනත් පාර්ශවකරුවන් සමඟ ඵලදායී අයුරින් අදහස් හුවමාරු කරගැනීමේ හැකියාව සහ;

  vii. ඇගයීම ක්‍රියාත්මක කිරීමට අදාළ වන ධාරිතාව නැංවීමේ සැලැස්මක් සහිත වීම.

**මාර්ගෝපදේශ - 14: ආරම්භක වාර්තාව (Inception Report) සකස්කිරීම**

අදාළ ලියකියවිලි මූලික සමාලෝචනයකින් අනතුරුව ඇගයුම්කරු (ඇගයුම් කණ්ඩායම) විසින් ඇගයීමට අදාළ ආරම්භක වාර්තාව සකස් කළයුතුය. ඇගයීම ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම ඇතුළත් ඇගයීම් න්‍යාසය සහ ඇගයීම් කළමනාකරු හරහා ඇගයුම්කරු අදාළ ඇගයීම සිදුකරන ආයතනය සමඟ කටයුතු කරනු ලබන ආකාරය මෙම වාර්තාවෙහි පැහැදිළිව සඳහන් විය යුතුයි.

***ඇගයීම් න්‍යාසයෙහි ආදර්ශය සඳහා ඇමුණුම - XI පරිශීලනය කරන්න.***
***ආරම්භක වාර්තාවෙහි ආදර්ශය සඳහා ඇමුණුම - XII පරිශීලනය කරන්න.***

**මාර්ගෝපදේශ - 15: ඇගයීම් වාර්තාව සකස් කිරීම**

දත්ත රැස්කිරීම හා විශ්ලේෂණය අවසන් කළ පසු ඇගයුම්කරු හෝ ඇගයුම් කණ්ඩායම විසින් ඇගයීම් වාර්තාවෙහි කෙටුම්පත සකස් කළ යුතුය.

අවසන් ඇගයුම් වාර්තාව සකස් කිරීමට පෙර, ඇගයීම් කළමනාකරණ කණ්ඩායම හා නිර්දේශක කණ්ඩායම මඟින් කෙටුම්පත් වාර්තාව සමාලෝචනය කළ යුතුය; මෙම කණ්ඩායම් දෙකෙහි සාමාජිකයින් විසින් කෙටුම්පතෙහි නිරවද්‍යතාවය හා විශ්වාසනීයත්වය තහවුරුකිරීම සඳහා, සංස්කරණය නොකළ දත්ත මෙන්ම විශ්ලේෂණයෙන් අනතුරුව සම්පිණ්ඩනය කරනලද දත්ත සමඟ කෙටුම්පතෙහි අන්තර්ගතය, නිර්දේශ සහ අනාවරණයන්ගේ අනුකූලතාවය පරීක්ෂා කරනු ඇත. එබැවින් සමස්ත ඇගයීම් ක්‍රියාවලිය නිමවනතුරු ඇගයුම්කරු විසින් සංස්කරණය නොකළ දත්ත සහ සම්පිණ්ඩනය කරන ලද දත්ත නිසි පිළිවෙලට පවත්වාගත යුතුය. අවසන් ඇගයුම් වාර්තාව සකස් කරනවිට කළමනාකරණ කණ්ඩායම හා නිර්දේශක කණ්ඩායම මඟින් කෙටුම්පත සඳහා නිර්දේශ කරනු ලබන වැඩිදියුණු කිරීම්, නිවැරදිකිරීම් හා සංශෝධන සුදුසු පරිදි සිදුකළ යුතුය.

අවසන් ඇගයුම් වාර්තාව සකස් කිරීමේදී සාක්ෂි මත පදනම්ව අනාවරණය කරගත් කරුණු, උගතහැකි පාඩම් හා නිර්දේශයන් තර්කානුකූලව ගොනු කළ යුතුය; ඇගයීමට භාජනය කළ සංවර්ධන මැදිහත්වීම දැනට ක්‍රියාත්මක කරන අයුරින්ම ඉදිරියටත් ක්‍රියාත්මකකිරීමට හෝ අවශ්‍ය නිවැරදි කිරීම් හෝ වෙනස්කිරීම් සහිතව ක්‍රියාත්මකකිරීමට තීරණගැනීම සඳහා උපයෝගී කරගත හැකි ප්‍රබල සාධාරණීකරණයක් මෙම වාර්තාව මඟින් ලබාදිය යුතුය.

ඇගයීම් වාර්තාවේ අන්තර්ගතයෙහි දිගු/කෙටි බව; භාෂාව (තාක්ෂණික පාරිභාෂික වචන වලින් තොරවීම) සහ; ඇගයීමෙහි අභිමතාර්ථය ඉටුකිරීමට දායක නොවන තොරතුරුවලින් තොරවීම යන ලක්ෂණ සහිතවීම මඟින් එම වාර්තාව පරිශීලනය කිරීමට පහසුවිය යුතුය.

***අවසන් ඇගයීම් වාර්තාව සකස් කිරීම සඳහා ඇමුණුම - XIII හි වූ ආදර්ශය පරිශීලනය කරන්න.***

**මාර්ගෝපදේශ - 16: ඇගයීමෙහි ගුණාත්මකභාවය තහවුරු කිරීම**

ඇගයීම්වල නිමැවුම්වල (අනාවරණය වූ කරුණු, නිර්දේශ හා උගත හැකි පාඩම්) විශ්වාසනීයත්වය හා ඒවායේ උපයෝගීතාවය තහවුරුකිරීමට ඉවහල් වන තීරණාත්මක සාධකය වන්නේ ඇගයීමෙහි ගුණාත්මකභාවයයි. එබැවින්, ඇගයීමක් අවසානයේ දී එහි ගුණාත්මකභාවය තක්සේරු කරනවිට ඉහළ ප්‍රමාණනයක් (Rating) ලබාගැනීමටත් එමගින් ඇගයීම් කෙරෙහි වූ පිළිගැනීම හා ඒවායේ උපයෝගීතාවය ඉහළ නැංවීමටත් සමස්ත ඇගයීම් ක්‍රියාවලිය පුරාම තත්ව පාලනය සඳහා කටයුතු කළ යුතුය. ඇගයීම් වෘත්තිකයින් හට ගුණාත්මක බවින් උසස් ඇගයීම් සිදුකිරීම සඳහා ඇගයීම් ප්‍රමිතීන් මගින් මගපෙන්වයි.

ඇගයීම් ප්‍රමිතීන්ට අනුරූප වන පරිදි සකස් කරන ලද තත්ව තක්සේරු උපමාන (Quality Assessment Criteria) පදනම් කරගනිමින් ඇගයීම් ප්‍රමාණනය කළ යුතුය. ***(ඇමුණුම - XIV පරිශීලනය කරන්න.)***

## III. ජාතික මට්ටමට අදාළ වන ඇගයීම් කාර්යයන් සඳහා මාර්ගෝපදේශ

**මාර්ගෝපදේශ - 17: ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත ඇගයීම් යෝජනා ඉදිරිපත් කිරීම**

- ඇගයීම් සිදුකිරීමට බලාපොරොත්තු වන රාජ්‍ය ආයතන අදාළ අමාත්‍යාංශ හෝ පළාත් සභා හරහා එම ඇගයීම් යෝජනා ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතුය.

- ජාතික ඇගයීම් මෙහෙයුම් කමිටුව හා අමාත්‍ය මණ්ඩලය මගින් ඇගයීම් යෝජනා තේරීම, ඒවාට අදාළ නිර්දේශ නිකුත් කිරීම හා අනුමතකිරීම යන කාර්යයන් සිදුකිරීම සඳහා, අදාළ ඇගයීම් යෝජනා සෑම මුදල් වර්ෂයකම පෙබරවාරි මාසය අවසන්වීමට පෙර ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත ලැබිය යුතුය.

- සියළු ඇගයීම් යෝජනා XV වැනි ඇමුණුම මගින් සපයා ඇති ආකෘතිය අනුව සකස් කළ යුතුය.

- ප්‍රමාදයකින් තොරව තීරණ ගැනීමට හැකිවනු පිණිස පහත සඳහන් ලේඛන ඇගයුම් යෝජනාවේ ඇමුණුම් වශයෙන් ඉදිරිපත්කළ යුතුයඃ

  i. ඇගයීමේ හැකියාව පිළිබඳ තක්සේරුව (Evaluability Assessment)
  ii. ඇගයීමෙහි ක්‍රියාකාරී සැලැස්ම

***ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීම සඳහා ඇගයීම් යෝජනා සකස් කිරීමේ ආකෘතිය සඳහා ඇමුණුම - XV පරිශීලනය කරන්න.***

**මාර්ගෝපදේශ - 18: ජාතික ඇගයීම් මෙහෙයුම් කමිටුවෙහි අවධානයට යොමු කිරීම සඳහා ඇගයීම් යෝජනාවල ප්‍රමුඛතාවය නිර්ණය කර කෙටි ලැයිස්තුවක් සකස්කිරීම.**

රටතුළ ඇගයීම් සිදුකිරීමට ඇති ධාරිතාව සැලකිල්ලට ගත්විට, එක් වර්ෂයක් තුළ ක්‍රියාත්මක කළ හැකි සංඛ්‍යාව ඉක්මවායන යෝජනා සංඛ්‍යාවක් ඉදිරිපත්ව ඇතිවිට සහ; මීළඟ මුදල් වර්ෂයේදී සම්පත් වෙන්කිරීම සඳහා යෝජිත ඇගයීම් වල යෝග්‍යතාව තහවුරුකිරීම සඳහා එම යෝජනාවන්හි ප්‍රමුඛතාව නිර්ණයකිරිමට හා ඒවා අතුරින් සීමිත සංඛ්‍යාවක් තොරා ලැයිස්තුගතකිරිම සඳහා ***ඇමුණුම - XVI පරිශීලනය කරන්න.***

# පරිච්ඡේද අංක 5

# ඇගයීම් සඳහා වූ ප්‍රමිති

# ඇගයීම් සඳහා වූ ප්‍රමිති

අධ්‍යයන අවශ්‍යතා සඳහාත් දියුණු මට්ටමේ තීරණගැනීම සඳහාත් ඇගයීම්වල නිමැවුම් (අනාවරණයන්, නිර්දේශ සහ උගතහැකි පාඩම්) පුළුල් ලෙස පිළිගැනීම හා භාවිතාකිරීම නිර්ණය කරනු ලබන වඩාත්ම තීරණාත්මක සාධකය වන්නේ ඇගයීම්වල ප්‍රමිතියයි. ඇගයීම් ප්‍රමිතීන්ගෙන් අපේක්ෂා කරනු ලබන්නේ ඇගයීම්වල ගුණාත්මකභාවය වැඩිදියුණුකිරීම සහ ඇගයීම් පරිශීලනය කිරීමට බලාපොරොත්තුවන්නන් අතර ඒවායේ භාවිතය ප්‍රවර්ධනය කිරීමයි.

ඇගයීම් ප්‍රමිති මගින් ඇගයීම් සැලසුම්කිරීම හා ක්‍රියාත්මකකිරීම සඳහා නිශ්චිත උපදෙස් ලබාදියයුතු අතර, ඇගයීම් සිදුකිරීමට අවශ්‍ය ධාරිතාව ගොඩනැංවීම (පුහුණු) හා පශ්චාත් ඇගයීම (නිමකළ ඇගයීම් කටයුතුවල තත්වය ඇගයීම) සඳහා මගපෙන්වීම සිදුකළ යුතුය. ඇගයීම් වල ගුණාත්මකභාවය වැඩිදියුණු වන බව තහවුරුකිරීම සඳහා, සමස්ත ඇගයීම් ක්‍රියාවලිය පුරාම එකඟ වූ ප්‍රමිතීන් සමූහයකට අනුගතවීම මගින් එම ඇගයීම්වල ප්‍රමිතිය සහතික කළ යුතුය.

ශ්‍රී ලංකාව සඳහා ඇගයීම් ප්‍රමිති සකස්කිරීම සඳහා මාර්ගෝපදේශයක් වශයෙන්, එක්සත් ජාතීන්ගේ ඇගයීම් මණ්ඩලය විසින් නිකුත් කරන ලද ඇගයීම් ප්‍රතිමාන හා ප්‍රමිති (2016) පරිශීලනය කරනු ලැබුවත් පහත සඳහන් ප්‍රමිති මාළාව සකස් කරන ලද්දේ ඒවා කෙරෙහි වූ දේශීය හිමිකාරීත්වය තහවුරුකිරීම උදෙසා දේශිය සංදර්භය (ආයතනික සැකැස්ම, ඇගයීම් ධාරිතාව, සපයාගත හැකි සම්පත්, ඇගයීම් සඳහා වන ඉල්ලුම ආදිය) පිළිබඳව අවධානය යොමුකරමිනි:

## ප්‍රමිති - 1: ඇගයීමෙහි නිපුණත්වය:

ඇගයීම් සැලසුම්කිරීම, ක්‍රියාත්මක කිරීම හා කළමනාකරණය කිරීම සඳහා සහභාගි වන පුද්ගලයින්, වෘත්තීය ප්‍රමිති සහ සදාචාරාත්මක මෙන්ම යුක්ති සහගත මූලධර්මයන්ට අනුගත වෙමින් ඉහළ ගුණාත්මකභාවයකින් යුත් ඇගයීම් සිදුකිරීම සදහා නිපුණතාවයකින් යුක්ත විය යුතුය.

### ප්‍රමිති - 1.1: නිපුණතා

- ඇගයීම් ක්‍රියාවලියේ කවර හෝ අවධියකදී එහි ක්‍රියාකාරකම්වලට සහභාගි වන පුද්ගලයන් හට පවරන ලද කාර්යයන් හා වගකීම් ඉටුකිරීම සඳහා, ඔවුන් අදාළ අධ්‍යාපන සුදුසුකම් සහ පිළිගතහැකි පළපුරුද්දක් ද, අදාළ කුශලතා ද සහිත වියයුතු අතර;.
- ඔවුන් සතු නිපුණතා අඛණ්ඩව වර්ධනය කිරීම හා පවත්වාගැනීම සඳහා පියවර ගතයුතුය.

### ප්‍රමිති - 1.2: ආචාරධර්ම

- ඇගයීම්වලට සහභාගි වන්නන් විසින්, ආචාරධර්මවලට අනුකූලව කටයුතු කිරීමට අදාළ වන පහත සඳහන් ප්‍රධාන කරුණුවලට අනුගත විය යුතුය:

i. ඇගයීමේහි උපයෝගීතාවය හා අවශ්‍යතාවය සැලකිල්ලට ගනිමින් (ඇගයීමෙහි අභිමතාර්ථ හා අරමුණු සලකා බැලිය යුතුයි) ඇගයීමෙහි මධ්‍යස්ථභාවය හා අපක්ෂපාතීත්වය තහවුරුකිරීම සඳහා විශේෂඥතාවයන්ගේ නිවැරදි සංයුතිය සහිත ඇගයීම් කළමනාකරණ කණ්ඩායමක් හා පාර්ශවකරුවන් තෝරාගැනීම.

ii. කාර්යයේ නියැලෙන විට බැඳියාවන් පිලිබඳ ගැටුමක් ඇති වියහැකි අවස්ථා ඇතිවීම වැළැක්වීම; අපක්ෂපාතීව, ස්වාධීනව. අවංකව හා වගවීමෙන් යුතුව කටයුතු කිරීම.

iii. ඇගයීමට සහභාගිවන්නන් විසින් පවත්වාගත යුතු රහස්‍යභාවය, ඔවුන්ගේ විවිධත්වය (ජනවාර්ගික. සංස්කෘතිකමය, ස්ත්‍රී/පුරුෂභාවය), ගරුත්වය සහ මානව හිමිකම්වලට ගරු කරමින් ඇගයීමට සහභාගිවන්නන් සමඟ උචිත පරිදි කාර්යයෙහි නියැලීම.

iv. ඇගයීම විනිවිදභාවයෙන් යුතුව, සියලු පාර්ශවයන් ඇතුළත්වන ක්‍රමවේදයක් අනුගමනය කරමින් සහ කිසිදු පාර්ශවයක් හෝ පුද්ගලයකුට අසාධාරණයක් සිදු නොවන පරිදි කටයුතු කිරීම තුළින් තොරතුරුවල නිරවද්‍යතාවය, විශ්වාසනීයත්වය හා පරිපූර්ණත්වය තහවුරු කරගනිමින් ඒවා විශ්ලේෂණයකිරීම හා වාර්තාකිරීම.

## ප්‍රමිති - 2 : ආයතනයේ සංවිධාන ව්‍යුහය:

ඇගයීමට අදාළ ක්‍රියාකාරකම් ඵලදායී ලෙස කළමනාකරණය කිරීම සඳහා, ඇගයීම සිදුකිරීමට අපේක්ෂා කරන ආයතනයේ සංවිධාන ව්‍යුහය ප්‍රමාණවත් විය යුතුය.

- ගුණාත්මක බවින් උසස් ඇගයීම් සිදුකිරීම සහ කළමනාකරණය කිරීම සඳහා අදාළ ආයතනය මගින් පහත සදහන් අවශ්‍යතා සැපිරිය යුතුය:

  i. ඉහළ කළමනාකාරීත්වය තුළ ඇගයීම් පිළිබඳ නිසි අවබෝධයක් පැවතීම හා ඇගයීම් සඳහා සහයෝගය ලබාදීම;

  ii. අනුමැතියලත් අයවැයක් සහිත ඇගයීම් ආයතනයේ ක්‍රියාකාරී සැලස්මට ඇතුළත් කර තිබීම;

  iii. අපක්ෂපාතී ඇගයීම් ක්‍රියාවලියකට පහසුකම් සැලසීම සඳහා, ආයතනයේ ඉහළ කළමනාකාරීත්වය මගින් ඇගයීම ස්වාධීන කාර්යයක් ලෙස පිලිගැනීම;

  iv. ඇගයීම් කාර්යයට නායකත්වය ලබාදෙන පුද්ගලයාහට, ඇගයීමට අදාළ තීරණගැනීමේදී ආයතනයේ ඉහළ කළමනාකාරීත්වය සමඟ ඍජුව සම්බන්ධවීම සඳහා වූ අනුමැතිය/අවසරය;

  v. ඇගයීම සඳහා ප්‍රමාණවත් මූල්‍ය ප්‍රතිපාදන හඳුනාගෙන වෙන්කර ඇති බව සහ;

  vi. කළමනාකරණ ප්‍රතිචාර ආශ්‍රයෙන් නිර්දේශිත කාර්යයන්හි ක්‍රියාකාරීත්වය පරීක්ෂා කිරීම සඳහා විධිවිධාන සලසා තිබීම.

## ප්‍රමිති - 3: ඇගයීම් ක්‍රියාත්මක කිරීම :

ඇගයීමෙහි පරමාර්ථ සහ අරමුණු කෙරෙහි එල්ලය පවත්වා ගනිමින් තත්වයෙන් උසස් ඇගයුම් ප්‍රතිඵල නිමවිය හැකි අයුරින් ඇගයීම් ක්‍රියාත්මක කළ යුතුය.

### ප්‍රමිති - 3.1: කාලීනභාවය:

නිර්මාණශීලීව තීරණ ගැනීමේ ක්‍රියාවලිය සඳහා සහායවීමත්, ඇගයීම් ප්‍රතිඵල භාවිතයේ යෙදීමට බලාපොරොත්තුවන්නන්ගේ අවශ්‍යතා සපුරාලීමත් සඳහා වඩාත් අර්ථාන්විත, ප්‍රයෝජනවත් හා කාලීන තොරතුරු ඇගයීම තුළින් සපයන බවට ඇගයීමෙහි සැලැස්ම, විෂයපථය හා පිරිසැලසුම මගින් තහවුරු කළ යුතුය.

**ප්‍රමිති - 3.2: ඇගයීමේ හැකියාව තක්සේරුකිරීම:** තීරණගැනීම සඳහා විශ්වාසනීය හා කාලීන තොරතුරු සම්පාදනය කරගත හැකි ආකාරයට ඇගයීම සිදුකිරීමට ඇති හැකියාව පරීක්ෂාකිරීම සඳහා, ඇගයීමක් සැලසුම් කිරීමට පෙර ඇගයීමේ හැකියාව තක්සේරු කළ යුතුය.

**ප්‍රමිති - 3.3: ඇගයීමේ යොමුකිරීමේ අනුදේශ (ToR) :** ඇගයීමෙහි පරමාර්ථය, අරමුණු, විෂය පථය, ඇගයීම් උපමාන, ඇගයීම් විධි සහ ප්‍රවේශයන් (ක්‍රමවේදය), කළමනාකරණ විධිවිධාන, කාලරාමුව හා ඇගයීමෙහි හිමැවුම් පැහැදිලිව නිර්වචනය කරගැනීම සඳහා කළමනාකරණ කමිටුව හා ඇගයීම් නිර්දේශක කණ්ඩායමෙහි අදහස් විමසීමෙන් අනතුරුව ඇගයීමෙහි යොමුකිරීමේ අනුදේශ සකස් කර ගත යුතුය.

**ප්‍රමිති - 3.4: ඇගයීමෙහි විෂය පථය හා අරමුණු:** ඇගයීමෙහි පරමාර්ථය මගින් ඇගයීම හා එහි උපයෝගීතාව සාධාරණීකරණය කරනු ලබන අතර, විෂයපථය හා අරමුණු මගින් ඇගයීමේදී ආවරණය කිරීමට අපේක්ෂිත ක්ෂේත්‍රය හා එහි කාර්යසිද්ධිය නිර්වචනය කරනු ලබන බැවින් පැහැදිලි, යථාර්තවත් මෙන්ම ලඟාකර ගතහැකි අභිමතාර්ථ, අරමුණු හා විෂයපථයක් පිළිබඳ තීරණයකට එළඹීම අත්‍යාවශ්‍ය ය.

**ප්‍රමිති - 3.5: ඇගයීම් ක්‍රමවේදය:** ඇගයීම් ක්‍රමවේදයෙහි අපේක්ෂාව වියයුත්තේ ඇගයීම් ප්‍රශ්න සඳහා විශ්වාසනීය පිළිතුරු ලබාදීම යි. ඇගයීමෙහි අරමුණු සපුරාලීම සඳහා වලංගුභාවයෙන් යුත්, විශ්වාසනීය හා ප්‍රමාණවත් තොරතුරු රැස්කරගත හැකිබව සහ දත්ත විශ්ලේෂණය තර්කාණුකූලව හා අංගසම්පූර්ණව (අනුමාන හෝ අදහස් මත පදනම් නොවී) සිදුකළ හැකි බව ඇගයීම් ක්‍රමවේදය මගින් තහවුරුකළ යුතුය.

**ප්‍රමිති - 3.6: පාර්ශවකරුවන්ගේ සහභාගීත්වය:** ඇගයීම් ක්‍රියාවලිය පුරාම පාර්ශවකරුවන්ගේ සහභාගීත්වය ප්‍රමාණවත් මට්ටමින් පවතිනබව තහවුරුකිරීම අත්‍යාවශ්‍යය. මේ සඳහා ඇගයීම් ප්‍රතිපත්ති රාමුවෙහි සඳහන් මාර්ගෝපදේශ අනුව ඇගයීම් නිර්දේශක කණ්ඩායම හා ඇගයීම් කළමනාකරණ කණ්ඩායම පත්කළ යුතුය.

**ප්‍රමිති - 3.7: ඇගයුම්කරු / ඇගයුම් කණ්ඩායම පත්කිරීම:** අදාළ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව විවෘත හා විනිවිදභාවයකින් යුත් ක්‍රියාවලියක් අනුගමනය කරමින් දක්ෂ හා සුදුසුකම්ලත් ඇගයුම්කරුවකු හෝ කණ්ඩායමක් පත්කර ගතයුතුය. ඇගයීම් ප්‍රතිපත්ති රාමුවෙහි 3 වැනි පරිච්ඡේදයෙහි 13 වැනි මාර්ගෝපදේශය අනුව ඇගයුම්කරු පත්කළ යුතුය.

**ප්‍රමිති - 3.8: ඇගයීම් වාර්තාව සහ නිපැයුම්:** ඇගයීම් වාර්තාව පරිශීලනය කිරීමට අපේක්ෂිත පුද්ලයන්ගේ පහසුවතකා (පැහැදිලි හා සරළ භාෂාව, පරිශීලනය කළහැකි ආකාරයෙන් පැවතීම) සාක්ෂි මත පදනම්ව අනාවරණය කරගත් කරුණු, නිර්දේශ හා නිගමනයන් සහිතව තර්කාණුකූලව අවසාන ඇගයීම් වාර්තාවේ කරුණු පෙළගැස්විය යුතුය.

**ප්‍රමිති - 3.9: නිර්දේශ:** ඇගයීමේදී අනාවරණය කරගත් කරුණු මූලාශ්‍රය වශයෙන් ගෙන සාක්ෂි මත පදනම්ව (අදහස් මත පදනම් නොවී) නිර්දේශ ගොනුකළයුතු අතර ඒවා ක්‍රියාත්මකකිරීම අතින් යථාර්ථවාදී විය යුතුය.

**ප්‍රමිති - 3.10: ඇගයීම් තොරතුරු සන්නිවේදනය හා බෙදාහැරීම:** ඇගයීම සැලසුම් කරන අවධියේදීම හඳුනා ගන්නා ලද ඵලදායී සන්නිවේදන හා තොරතුරු බෙදාහැරීමේ උපායමාර්ගයක් පැවතිය යුතුය. ඇගයීමේදී අනාවරණය කරගත් කරුණු, නිර්දේශ හා උගතහැකි පාඩම් පිළිබඳව ඵලදායී ප්‍රතිපෝෂණයක් ලබාගැනීම හා ඒවායේ ඵලදායී ලෙස භාවිතය අපේක්ෂාවෙන් එම තොරතුරු පාර්ශවකරුවන් අතර බෙදාහැරිය යුතුය (ඇගයීම් ප්‍රතිපත්ති රාමුවෙහි 2 වනි පරිච්ඡේදයෙහි සඳහන් වාර්ශික ඇගයීම් න්‍යායපත්‍රය අනුව).

## ප්‍රමිති - 4 : ඇගයීම් කළමනාකරණය:

ඇගයීමක් ඵලදායී ලෙස කළමනාකරණය කිරීම සඳහා ඇගයීම් කණ්ඩායම් නායකයාගේ ක්‍රියාකාරීත්වයේ කාර්යක්ෂමතාව හා ඵලදායීතාව මෙන්ම අනුමත වූ ඇගයීම් මාර්ගොපදේශයන්ට අනුගතවීම අත්‍යාවශ්‍ය ය.

**ප්‍රමිති - 4.1 : ඇගයීම් කණ්ඩායම් නායකයා:** පහත සඳහන් දෑ තහවුරුකිරීම සඳහා ඇගයීම් කණ්ඩාම් නායකයා විසින් නිසි පියවර ගත යුතුය:

i. මාර්ගෝපදේශ වලට අනුකූලව ඇගයීමෙහි සැලැස්ම ක්‍රියාත්මක කරන බව;
ii. අයවැය සකසුරුවමින් හා කාර්යක්ෂමව කළමනාකරණය කරන බව;
iii. උචිත ඇගයීම් ක්‍රමවේද භාවිතා කරන බව;
iv. බලාපොරොත්තුවන ප්‍රධාන පාර්ශවකරුවන්/ පරිශීලනය කරන්නන් ඉලක්ක කර ඇගයීම් සිදුකරන බව;

**ප්‍රමිති - 4.2 : ඇගයීම් මාර්ගෝපදේශ:** ඇගයීම් සඳහා ප්‍රමාණවත් හා ශක්තිමත් මාර්ගෝපදේශ පැවතිය යුතු අතර ඇගයීම්වලට සහභාගීවන පුද්ගලයින් තුළ එම මාර්ගෝපදේශ පිළිපැදීම සඳහා මනා අවබෝධයක් තිබිය යුතුය.

## ප්‍රමිති - 5 : ගුණාත්මකභාවය සහතිකකිරීම :

ඇගයීම් ක්‍රියාවලිය පුරාම එම ඇගයීමෙහි ගුණාත්මකභාවය සහතිකකිරීම අත්‍යාවශ්‍යය.

**ප්‍රමිති - 5.1: සැලසුම්කරණයේදී සහ සුදානම් වන අවධියේදී ගුණාත්මකභාවය සහතිකකිරීම:**

ගුණාත්මකභාවය සහතිකකිරීමේදී පහත සඳහන් අංශ පිලිබඳව සැලකිලිමත් විය යුතුය.

i. ඇගයීමේ පැහැදිලි බව හා අවශ්‍ය සියළු කරුණු වලින් සමන්විතවන බව;

ii. යෝජිත ඇගයීම් ක්‍රමවේදය මගින් වෙන්කරන ලද අයවැය හා කාලරාමුව තුළ ඇගයීමෙහි විෂයපථය ආවරණය කළහැකි බව;

iii. ඇගයීම් ක්‍රමවේදය ඇගයීමෙහි අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා ප්‍රමාණවත් වීම;

iv. විශ්වාසනීයත්වයකින් යුතුව දත්ත විශ්ලේෂණය කිරීමට හා කරුණු අනාවරණය කිරීමට මග පාදන, ප්‍රබල දත්ත විවිධ ක්‍රම ඔස්සේ රැස්කිරීම තහවුරු කරන ඇගයීම් ක්‍රමවේදයක් බව;

v. ඇගයීමෙහි අදාළත්වය හා ප්‍රයෝජනවත්බව තහවුරුකිරීම සඳහා ප්‍රමාණවත්ව අදහස් ලබාගැනීම සඳහා ඇගයීම් ක්‍රියාවලි තුළින් අවකාශ සලසන බව;

vi. ඇගයීම් කණ්ඩායම ඒ සඳහා උචිත පරාසයක විහිදුනු විශේෂඥතා සහිත බව සහ;

vii. ඇගයුම්කරුවන් තේරීමේ ක්‍රියාවලිය මගින් බැඳියාවන්ගේ පිළිගැටුම් ඇති නොවන පරිදි මෙන්ම වෙනත් ආචාරධර්මයන්ට පටහැනි නොවන පරිදි වඩාත් සුදුසු අයදුම්කරුවන් තෝරාගැනීම තහවුරු කරන බව.

**ප්‍රමිති - 5.2: ඇගයීමේ අවසන් අදියරේදී ගුණාත්මකභාවය සහතිකකිරීම:**

ඇගයීමක අවසන් අදියරේදී එහි ගුණාත්මකභාවය සහතිකකිරීම සඳහා පහත සඳහන් අංශ කෙරෙහි අවධානය අවධානය යොමුකළ යුතුය;

i. ඇගයීමෙහි විශ්වාසනීයත්වය තහවුරුකිරීම සඳහා විශ්වාසනීය මෙන්ම උචිත මූලාශ්‍රයන්ගෙන් දත්ත රැස්කළ බව;

ii. ඇගයීමේදී අනාවරණය වන කරුණුවලට, සාක්ෂි හා නිසි විශ්ලේෂණයන් පදනම් වූ බව;

iii. ඇගයීමේදී අනාවරනය වූ කරුණු, නිර්දේශ හා නිගමන තර්කාණුකූල සහසම්බන්ධතාවක් දක්වන බව;

iv. ඇගයීමෙහි නිරවද්‍යතාව, වලංගුභාවය, අදාළත්වය හා ප්‍රයෝජනවත්බව තහවුරු කිරීම සඳහා ප්‍රමාණවත්ව පාර්ශ්වකරුවන්ගේ අදහස් විමසූ බව;

v. ඇගයීමෙහි නිර්දේශයන් ක්‍රියාත්මක කළයුතු පාර්ශවයන්ට එම නිර්දේශ පහසුවෙන් අවබෝධ කරගත හැකිබව සහ ඒවා ක්‍රියාත්මක කළ හැකි බව (භාවිතයේ යෙදවිය හැකිබව);

vi. ඇගයීමෙහි නිර්දේශ මගින් ඇගයීම් විෂයපථයෙන් පරිබාහිර විෂයයන් කෙරෙහි සෘණාත්මක බලපෑම් ඇති නොකරන බව;

vii. ඇගයීම් වාර්තාව එය ඇගයීමෙහි විෂය ක්ෂේත්‍රය හා සීමාවන් (යොමුකිරීමේ අනුදේශ) හා අනුකූල වන බව හා ඇගයීම් ප්‍රශ්නාවලියේ සියළු ප්‍රශණ සඳහා පිළිතුරු සපයන බව සහ;

viii. අවසාන ඇගයීම් වාර්තාවෙහි ආකෘතිය ඇගයීම් මාර්ගෝපදේශවලට අනුකූල බව.

# පරිච්ඡේද අංක - 6

# ජාතික ඇගයීම් ප්‍රතිපත්තිය ක්‍රියාත්මකකිරීම සඳහා උපායමාර්ගික ප්‍රවේශය

# ජාතික ඇගයීම් ප්‍රතිපත්තිය ක්‍රියාත්මකකිරීම සඳහා උපායමාර්ගික ප්‍රවේශය

ජාතික ඇගයීම් ප්‍රතිපත්ති රාමුව මගින් දිස්ත්‍රික්, පළාත් සහ ජාතික මට්ටමෙන් රටතුළ ඇගයීම ක්‍රියාවට නැංවිය යුතු ආකාරය පිළිබඳ මෙහෙයවීම හා මගපෙන්වීම සිදුකරයි. ජාතින ඇගයීම් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ සාර්ථකත්වය නිර්ණය කරනු ලබන්නේ ඇගයීම සඳහා වූ ආයතනික සහාය; ඇගයීම සඳහා පවතින ධාරිතාව; ප්‍රතිපත්තිමය හා දේශපාලනික තීරණ ගනු ලබන පාර්ශවයන්ගේ දැනුවත්භාවය හා සහයෝගය; ඇගයීම් තොරතුරු ලබාගැනීමට ඇති හැකියාව; ඇගයීමෙහි ගුණාත්මකභාවය හා සැලසුම්කරණයේදී ඇගයීම් තොරතුරු භාවිතයට ගැනීම ආදී අංගවලින් සවිමත්ව බල ගැන්වුනු සමත්බවින් පිරි වටපිටාවක් මගිනි.

එබැවින්, ජාතික ඇගයීම් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය සමත්බවින් පිරි වටපිටාවක් නිර්මාණයකිරීම සඳහා පහත සඳහන් උපායමාර්ගික ක්ෂේත්‍ර 06 ආශ්‍රිතව පවතින ගැටළු විසඳීමට හා පරතරයන් අවමකිරීමට හැකි උපායමාර්ගික සැලැස්මක් ක්‍රියාත්මකකිරීම වැදගත් වේ.

## උපායමාර්ගික ක්ෂේත්‍ර – 1: ඇගයීම ආයතනගත කිරීම

ජාතික ඇගයීම් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා අලුත් ආයතනික සැකැස්මක් අවශ්‍ය නොවේ; මේ සඳහා රාජ්‍ය අංශයේ සියළු මට්ටම්වල දැනට ස්ථාපිත ක්‍රමසම්පාදන හා මෙහෙයුම් ඒකකවලට අවශ්‍ය ධාරිතාව හා ප්‍රවීණතාව ලබාදී ඒවා ශක්තිමත් කරනු ඇත. ඇගයීම ආයතනගත කිරීමේ ක්‍රියාවලිය සඳහා පෙරසූදානම්වීමේදී අනුගමනය කළයුතු අත්‍යාවශ්‍ය පියවර වන්නේ: ඇගයීම් ක්‍රියාවලිය පවත්වාගෙන යාමේදී මූලිකත්වයගෙන කටයුතු කළහැකි දක්ෂ පුද්ගලයින් ආයතනයේ වර්තමාන කාර්ය මණ්ඩලය තුළින් හඳුනාගැනීම; ඇගයීම සඳහා වූ ප්‍රවීණතා ආයතන ජාලය තුළ හුවමාරු කරගැනීම; ඇගයීම සඳහා ප්‍රමාණවත් සම්පත් (අයවැය) වෙන්කර දීම සහ; ඇගයීම් තුළින් අනාවරණය වන කරුණු සැලසුම්කරණයේදී හා අයවැය සකස්කිරීමේදී උපයෝගී කර ගැනීමයි.

## උපායමාර්ගික ක්ෂේත්‍ර – 2: ඇගයීම් ධාරිතා වර්ධනය (Evaluation Capacity Development)

ඇගයීම් ක්‍රියාත්මක කිරීම සඳහා රාජ්‍ය අංශයේ ආයතනයන්හි දැනට පවතින ධාරිතාව (මානව සම්පත, දැනුම, කුසලතා, නායකත්වය හා භෞතික සම්පත් ආදිය ආශ්‍රිත) හඳුනාගත යුතු අතර, ධාරිතාවයෙහි අඩුලුහුඩුකම් සම්පූර්ණකිරීම සඳහා ප්‍රමාණවත් සම්පත් හා පුහුණුව ලබාදීම සඳහා මූලික අවධානය යොමුකළ යුතුය.

රාජ්‍ය අංශයේ නවක නිලධාරීන්ගේ පුහුණු අවශ්‍යතා සපුරාලීමත්, ඇගයීම් ක්‍රියාත්මකකිරීම හා කළමනාකරණයකිරීම සඳහා දැනට සේවයේ නියුතු අදාළ රාජ්‍ය නිලධාරීන්ට අවශ්‍ය දැනුම හා කුසලතා වැඩිදියුණු කිරීමත් අරමුණු කරගනිමින් අංගසම්පූර්ණ ධාරිතා වර්ධන වැඩසටහනක් ක්‍රියාත්මක කළ යුතුය. විවිධ විෂය ක්ෂේත්‍රයන්හි ප්‍රවීණත්වය දක්වන වෘත්තිකයන් අතුරින් වෘත්තියමය ඇගයුම්කරුවන්ගෙන් සමන්විත සංචිතයක් බිහිකිරීම තුළින් ඇගයීම් ක්ෂේත්‍රයට අදාළ දේශීය ධාරිතාව වැඩිදියුණු කිරීම උදෙසා, පුහුණු ආයතන හා උසස් අධ්‍යාපන ආයතනයන්හි විෂයපථය හා ආයෝජන පුළුල් කිරීම සඳහා එම ආයතන දිරිගැන්විය යුතුය.

## උපායමාර්ගික ක්ෂේත්‍ර – 3 : ප්‍රතිපත්ති සම්පාදකයින්, ජ්‍යෙෂ්ඨ රාජ්‍ය නිලධාරීන් සහ සංවර්ධන ක්‍රියාවලියේ හවුල්කාර ආයතන ඇගයීම පිලිබඳව සංවේදීකරණය

ඇගයීම් සාර්ථක ලෙස ක්‍රියාත්මකකිරීම සඳහා දේශපාලන නායයකත්වය සහ අනුග්‍රහය, රාජ්‍ය නිලධාරීන්ගේ (විශේෂයෙන්ම ආයතන ප්‍රධානීන්ගේ) සහ සංවර්ධනයේ හවුල්කාර ආයතනවල කැපවීම තීරණාත්මක සාධක වන හෙයින්, ජාතික ඇගයීම් ප්‍රතිපත්තියෙහි පරමාර්ථ සාක්ෂාත්කිරීම සඳහා පහත සඳහන් කොන්දේසි 03 සැපිරිය යුතුය:

i. ඇගයීම ප්‍රධාන ධාරාවට ඇතුළත් කිරීම (Mainstreaming) සඳහා ජ්‍යෙෂ්ඨ රාජ්‍ය නිලධාරීන්ගේ කැපවීම හා ක්‍රියාකාරී දායකත්වය;

ii. සංවර්ධන ක්‍රියාවලිය තුළ ඇගයීම පොදු භාවිතයක් බවට පත්කිරීම සඳහා සංවර්ධනයේ හවුල්කාර ආයතනයන්හි කැපවීම හා සහාය;

iii. දේශපාලනඥයන් විසින් දැනුවත්බවින් යුතුව තීරණගැනීම සඳහා ඇගයීම්වලින් අනාවරණය වන තොරතුරු පිළිගැනීම, ඉල්ලාසිටීම හා භාවිතයට ගැනීම.

දේශපාලනඥයන් සහ ජ්‍යෙෂ්ඨ රාජ්‍ය නිලධාරීන් තුළ ඇගයීම පිළිබඳ දැනුවත්භාවය, පිළිගැනීම හා ඉල්ලුම වර්ධනය කිරීම සඳහාත් සංවර්ධනයේ හවුල්කාර ආයතනවල සහයෝගය ශක්තිමත් කිරීම සඳහා ඵලදායී වැඩසටහනක් ක්‍රියාත්මකකළ යුතුය. වෘත්තීයවේදීන් හා වෘත්තිකයන්ගේ ජාලයක් හරහා ව්‍යවහාරික ප්‍රජාවක් (Community of Practice) ස්ථාපනයකිරීම ඇගයීම ප්‍රචලිතකිරීම සඳහා වන ඵලදායී පියවරකි.

## උපායමාර්ගික ක්ෂේත්‍ර – 4 : ඇගයීම්වල තත්වය සහතික කිරීම

ඇගයීම්වල ගුණාත්මකභාවය සහතිකකිරීම සඳහා ජාතික ඇගයීම් ප්‍රතිපත්ති රාමුව මගින් හඳුන්වා දී ඇති ඇගයීම් සඳහා වූ ප්‍රමිති සහ තත්වය සහතික කිරීමේ මෙවලම අනුගමනය කර හා භාවිත කළ යුතු අතර, අවශ්‍ය විටදී ඒවා වැඩිදියුණු කිරීම හා සංශෝධනය සිදුකළ යුතුය.

## උපායමාර්ගික ක්ෂේත්‍ර – 5 : ඇගයීම් තොරතුරු බෙදාහැරීම, දැනුම කළමනාකරණය හා වගවීම

ඇගයීම් තොරතුරු බෙදාහැරීම, වගවීම හා බැඳුනු සදාචාරාත්මක අවශ්‍යතාවක් වන අතර එය 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ පනත යටතේ මතුවන අවශ්‍යතාවකි. රාජ්‍ය ආයෝජනයන්හි පාරදෘශ්‍යභාවය උසස් තත්වයට පත්කිරිම සඳහා ඇගයීම්වල සංස්ලේශිත තොරතුරු අදාළ ආයතන අතර බෙදාහැරිය යුතුය. බෙදාහැරියයුතු ඇගයීම් තොරතුරුවල ස්වභාවය හා තත්වයද බෙදාහැරියයුතු මාධ්‍යය හා වාරගණන ද මහජනතාවට හා පාර්ශවකරුවන්ට එම තොරතුරු පරිහරණය සඳහා ලබාදිය යුතු අවකාශයේ සීමා ද පිළිබඳව අමාත්‍ය මණ්ඩලය විසින් (ජාතික ඇගයීම් මෙහෙයුම් කමිටුවේ නිර්දේශ මත පදනම්ව) තීරණ ගනු ලබයි.

ජාතික ඇගයීම් මෙහෙයුම් කමිටුව මගින් සමාලෝචනය කර තහවුරු කිරීමෙන් අනතුරුව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලද ඇගයීම් තොරතුරු ලබාගැනීමට ඇති හැකියාව වැඩිදියුණුකිරීම සඳහා අන්තර්ජාල අවකාශය භාවිතාවන ඇගයීම් තොරතුරු පද්ධතියක් ස්ථාපනය කළයුතුය. මෙම තොරතුරු පද්ධතිය ඇගයීම් තොරතුරු ගබඩා කිරීමට මෙන්ම ඇගයීම පිළිබඳ සන්නිවේදන හා අධ්‍යයන අවකාශයක් ලෙස භාවිතා කරනු ඇත.

**උපායමාර්ගික ක්ෂේත්‍ර - 6 : ක්‍රමසම්පාදන හා අයවැය ක්‍රියාවලිය සමඟ ඇගයීම සම්බන්ධකිරීම**

රජයේ සියලු මට්ටම්වල ක්‍රමසම්පාදන ක්‍රියාවලිය මෙන්ම අයවැය ක්‍රියාවලිය තුළදී ඇගයීම් තොරතුරු උපයෝගී කරගනිමින් තීරණ ගැනීමේ අවස්ථා වැඩිකිරීම සඳහා උපායමාර්ගික ප්‍රවේශයක් හඳුනාගත යුතුය. මෙම කාර්යයේදී ව්‍යාපෘති යෝජනා ඉදිරිපත් කිරීම සමබන්ධව ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවෙහි අංක MNPEA/PLN/PI/2019 දරන චක්‍රලේඛයට (විශේෂයෙන්ම, එහි 15.2 කොටසෙහි ඇතුළත් ව්‍යාපාති ඉදිරිපත් කිරීමේ ආකෘතියට) අනුගතවීම අනිවාර්ය මූලික අවශ්‍යතාවක් වශයෙන් සැලකිය යුතුය.

# ඇමුණුම්

## ඇමුණුම - I: ආයතනික මට්ටමේදී ඇගයීම් තෝරාගැනීම සහ ප්‍රමුඛතාව නිර්ණයකිරීම සඳහා මෙවළම

| | උපමාන | උපමානය පිළිබඳ පැහැදිළිකිරීම | හිමිවන මුළු ලකුණු ගණන | රැස්කළ ලකුණු ගණන |
|---|---|---|---|---|
| 01 | ප්‍රතිපත්තිමය අදාළත්වය | ඇගයීම සඳහා තෝරාගත් විෂය ක්ෂේත්‍රය දැනට ක්‍රියාත්මක වන රාජ්‍ය ප්‍රතිපත්ති සහ ප්‍රමුඛ ක්ෂේත්‍ර සමග පැහැදිළිලෙස සහ සමීපත්ව බැඳී පවතී. | 15 | |
| 02 | අදාළත්වය | තිරසාර අයුරින් වත්මන් හෝ අනාගතයේ මතුවන ගැටළු විසඳීමට සහ පාර්ශවකරුවන්ගේ සියළු අවශ්‍යතා සපුරාලීම සඳහා යෝජිත ඇගයීම ප්‍රමාණවත් ද යනවග | 15 | |
| 03 | කාර්යක්ෂමතාව | ලබාදීමට සැලසුම්කර ඇති නිමැවුම් උත්පාදනයේදී කාර්යක්ෂමව සම්පත් උපයෝජනය වනුඇතිබව පෙන්නුම්කිරීම (හෝ ඒ සඳහා සාක්ෂි පවතින බව) | 10 | |
| 04 | ඵලදායීතාව | අදාළ ව්‍යාපෘතිය, වැඩසටහන. ප්‍රතිපත්තිය හෝ ආයතනය මගින් අපේක්ෂිත ප්‍රතිඵල ස්ථිරවම ලබාදෙනබව පෙන්නුම්කිරීම (හෝ ඒ සඳහා සාක්ෂි පවතින බව). | 10 | |
| 05 | තිරසාරත්වය | අදාළ ව්‍යාපෘතිය, වැඩසටහන. ප්‍රතිපත්තිය හෝ ආයතනය මගින් ජනනය කරන නිමැවුම් හා ප්‍රතිඵල (සිදු වූ චර්යාත්මක වෙනස්කම්) අඛණ්ඩව හා ක්‍රමයෙන් වර්ධනය වන අයුරින් පවත්වාගත හැකිබව | 10 | |
| 06 | ශක්‍යතාව | ආරම්භයේදී එකඟ වූ විෂයපථය, පිරිවැය හා කාලරාමුවෙන් විශාල ලෙස අපගමනය නොවී ක්‍රියාත්මක කිරීමට ඇති/ තිබූ හැකියාව (සාර්ථකත්වය හෝ අසමත්භාවය තුළින් උගතහැකි පාඩම් පිළිබඳ අධ්‍යයනය ආදී වශයෙන් වූ ඇගයීමෙහි අභිප්‍රායයන් පදනම්කොටගෙන ලකුණු ලබාදිය යුතුය). | 10 | |
| 07 | ප්‍රතිවලිතවීමේ සහ පරිමාණය ක්‍රමයෙන් වැඩිවන අයුරින් ක්‍රියාත්මක කිරීමේ (Replicating and scaling-up) ප්‍රවණතාව | ඇගයීමෙන් අනාවරණය කරනු ලබන තොරතුරු ප්‍රතිවලිත ස්වභාවයේ මැදිහත්වීම් (Intervention) සඳහා අදාළවන බව සහ; එකම ක්ෂේත්‍රයේ හෝ වෙනස් ක්ෂේත්‍රයන්හි අනාගතයේදී ක්‍රියාත්මකකිරීමට අපේක්ෂිත මේ හා සමාන මැදිහත්වීම් සැලසුම් කිරීමට, වැඩිදියුණුකිරීමට හෝ ප්‍රතිව්‍යුහගත කිරීමට උපයෝගී කරගනු ඇති බව.* | 15 | |
| 08 | ඇගයීමට ඇති හැකියාව | ඇගයීම පිළිබඳ විශ්වාසනීයත්වය ඇතිවන අයුරින් නිරවද්‍යව එය ක්‍රියාත්මකකිරීමේ හැකියාව (යොමුව: මාර්ගෝපදේශ අංක 02 - ඇගයීමේ හැකියාව තක්සේරුකිරීමේ මාර්ගෝපදේශය) | 10 | |
| 09 | නවෝත්පාදනීය ස්වභාවය | ඇගයීමට ලක්වන සමස්ත මැදිහත්වීම හෝ එහි කොටසක් නවෝත්පාදන ප්‍රවේශයක් සහිතව ක්‍රියාත්මක කරනබව | 05 | |
| **මුළු ලකුණු** | | | 100 | |

* නව ව්‍යාපෘති අනුමැතිය සඳහා කරුණු අධ්‍යයනයේදී ඇගයීම්තුලින් අනාවරණය කරන ලද තොරතුරු ප්‍රධාන වශයෙන්ම පරිශීලනය කරනු ලබන ප්‍රධාන පරිශීලකයා වන්නේ ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවයි (කරුණාකර 17 වැනි ඇමුණුමෙහි දැක්වෙන ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ ව්‍යාපෘති ඉදිරිපත් කිරීමේ ආකෘතිපත්‍රයෙහි 15 වන කොටස බලන්න*. අතීතයේ ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘතිවල ඇගයීම් තොරතුරු පවත්වාගැනීම, එම සංවර්ධන කාර්යයන්හි අන්තර්ගත වූ සමාන සංරචකයන් සහිත නව ව්‍යාපෘති අනුමැතිය සඳහා අතිවිශාල පිටුබලයකි.

## ඇමුණුම - II: ඇගයීමේ හැකියාව තක්සේරුකිරීම සඳහා මෙවලම

| තක්සේරුවට ලක් කරන ප්‍රධාන අංගය | 'ඔව් හෝ නැත' යන පිළිතුරු ලබාගැනීම සඳහා පිරික්සුම් ලැයිස්තුව | ඔව් | නැත |
|---|---|---|---|
| වෙනස් කිරීමේ න්‍යාය | 1. ව්‍යාපෘතිය, වැඩසටහන, ප්‍රතිපත්තිය හෝ ආයතනය පැවතිය යුත්තේ/ පවතින ලද්දේ ඇයිදැයි විස්තර කළහැකි පැහැදිලි වෙනස්කිරීමේ න්‍යායක් ඇත. | | |
| | 2. ව්‍යාපෘතිය, වැඩසටහන, ප්‍රතිපත්තිය හෝ ආයතනය සඳහා අධීක්ෂණය කළහැකි කාර්යසාධන දර්ශක ඇතුළත් තර්ක රාමුවක් ඇත. | | |
| | 3. ව්‍යාපෘතිය, වැඩසටහන, ප්‍රතිපත්තිය හෝ ආයතනය සඳහා පැහැදිලිව අර්ථ දක්වනලද අරමුණු හා පරමාර්ථ ඇත. | | |
| | 4. අපේක්ෂිත හා අපේක්ෂා නොකළ ප්‍රතිලාභ සහිතව අරමුණු හා පරමාර්ථ ලඟාකරගත හැක. | | |
| | 5. ව්‍යාපෘතිය, වැඩසටහන, ප්‍රතිපත්තිය හෝ ආයතනය මගින් යථාර්තවත් හා මැනිය හැකි ප්‍රතිඵල ජනනය කරයි. | | |
| | **'ඔව් හෝ නැත' යන පිළිතුරුවල ප්‍රතිශතමය අගය (%)** | | |
| ඇගයීම සිදුකිරීම සඳහා අදාළ වන ප්‍රධාන තොරතුරු පවතීද යනබව (සපයාගත හැකිබව) | 1. මූලික දත්ත (ව්‍යාපෘතිය, වැඩසටහන, ප්‍රතිපත්තිය හෝ ආයතනයට අදාල වන) සපයාගත හැක. | | |
| | 2. ව්‍යාපෘති ලියවිල්ල/ මූලික ඇගයීම් වාර්තාව/ අදාල තොරතුරු සහිත වෙනත් ආධාරක ලියවිල්ලක් ඇත. | | |
| | 3. විධිමත් අධීක්ෂණ හා ප්‍රගති වාර්තා ඇත. | | |
| | 4. රැස්වීම් වාර්තා ඇත. | | |
| | 5. ක්ෂේත්‍ර නිරීක්ෂණ වාර්තා ඇත. | | |
| | 6. මූල්‍ය වාර්තා (අයවැය හා සංශෝධන) ඇත. | | |
| | **'ඔව් හෝ නැත' යන පිළිතුරුවල ප්‍රතිශතමය අගය (%)** | | |
| සංදර්භයෙහි සහෝපකාරීභාවය | 1. ඇගයීම සඳහා තෝරාගත් කාලය උචිත ය. (යෝජිත කාලරාමුව තුළ ඇගයීම සිදුකිරීම ප්‍රයෝජනවත්ය). | | |
| | 2. සම්පත් වෙන්කර දීම, ධනාත්මක සන්නිවේදනය හා ඇගයීම් තුළින් අධ්‍යයනය ආදිය සඳහා ආයතනික (නායකත්වයයේ) සහාය පවතී. | | |
| | 3. ඇගයීම සිදුකිරීම සඳහා පවතින දේශපාලනික තත්වය බාධාකාරී නොවනු ඇත. | | |
| | 4. පාරිසරික (කාලගුණික) තත්වයන් ඇගයීම සිදුකිරීම සඳහා උචිත ය. | | |
| | 5. පවතින ආරක්ෂක තත්වය ක්ෂේත්‍ර ක්‍රියාකාරකම් සඳහා හිතකරය. | | |
| | 6. ප්‍රධාන පාර්ශවකරුවන්/ තොරතුරු ලබාදෙන්නන්/ ප්‍රතිලාභීන් ක්ෂේත්‍රයේදී හමුවිය හැකිය. | | |
| | 7. ඇගයීම සඳහා ප්‍රමාණවත් අයවැය ප්‍රතිපාදන හා අනෙකුත් සම්පත් වෙන්කර දී ඇත. | | |
| | **'ඔව් හෝ නැත' යන පිළිතුරුවල ප්‍රතිශතමය අගය (%)** | | |

- ඉහත සඳහන් සෑම අංගයකටම 50% ක් හෝ ඊට වැඩි 'ඔව්' අගයන් ලබාගෙන ඇත්නම්, එම ව්‍යාපෘතිය, වැඩසටහන, ප්‍රතිපත්තිය හෝ ආයතනය ඇගයීමට හැකියාව පවතින්නක්බව සැලකේ.

- අදාළ ව්‍යාපෘතිය, වැඩසටහන හෝ ප්‍රතිපත්තියෙහි වෙනස්කිරීමේ න්‍යාය ඇගයීම සිදුකරන අවස්ථාව වනවිට සපයාගත නොහැකිනම් හෝ සැලසුම් කරන අවස්ථාවේදී එය සකස්කර නොමැතිනම්, ඇගයීමෙහි පරමාර්ථ ඉටුකරගැනීම සඳහා අදාළ මූලික ලියවිලිවල ඇතුළත් තොරතුරු මත පදනම්ව වෙනස්කිරීමේ න්‍යාය සකස්කිරීම සඳහා තීරණය කළ හැකිය.

- ඉහත පිරික්සුම් ලැයිස්තුවෙහි ඇතුළත් සමහර අංග පෙර ඇගයුම් සඳහා අදාළ නොවිය හැකිය (උදාහරණ: පෙර ඇගයුම් සඳහා අවශ්‍ය ප්‍රධාන තොරතුරු සපයාගත නොහැකි විය හැකිය)؛ එවැනි අවස්ථාවල ලකුණු ලබාදීමේදී එම අංගයන් නොසලකා හැරිය යුතුය.

# ඇමුණුම - III: ප්‍රධාන ඇගයීම් විධි

| ඇගයීම් විධිය | පරමාර්ථය | අවස්ථාව | භාවිතය |
|---|---|---|---|
| පෙර ඇගයුම | ■ අනාගත මැදිහත්වීම් (ව්‍යාපෘති, වැඩසටහන්, ප්‍රතිපත්ති) සඳහා සුදුසු විකල්ප හා ප්‍රවේශයන් තෝරාගැනීමට හා සාධාරණීකරණයට අවශ්‍ය උපායමාර්ගික තොරතුරු ලබාගැනීම.<br>■ ආයෝජනයකින් උපයාගත හැකි උසස්ම ප්‍රතිලාභය ලබාගැනීමට වඩාත්ම සුදුසු විකල්පය හඳුනාගැනීම. | නව මැදිහත්වීමක සැලසුම් අවධියේදී හෝ පිරිසැකසුම් අවධියේදී | ■ ඉහළ ශක්‍යතාවයකින් යුත්, ක්‍රියාත්මක කළහැකි, තිරසාර මැදිහත්වීම් සැලසුම්කිරීම හා පිරිසැකසුම. |
| උද්භව (සැලසුමට පාදක වන) ඇගයීම | ■ සැලසුම් කරමින් පවතින සංවර්ධන මැදිහත්වීමක ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම. | ■ සංවර්ධන මැදිහත්වීම සකස්කිරීමේ ආරම්භක අවධියේදී<br>■ දැනට පවතින මැදිහත්වීමක් නව්‍යකරණයේදී | ■ සංවර්ධන මැදිහත්වීමෙහි විෂයපථය හෝ ක්‍රියාත්මකකිරීමේ ක්‍රමවේදය වෙනස්කිරීම හෝ වැඩිදියුණු කිරීම.<br>■ ව්‍යාපෘති, වැඩසටහන් සහ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරන අතරතුර නව්‍යකරණය. |
| මධ්‍යකාලීන/ ක්‍රියාකාරී අවධියේ සිදුකරන ඇගයීම | ■ ව්‍යාපෘතිය/ වැඩසටහන/ප්‍රතිපත්තිය එහි අරමුණු හා අභිප්‍රායයන් ලඟාකිරීමේ දිශානතියක් ඔස්සේ ක්‍රියාත්මක වනබව තහවුරු කරගැනීම.<br>■ මැදිහත්වීමට අදාළ වැඩසටහන් න්‍යායෙහි/වෙනස්කිරීමේ න්‍යායෙහි වලංගුභාවය පරීක්ෂාකිරීම. | මැදිහත්වීමක් ක්‍රියාත්මක කරන කාලය තුළ | ■ ක්‍රියාත්මක කිරීමේදී පැන නගින ගැටළු හඳුනාගැනීම හා ඒවාට පිළියම් යෙදීම.<br>■ ප්‍රතිඵල ජනනයේ කාර්යක්ෂමතාව හා ඒවායේ ඵලදායීතාව ඉහළනැංවීම සඳහා වැඩසටහන් න්‍යාය වඩාත් හොඳින් සකස් කිරීම හෝ වෙනස්කිරීම. |
| පසු ඇගයීම (ආන්තික ඇගයීම) | ඇරම්භක අවස්ථාවේ පැවති හා ක්‍රියාත්මක කිරීමෙන් අනතුරුව පවතින නිමැවුම් හා කෙටිකාලීන ප්‍රතිඵල සැසඳීම. | ක්‍රියාත්මක අවධිය අවසන් වූ වහාම | තිරසාර ප්‍රතිඵල ජනනය කිරීම සඳහා අනාගත මැදිහත්වීම් සැලසුම් කිරීමට හා ක්‍රියාත්මක කිරීමට උපකාරී වන පාඩම් උගෙනීම |
| ක්‍රියාවලි ඇගයීම | ■ මැදිහත්වීමක ක්‍රියාකාරකම් කෙතරම් දුරකට සැලසුම් කළ අයුරින්ම ක්‍රියාත්මක වූවාද යන්න නිර්ණයකිරීම.<br>■ ව්‍යාපෘතියක්/ වැඩසටහනක් ක්‍රියාවට නැංවීමේදී උපයෝගී වූ ක්‍රියාවලි හා ක්‍රියාපටිපාටිවල ඵලදායීතාවය අවබෝධ කරගැනීම. | මැදිහත්වීමක් ක්‍රියාත්මක කරන කාලය තුළ | ප්‍රතිඵල ජනනයේ කාර්යක්ෂමතාව හා ඵලදායීතාවය වැඩිදියුණුකිරීම සඳහා සුදුසු ක්‍රියාවලි හා ක්‍රියාපටිපාටි හඳුන්වාදීම හෝ ඒවා සීරුමාරුකිරීම හා නව්‍යකරණය (ඇගයීම් තුළින් මතුවන පූර්ව අනතුරු ඇඟවීම් පදනම් කරගනිමින්) |
| ප්‍රතිඵල ඇගයීම | යම් තත්වයක සහ ප්‍රතිලාභීන් / ඉලක්කගත ජනගහනය තුළින් අපේක්ෂිත හා අපේක්ෂා නොකළ හැසිරීම්, ආකල්ප හා භාවිතයන්හි සිදුවන වෙනස්කම් අවබෝධ කරගැනීම | මැදිහත්වීම ක්‍රියාත්මක කර අවසන් වූ පසු (අපේක්ෂිත චර්යාත්මක වෙනස්කම් මැනබැලීමට සුදුසු කාලය එළඹීමෙන් අනතුරුව) | තිරසාර හා නිශ්චිතව හඳුනාගතහැකි ප්‍රතිඵල මගින් අනාගත මැදිහත්වීම් සැලසුම්කිරීමට හා ක්‍රියාත්මකකිරීමට උපකාරීවන පාඩම් උගෙනීම |
| බලපෑම් ඇගයීම | සමස්තයක් ලෙස අදාළ මැදිහත්වීමෙහි අවසන් අරමුණු ලඟාකරගත් බව නිශ්චය කිරීම | මැදිහත්වීම ක්‍රියාත්මකකර අවසන් වූ පසු (ක්‍රියාත්මක කර අවසන් වූ පසු. පෙර නිර්ණය කරන ලද කාල පරතරයන් සහිතව; ප්‍රතිඵලවල ව්‍යාප්තිය තහවුරු කරගැනීටමන් අනතුරුව) | ප්‍රතිපත්තිමය හා සම්පත් බෙදාහැරීම පිළිබඳව තීරණගැනීම සඳහා (යම් මැදිහත්වීමක තහවුරු වූ සාර්ථකත්වය හෝ දුර්වලතා මත පදනම්ව) |
| ආයතනික ඇගයීම | ආයතනයක් මගින් සේවාවන් හා නිමැවුම් ජනනය කිරීමේදී ඒ සඳහා දැනට පවතින ආයතනික සැකැස්ම හා මෙහෙයුම් පද්ධති කෙතරම් දුරකට දායකවී ඇත්දැයි තක්සේරුකිරීම සඳහා | මෙහෙයුම් සිදුකරන කාලය තුළ (පෙර නිර්නය කරනලද කාල පරතර සහිතව) | ආයතනික සැකැස්ම හා මෙහෙයුම් පද්ධති වැඩිදුයුණුකිරීම හෝ ප්‍රතිව්‍යුහගතකිරීම සඳහා තීරණගැනීම. |

# ඇමුණුම - IV: ඇගයීම් ප්‍රවේශයන්

| ඇගයුම්කරු සහ ප්‍රවේශය | සාධාරණීකරණය | භාවිතයේ වාසි | අභියෝග |
|---|---|---|---|
| **1. ස්වාධීන (බාහිර) ඇගයීම** | | | |
| **සැලසුම්කරණය හෝ ක්‍රියාත්මකකිරීම සඳහා සම්බන්ධ නොවූ පුද්ගලයකු හෝ කණ්ඩායමක් විසින් ඇගයීම සිදුකරනු ලබයි. රජයේ ප්‍රසම්පාදන ක්‍රියාපටිපාටිය අනුගමනයකර ඇගයුම්කරු තෝරාගනු ලබයි;** විදේශීය අරමුදල් යොදා ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘතිවලදී එකග වූ ප්‍රසම්පාදන ක්‍රියාපටිපාටියක් අනුගමනය කරයි. | ▪ ඇගයීමට තෝරාගත් ව්‍යාපෘතිය, වැඩසටහන හෝ ආයතනය සතුව ඇගයීම සිදුකිරීමට අවශ්‍ය ප්‍රවීණතාව නොපැවතීම.<br>▪ වඩාත් විෂය මූලික වූ ඇගයීමක් සිදුකිරීමට ඇති අවශ්‍යතාව.<br>▪ ඇගයීමෙහි විෂයපථය පුළුල්වීම හා අංශ රැසක් ආවරනය කළයුතු වීම නිසා පුළුල් ක්ෂේත්‍ර ක්‍රියාකාරකම් සිදුකළ යුතු වීම. | ▪ අපක්ෂපාතී විෂය මූලික ඇගයීමක් වීම.<br>▪ අවශ්‍ය ප්‍රවීණතාවයන් ප්‍රශස්ත මට්ටමින් උපයෝගීකර ගැනීම.<br>▪ බාහිර ඇගයුම්කරුවකු මගින් විශාල තොරතුරු ප්‍රමාණයක් ලබාගැනීමට ඇති හැකියාව (ප්‍රතිලාභීන්ගේ නිර්ව්‍යාජ ප්‍රතිචාර ලබාගැනීමේ පහසුව) | ▪ අධික ගාස්තු අයකරන බාහිර ඇගයුම්කරුවන්ගේ සේවය ලබාගැනීම.<br>▪ සහයෝගීතාවය ගොඩනැංවීමේදී හා සන්න්වේදනයේදී මතුවන දුෂ්කරතා (ව්‍යපෘති කණ්ඩායම හෝ තුන්වන පාර්ශවයක මැදිහත්වීමකින් තොරව බාහිර ඇගයුම්කරු හා ප්‍රතිලාභීන් අතර සබඳතාවන් ගොඩනැංවීම දුෂ්කරය)<br>▪ ප්‍රතිලාභීන් විසින් ඇගයීමේදී අනාවරණය වන තොරතුරු පිළිගැනීමට / භාරගැනීමට දක්වන අඩු කැමැත්ත.<br>▪ ඇගයීම් ක්‍රියාවලිය මගින් කඩිනම් තීරණගැනීම සඳහා සහායක් නොදක්වයි (සාපේක්ෂව දිගු කාලයක් ගතවන ක්‍රියාවලියකි) |
| **2. ස්වයං (අභ්‍යන්තර) ඇගයීම)** | | | |
| **සැලසුම්කරණය හෝ ක්‍රියාත්මකකිරීම (හෝ එම කාර්යයන් 02 ම) සඳහා වගකීම දැරූ ආයතනය විසින් ඇගයීම සිදුකරනු ලබයි.** ආයතනය සතුව පවතින සම්පත් උපයෝගී කරගනී. ඇගයීමෙහි සාර්ථකත්වය තහවුරු කරගැනීම සඳහා ඇගයීම පිළබඳ ප්‍රවීණත්වය සහිත බාහිර පාර්ශවයන්ගේ සහාය ඇතිව ආයතනික ධාරිතාව වර්ධනයකිරීම හා දැනුවත්බව ඇති කිරීම අවශ්‍යවිය හැකිය. | ▪ ඇගයීමෙහි විෂයපථය එතරම් පුළුල් නොවන අතර, අංශ කිහිපයකට පමණක් සීමා වේ.<br>▪ ඇගයීම සම්පූර්ණකිරීම සඳහා ආයතනය සතු පැරණි තොරතුරු හා ධාරිතාව උපයෝගී කරගත හැකිය.<br>▪ බාහිර ඇගයුම්කරුවකු මගින් සිදුකරන ඇගයීමක් සඳහා මූල්‍ය පහසුකම් සැපයීමේ දී මතුවන සීමාකාරී තත්වයන්. | ▪ ඇගයීම් සිදුකිරීමට අවශ්‍ය ආයතනික ධාරිතාව වැඩිදියුණුවීම.<br>▪ අභ්‍යන්තර කාර්යමණ්ඩලයේ ඉහළ සහභාගීත්වය (ස්වේච්ඡාවෙන්)<br>▪ ඇගයීම වේගවත්ව නිමකිරීම මගින් කඩිනම් තීරණගැනීම සඳහා සහායවීම. | ▪ පක්ෂපාතී වීමට විභවයක් පවතින බැවින් ඇගයීමෙහි විෂය මූලික බව අඩුවීම. (ස්වීය දුර්වලතාවයන් නොසලකා හැරීමට දක්වන නැඹුරුව)<br>▪ ප්‍රවීනත්වයෙන් යුත් යෙදවුම් ප්‍රමාණවත් නොවීම (අභ්‍යන්තරික ඇගයීම් ධාර්තාව මත යැපීම).<br>▪ ප්‍රතිලාභීන්ගේ නිර්ව්‍යාජ ප්‍රතිචාර ලබාගැනීමේ අපහසුව<br>▪ (ප්‍රතිලාභීන් විසින් ඔවුන්ගේ ස්වාධීන අදහස් තුන්වන පාර්ශවයක් වෙත පළකිරීමට වැඩි කැමැත්තක් දැක්වීම) |
| **3. ඒකාබද්ධ ඇගයීම** | | | |
| **ආයතන එකකට වැඩි ගණනක් ඒකාබද්ධව ඇගයීම සිදුකරයි.** මෙම ප්‍රවේශයෙහි පොදු ලක්ෂණ වන්නේ සියලු පාර්ශවයන් මගින් අනාවරණය කරගත් කරුණු එක්කොට සවිස්තරාත්මක තනි ඇගයීම් වාර්තාවක් සකස්කිරීම සඳහා සම්පත් සහ වගකීම් ඒකාබද්ධකිරීම හා බෙදාගැනීමයි. (විදේශිය අරමුදල් උපයෝගී කරගනිමින් ක්‍රියාත්මකකරන ව්‍යාපෘති මෙම ප්‍රවේශ ඔස්සේ ඇගයීම සිදුකරන විට ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව හා විදේශ සම්පත් දෙපාර්තමේන්තුව කළමනාකරණ කණ්ඩායමෙහි සාමාජිකයින් විය යුතුය). | ▪ ඇගයීමෙහි විෂයපථය පුළුල් වන අතර, අංශ රැසකට පොදුවේ බලපාන ගැටළු හා තේමාවන් ආවරණය කරනු ලබයි.<br>▪ ඇගයීමෙහි පරමාර්ථය වන්නේ සංවේදී හෝ මතභේදාත්මක ක්ෂේත්‍රයක් හෝ ප්‍රතිපත්තියක් ආශ්‍රිත ගැටළුවකට පිළියම් සෙවීමය.<br>▪ පාර්ශව දෙකක් හෝ වැඩි සංඛ්‍යාවක් හවුල්වී අධ්‍යයනයක් සිදුකිරීම සඳහා සම්පත් ඒකාබද්ධ කිරීමට හා වගකීම් බෙදාගැනීමට කැමැත්ත පළකරයි.<br>▪ සහයෝගී මූල්‍යනය (Co-financing) සලසන මූල්‍ය සහකරුවන් විසින් නිමැවුම් හා ප්‍රතිඵලවල වගකීම බෙදාගැනීමේ එකඟතාව ඇතිව ක්‍රියාත්මක කරන ව්‍යාපෘතියක් හෝ වැඩසටහනකි. | ▪ සාමූහික ක්‍රියාකාරීත්වය තුළින් ඇගයීමෙහි විෂය මූලිකත්වය, පාරදෘශ්‍යභාවය හා නීත්‍යානුකූලබව උසස් තත්වයක පැවතීම.<br>▪ සම තත්වයේ පුද්ගලයන් තුළින් ඉගෙනීම හා අන්‍යෝන්‍ය වශයෙන් ධාරිතා වර්ධනය<br>▪ පිරිවැය දැරීමට සියලුදෙනා දායකවීම (වැයබර බෙදාගැනීම)<br>▪ පුද්ගලයින් හා ආයතන අතර සම්බන්ධීකරණය හා සම්බන්ධතා ජාලයක් ගොඩනැගීම<br>▪ ඇගයීම් සංඛ්‍යාව හා අතිපිහිතවීම් අඩුවීම හේතුවෙන් ඇගයීම් සඳහා වන සමස්ත පිරිවැය අඩුවීම.<br>▪ ඇගයීම් වලින් අනාවරණය කරනු ලබන තොරතුරු හා නිර්දේශ සඳහා ඉහළ හිමිකාරීත්වයක් හා විශ්වාසනීයත්වයක් ලැබීම. | ▪ සම්බන්ධීකරණය හා තීරණගැනීමේ ක්‍රියාවලියෙහි ඇති සංකීර්ණභාවය හේතුවෙන් අමතර පිරිවැයක් දැරීමට සිදුවීම (රැස්වීම්, සන්නිවේදන කටයුතු හා ගමනාගමනය සඳහා).<br>▪ ක්‍රියාවලියෙහි සංකීර්ණතාවය හේතුවෙන් දීර්ඝ කාලයක් ගතවීම.<br>• . |

| ඇගයුම්කරු සහ ප්‍රවේශය | සාධාරණීකරණය | භාවිතයේ වාසි | අභියෝග |
|---|---|---|---|
| **4. සහභාගීත්ව ඇගයීම** | | | |
| **ව්‍යාපෘතිය, වැඩසටහන හෝ ප්‍රතිපත්තියට අදාළ පාර්ශවකරුවන් හා ප්‍රතිලාභීන් (සහ පීඩාවටපත් පාර්ශවයන්) විසින් ඇගයීම සිදුකරයි.** සියලුම සහභාගීවන්නන් ඇගයීමෙහි සියළු අවධීන් වලදී ක්‍රියාකාරීව සහභාගීවන අතර මේ සඳහා වන පිරිවැය දරනු ලබන්නේ ක්‍රියාත්මක කරන ආයතනය හෝ මූල්‍ය පහසුකම් සලසන ආයතනය (විදේශීය මූල්‍යනය සහිත ව්‍යාපෘති සඳහා) විසිනි. සහභාගී වන්නන් අදාළ ව්‍යාපෘතියේ ප්‍රතිලාභීන්ද නොඑසේනම් පීඩාවට පත්වූවන්ද යන්න නොසලකා එම සියලුදෙනාගේ අදහස්, රුචිකත්වයන් හා තීරණවලට ගරුකරමින් ඇගයීම සිදුකිරීම සඳහා එම ක්‍රියාවලිය සකසා ගතයුතුය. | ■ ප්‍රතිලාභී ප්‍රජාව බලගැන්වීම සඳහා අවශ්‍ය කුශලතා එම ප්‍රජාව වෙත සම්ප්‍රේෂණය කිරීමේ උපයමාර්ගයක් වශයෙන් සහභාගීත්ව ඇගයීම සිදුකිරීම සඳහා සැලසුම් හා පිරිසැකසුම් අවධියේදීම එකඟතාවය හා කැපවීම ප්‍රකාශයට පත්කර ඇත.<br>■ ව්‍යාපෘතිය/වැඩසටහන ක්‍රියාත්මක කරන අවධියේදී ඒ පිළිබඳව සමහර ප්‍රතිලාභී කණ්ඩායම් අතර වැරදි වැටහීම් හා අසම්මුතීන් පැවති බව වාර්තාවීම.<br>■ ඇගයීමෙයි ප්‍රතිඵල ලබාගැනීම ඉතා හදිසි නොවේ (ඇගයීම සඳහා ගතවන කාලයට වඩා එහි ප්‍රතිඵලවල වලංගුභාවය වැදගත් වේ).<br>■ බාහිර කණ්ඩායමක් යොදාගනිමින් ඇගයීම සඳහා අත්‍යාවශ්‍ය තොරතුරු එක්රැස්කිරීම දුෂ්කරය. (තම ප්‍රජාවට අදාළ සත්‍ය තොරතුරු එක්රැස් කළ හැක්කේ එම ප්‍රජාව නියෝජනය කරන ප්‍රතිලාභීන්ට පමණි). | ■ ඇගයීම්වලින් අනාවරණය කරනු ලබන තොරතුරු හා නිර්දේශ සඳහා ඉහළ හිමිකාරීත්වයක් හා විශ්වාසනීයත්වයක් ලැබීම.<br>■ ප්‍රතිලාභීන් හා ක්‍රියාත්මක කරන ආයතන අතර විශ්වාසනීයත්වය හා ස්ථිර අවබෝධය ගොඩනැගීම.<br>■ ඇගයීම මගින් අනාවරණය කරන තොරතුරු නිර්මාණශීලීව වාර්තාකිරීමේ හැකියාව හා එම තොරතුරුවල විශ්වාසනීයත්වය වැඩිදියුණුවීම.<br>■ ප්‍රජා මට්ටමින් ඇගයීම් සංස්කෘතිය ප්‍රවර්ධනයවීම.<br>■ රටෙහි ධාරිතාව වර්ධනයවිම.<br>■ සහයෝගීතාව හා සම්බන්ධතා ජාල පුළුල් වී ශක්තිමත්වීම. | ■ වෙනත් ඇගයීම් විධිවලට වඩා මෙම ක්‍රියාවලිය සඳහා වැඩි කාලයක් අවශ්‍යවීම (සම්බන්ධීකරණය, සන්නිවේදනය, තීරණගැනීම හා ක්‍රියාත්මක කිරීම සඳහා).<br>■ ඇගයීමට සහභාගිවන්නන් අතර විශ්වාසය හා ඇගයීම් ධාරිතාවක් ස්ථාපනය කිරීම.<br>■ සහභාගිවන්නන් සියලුදෙනාම ප්‍රමාණවත්ව ඇගයීම සඳහා දායක වූ බව තහවුරු කිරීම. (හානිදායක අයුරින් පුද්ගලයින් හෝ කණ්ඩායම් එකිනෙකා අභිබවා යාමෙන් වැලකීම).<br>■ ඇගයීම් ක්‍රියාවලිය පුරාම කණ්ඩායම් හැඟීම හා අවශ්‍ය මට්ටමේ කැපවීමක් පවත්වාගැනීම.<br>■ ඇගයීමෙහි සාර්ථකත්වයට බාධා පමුණුවන අයුරින් සහභාගිවන්නන් අතර ඇතිවන අර්බුධ කළමනාකරණය. |

# ඇමුණුම - V: ඇගයීම සඳහා වූ OECD/ DAC උපමාන

| උපමානය | අර්ථ දැක්වීම | විශ්ලේෂණයට භාජනය කළයුතු විෂයපථය | පිළිතුරු ලැබිය යුතු ප්‍රධාන ප්‍රශ්ණ |
|---|---|---|---|
| අදාළත්වය | ඇගයීමට තෝරාගත් මැදිහත්වීමෙහි පරමාර්ථ හා පිරිසැකැස්ම ප්‍රතිලාභීන්ගේ මෙන්ම ගෝලීය, දේශීය හා ආයතනික අවශ්‍යතා සහ ප්‍රතිපත්ති හා ප්‍රමුඛතාවන්ට කෙතරම් දුරකට අනුකූලවේද යන්නත්, වාතාවරණයේ වෙනසක් සිදුවූ විටද එසේ අනුකූලවීමට ඇති හැකියාවත් ය. | ■ ඉලක්ක කණ්ඩායමෙහි අවශ්‍යතා සපුරාලීම සඳහා අදාළ මැදිහත්වීමෙහි පිරිසැකසුමෙහි අදාළත්වය<br>■ මැදිහත්වීමෙහි අරමුණු එය ක්‍රියාත්මක තත්වයේ පවතින කාලයට සහ අනාගත කාලයට දක්වන අදාළත්වය.<br>■ ජාතික හා ආංශික ප්‍රතිපත්තිවලට දක්වන අනුකූලතාව.<br>■ ව්‍යාපෘතියේ පිරිසැකැස්ම හා එහි වෙනස්කිරීමේ න්‍යාය අතර පවතින ගැලපීම. | ■ අදාළ මැදිහත්වීම මගින් ප්‍රතිලාභීන්ගේ අවශ්‍යතා, අපේක්ෂාවන් හා ප්‍රමුඛතාවයන් සපුරායිද/ සපුරා ඇත්ද?<br>■ අදාළ මැදිහත්වීම තවදුරටත් සාමාජීය, ආර්ථික හා පාර්සරික වශයෙන් කෙතරම් දුරකට අදාළවේද?<br>■ මැදිහත්වීමෙහි අරමුණු එය ක්‍රියාත්මක තත්වයේ පවත්නා කාලයට මෙන්ම ඉන් පසුවටද උචිතවේයැයි කෙතරම් දුරට තහවුරුවේද? |
| ගැළපීම | රටතුළ හා අදාළ ක්ෂේත්‍රය තුළද ඇගයීම සිදුකරන ආයතනය තුළද ක්‍රියාත්මකවන අනෙකුත් මැදිහත්වීම් සමග ඇගයීමට තෝරාගත් මැදිහත්වීම දක්වන අනුකූලතාවය | ■ අදාළ මැදිහත්වීමෙහි පිරිසැකැස්ම හා එය ක්‍රියාත්මකකිරීම කෙරෙහි බලපෑ සංදර්භ-මූලික සාධක (පවත්නා සංදර්භය නිසාම පැනනැගුන සුවිශේෂී සාධක).<br>■ ඇගයීමට තෝරාගත් මැදිහත්වීම සහ එම මැදිහත්වීමෙහි පරමාර්ථයටම සමාන පරමාර්ථ සහිතව එයට සමගාමීව ක්‍රියාත්මකවන වෙනත් මැදිහත්වීම් අතර පවතින සම්බන්ධතා. | ■ මෙම මැදිහත්වීම දේශීය (ජාතික) සංදර්භය හා කෙතරම් දුරට ගැලපේද? එකග වේද?<br>■ මෙම මැදිහත්වීම කළාපීය හා ගෝලීය සංදර්භය හා කෙතරම් දුරට ගැලපේද? එකග වේද?<br>■ මෙම මැදිහත්වීම, එහි පරමාර්ථයටම සමාන පරමාර්ථ සහිත වෙනත් මැදිහත්වීම් හා කෙතරම් දුරට ගැලපේද? එකග වේද? |
| ඵලදායිතාවය | ඇගයීමට තෝරාගත් මැදිහත්වීම මගින් එහි පරමාර්ථ ඉටුකරගත් ප්‍රමාණය හා ප්‍රතිඵල ලඟාකරගත් ප්‍රමාණය හෝ එවා ඉටුකරගැනීම /ලඟාකරගැනීම සඳහා දක්වන විභවතාවය | ■ මැදිහත්වීමෙහි පරමාර්ථ ඉටුකරගැනීම (හෝ ඉටුකරගැනීමේ හැකියාව (භව්‍යතාව).<br>■ ප්‍රධාන ප්‍රතිඵල (ඍණාත්මක, ධනාත්මක, අපේක්ෂිත, අනපේක්ෂිත).<br>■ එකිනෙකට වෙනස් පාර්ශවකාර කණ්ඩායම්වල හැසිරීමේ වෙනස්වීම් කෙරෙහි ප්‍රධාන නිමැවුම් මගින් සිදුකරන/ සිදුකළ බලපෑම<br>■ ප්‍රතිඵල අත්කර ගැනීම සඳහා සහාය වූ හැ බාධාකාරී වූ සාධක | ■ අදාළ මැදිහත්වීම මගින් අපේක්ෂිත කෙටිකාලීන/ මධ්‍යකාලීන හා දිගුකාලීන ප්‍රතිඵල කෙතරම් දුරට ලඟාකරගෙන ඇත්ද?<br>■ මැදිහත්වීමෙහි පරමාර්ථ ඉටුකරගැනීම සඳහා එහි නිමැවුම් හා ප්‍රතිඵල කෙතරම් දුරට දායකවී ඇත්ද?<br>■ මැදිහත්වීමෙහි ප්‍රමාණාත්මක හා ගුණාත්මක ප්‍රතිවිපාක මොනවාද? |

| උපමානය | අර්ථ දැක්වීම | විශ්ලේෂණයට භාජනය කළයුතු විෂයපථය | පිළිතුරු ලැබිය යුතු ප්‍රධාන ප්‍රශ්ණ |
|---|---|---|---|
| කාර්යක්ෂමතාවය | අදාළ මැදිහත්වීමෙහි ප්‍රතිඵල පිරිමැසුම්දායකව හා නියමිත කාලරාමුව තුළ ලබාදීම හෝ (අනාගතයේදී) ලබාදීමේ හැකියාව | ■ නිමැවුම් ඒකකයක් සඳහා පිරිවැය<br>■ එකඟ වූ කාලරාමුව තුළ ප්‍රතිඵල ලබාදීම සිදුවන/ සිදුනොවන බව.<br>■ ප්‍රතිඵල ලබාදීම සඳහා යොදාගත් විවිධ ක්‍රම, පද්ධති හා ආයතනික සැකසුම් සන්සන්දනය කිරීම. | ■ නිමැවුම් හා ප්‍රතිඵල මගින් මුදලෙහි අගය (Value for money) පිළිබිඹු වේද?<br>■ මැදිහත්වීම ආශ්‍රිත පිරිවැය හා එමගින් ජනනය කරන ලද ප්‍රතිලාභවල වටිනාකම කෙතරම් දුරට සමානුපාතික වේද?<br>■ මෙම මැදිහත්වීමෙහි කාර්යක්ෂමතාවය කෙරෙහි බලපෑ හැකි සාධක මොනවාද? මෙම සාධක අදාළ මැදිහත්වීමෙහි කාර්යක්ෂමතාව කෙරෙහි කෙතරම් දුරට බලපෑම් ඇති කරයිද?<br>■ විවිධ භූගෝලීය පිහිටීම්, ඉලක්ක කණ්ඩායම් හෝ කාලපරාසයන් ආශ්‍රිතව ක්‍රියාත්මක කරනවිට පිරිවැයෙහි (හෝ ප්‍රතිලාභවල) සැලකිය යුතු වෙනස්කම් පවතීනම්, මෙම වෙනස්කම් සඳහා හේතු කවරේද? මෙම වෙනස්කම් මෙම මැදිහත්වීමෙහි කාර්යක්ෂමතාව හා කෙසේ බැඳී පවතීද?<br>■ කාලීනව සිදුකළයුතු අධීක්ෂණය හා වාර්තාකරණය කෙතරම් දුරට සිදුකර ඇත්ද? |
| බලපෑම | අදාළ මැදිහත්වීම මගින් ජනනයකළ හෝ ජනනය කරනු ඇතැයි අපේක්ෂිත, ඉහල මට්ටමේ සුවිශේෂ ධනාත්මක, ඍණාත්මක, අපේක්ෂිත හෝ අනපේක්ෂිත ප්‍රතිවිපාක | ■ අදාළ මැදිහත්වීමෙහි ධනාත්මක හා ඍණාත්මක, ඍජු හා වක්‍ර දිගුකාලීන ප්‍රතිවිපාක<br>■ පුළුල් බලපෑම් ඇතිකරන අපේක්ෂිත හෝ අනපේක්ෂිත ප්‍රතිවිපාක<br>■ පුළුල් බලපෑම් ඇතිකරන ප්‍රතිවිපාක විවිධ ක්ෂේත්‍රයන් (සමාජීය, පාරිසරික, ආර්ථික, දේශපාලනික හා සංස්කෘතික ආදී) කෙරෙහි පොදුවේ ඇති ඥකරන බලපෑම | ■ ඇගයීම මගින් ප්‍රතිලාභීන්ගේ ජීවන තත්වය මත ඇතිකරන ලද බලපෑම් කවරේද?<br>■ මැදිහත්වීමෙහි එක් සුවිශේෂී අංගයක් මගින් එහි අනෙකුත් අංගවලට වඩා ඉහළ බලපෑමක් සිදුකර ඇත්ද?<br>■ ප්‍රතිලාභීන් හෝ ප්‍රතිලාභීන් නොවන පිරිස් කෙරෙහි අපේක්ෂිත හෝ අනපේක්ෂිත ප්‍රතිවිපාක ඇතිකර තිබේද? |
| තිරසාරත්වය | මැදිහත්වීමෙහි ශුද්ධ ප්‍රතිලාභවල අඛණ්ඩතාවය හෝ ප්‍රතිලාභ අඛණ්ඩව පවත්වාගැනීමට ඇති හැකියාව | ■ මැදිහත්වීම මගින් ඇතිකරන ලද වෙනස්කම් වල අඛණ්ඩභාවය<br>■ ස්ථාපනය කරන ලද පද්ධති,ක්‍රියාවලි හා ආයතන සහ ප්‍රතිලාභීන් තුළ ඒවා කෙරෙහි වූ පිළිගැනීම<br>■ අදාළ මැදිහත්වීමෙහි අංග ජාතික මට්ටමේ පද්ධති හා ක්‍රියාවලි තුළට ඒකාබද්ධ කිරීම | ■ මැදිහත්වීම මගින් හඳුන්වාදුන් පද්ධති, ක්‍රියාපටිපාටි, ක්‍රියාවලි, ආයතන හා භාවිතයන් එම මැදිහත්වීම නිමකරන අවස්ථාවේදී පැවති මට්ටමින් හෝ වැඩිදියුණු කර පවත්වාගෙන යනු ලබයිද?<br>■ මැදිහත්වීමෙහි ක්‍රියාත්මක කිරීමේ විධිවිධාන මගින් එහි තිරසාරත්වය කෙරෙහි අවධානය යොමුකර ඇත්ද?<br>■ මැදිහත්වීමෙහි සමහර අංගවල (හෝ සමස්ත මැදිහත්වීමෙහි) තිරසාරත්වය අඩුවීමට හේතු වූ සාධක කවරේද? |

# ඇමුණුම - VI: පාර්ශවකරුවන් විශ්ලේෂණය සඳහා මෙවලම

| පාර්ශවකරුවාගේ නම (පුද්ගලයා හෝ ආයතනය) | කාණ්ඩය (උදා: ප්‍රතිලාභී, මූල්‍ය ප්‍රදාන ආයතන...) | පාර්ශවකරුවාගේ සහභාගීත්වය තුළින් ඇගයීම සඳහා අපේක්ෂිත ප්‍රතිලාභ | ඇගයීමේ ක්‍රියාවලිය තුළ හිමි කාර්යය (තොරතුරු සැපයීම, නිර්දේශක කණ්ඩායම, කළමනාකරණ කණ්ඩායම ආදී වශයෙන්) | සහභාගී වියයුතු ඇගයීමේ අවධිය  (සැලසුම් කිරීම, සූදානම් වීම, දත්ත රැස්කිරීම, වාර්තාකිරීම ආදී වශයෙන්) |
|---|---|---|---|---|
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |

# ඇමුණුම - VII: කළමනාකරණ කණ්ඩායමෙහි ඇගයීමේ යොමුකිරීමේ අනුදේශ (ToR) සකස්කිරීම සඳහා ආදර්ශය

1. **ඇගයීමෙහි නම:**
   ........................................................................................................................................................................
   ........................................................................................................................................................................

2. **ඇගයීම සඳහා තෝරාගත් මැදිහත්වීමෙහි පසුබිම** [නම, සමස්ත පිරිවැය, ක්‍රියාත්මකකිරීමේ කාලසීමාව, ක්‍රියාත්මක කිරීමේ අවස්ථාව, ප්‍රධාන සංරචක, ප්‍රධාන නිමැවුම්, අපේක්ෂිත ප්‍රතිඵල, අරමුණ, ආවරණ සීමාව (භූගෝලීය සීමාව හා ප්‍රතිලාභින් සංඛ්‍යාව) ආදී වශයෙන්)]
   ........................................................................................................................................................................
   ........................................................................................................................................................................

3. **ඇගයීමෙහි පරමාර්ථය හා අරමුණු:**
   ........................................................................................................................................................................
   ........................................................................................................................................................................

4. **කළමනාකරණ කණ්ඩායමෙහි පරමාර්ථය:** [සුපරීක්ෂාව, තීරණ ගැනීම, ගුණාත්මකභාවය තහවුරු කිරීම ආදී වශයෙන්]
   ........................................................................................................................................................................
   ........................................................................................................................................................................

5. **කළමනාකරණ කණ්ඩායමෙහි සාමාජිකයින්:**
   ........................................................................................................................................................................
   ........................................................................................................................................................................

6. **කළමනාකරණ කණ්ඩායමෙහි වගකීම්:**
   ........................................................................................................................................................................
   ........................................................................................................................................................................

7. **කළමනාකරණ කණ්ඩායමෙහි රැස්වීම්** [කාලාන්තරය, ස්ථානය, ක්‍රමවේදය, සන්නිවේදන ක්‍රමවේදය, ආදී වශයෙන්]:
   ........................................................................................................................................................................
   ........................................................................................................................................................................

## ඇමුණුම - VIII: ඇගයීම් නිර්දේශක කණ්ඩායමෙහි ඇගයීමේ යොමුකිරීමේ අනුදේශ (ToR) සකස්කිරීම සඳහා ආදර්ශය

1. **ඇගයීමෙහි නම:**
..................................................................................................................................................................................
..................................................................................................................................................................................

2. **ඇගයීම සඳහා තෝරාගත් මැදිහත්වීමෙහි පසුබිම:** [නම, සමස්ත පිරිවැය, ක්‍රියාත්මකකිරීමේ කාලසීමාව, ක්‍රියාත්මක කිරීමේ අවස්ථාව, ප්‍රධාන සංරචක, ප්‍රධාන නිමැවුම්, අපේක්ෂිත ප්‍රතිඵල, අරමුණ, ආවරණ සීමාව (භූගෝලීය සීමාව හා ප්‍රතිලාභීන් සංඛ්‍යාව) ආදී වශයෙන්]
..................................................................................................................................................................................
..................................................................................................................................................................................

3. **ඇගයීමෙහි පරමාර්ථය හා අරමුණු:**
..................................................................................................................................................................................
..................................................................................................................................................................................

